# ඉස්ලාමය හා අදේවවාද

## මුහුණට මුහුණ

### ප්රශ්ණ හා පිළිතුරු

හයිතම් තලාත්

دار الإسلام جمعية الربوة رواد الترجمة

- قامت جمعية الدعوة والإرشاد بالربوة بمراجعة وتصميم هذا الإصدار.
- تتيح الجمعية طباعة الإصدار ونشره بأي وسيلة مع الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص.
- في حالة الطباعة يجب الالتزام بمعايير الجودة التي اعتمدتها الجمعية.


Telephone: +966114454900

Fax: +966114970126

P.O.BOX: 29465

RIYADH: 11557

ceo@rabwah.sa

www.islamhouse.com

අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි. සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ශාන්තිය හා සමාදානය අල්ලාහ්ගේ දූතයාණන්හටත් එතුමාණන්ගේ පවුලේ සාමාජිකයින්, එතුමාණන්ගේ මිතුරන් හා එතුමාණන්ට උපකාර කළවුන්හටත් හිමි වේවා!

මෙය "අදේවවාදයෙන් ඉස්ලාමය වෙත" යන මැයෙන් වූ කුඩා පොත් පිංචයකි.

මෙම කුඩා පොත් පිංචය "අදේව වාදයේ ස්වභාවය" ගැන මෙන්ම එහි ඇති ගැටළු පිළිබඳ ඉදිරිපත් කරන අතරම සහජ විශ්වාසය හා බුද්ධිය සමඟ බැඳුණු සිද්ධාන්ත ඉදිරියේ අදේව වාදය නිශ්ක්‍රීය වන්නේ කෙසේදැ?යි යන්න ද ඉදිරිපත් කරයි.

තවද ශුද්ධ මැවුම්කරුගේ පැවැත්ම තහවුරු කරන ඇතැම් සාධක මෙම කුඩා පොත් පිංචය ගෙන හැර පායි.

කීතරීමත් සවර්බලධාරී අල්ලාහ් පිළිබඳව බුද්ධිමය වශයෙන් අපි හඳුනා ගනිමු. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "කිසිවක් නොමැතිව ඔවුහු මවනු ලැබුවෝ ද? එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?" (සූරා අත්-තූර් - 52:35)

බුද්ධිමය වශයෙන් සලකා බැලීමේදී සම්භාවිතාවන් තුනක් පවතී. එයට සිව් වැනි සම්භාවිතාවක් නැත:

- **පළමුවැන්න:** මැවුම්කරුවකුගෙන් තොරව අප මවනු ලැබීම (කිසිවක් නොමැතිව ඔවුහු මවනු ලැබුවෝ ද) එය විය නොහැක්කකි. මන්ද, මැවුම්කරුවකු නොමැතිව අප මවනු ලබන්නේ කෙසේද?
- **දෙවැන්න:** අප විසින්ම අපව මවා ගැනීමයි. (එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?) මෙයද සිදුවිය නොහැකි කරුණකි. මන්ද, මා මවනු ලබන්නට පෙර මා විසින් මා මැවිය හැක්කේ කෙසේද?

**එහෙයින්, බුද්ධිමය වශයෙන් තුන් වැනි සම්භාවිතාව ඉතිරිව පවතී.** මෙම ශුද්ධ වූ වැකිය ඒ ගැන නිහඬය. එය ප්‍රත්‍යක්ෂයයි. එනම්, සැබැවින්ම අප මැවූ මැවුම් කරුවකු සිටින වගයි.

කීතරීමත් සවර්බලධාරී අල්ලාහ් පිළිබඳව බුද්ධිය මගින් අපි හඳුනා ගනිමු.

එමෙන්ම සහජ ධමර්තාව තුළින් අපි අල්ලාහ්ව හඳුනා ගනිමු.

විශ්වය මැවීමට හෝ බැක්ටීරියා හා මිනිසා නිමර්ාණය කිරීමට හෝ පවතින ස්වරූපයෙන් මිනිස් ශරීරයේ ක්රියාකාරිත්වය සකස් කිරීමට හෝ පරමාණුවේ සිට මන්දාකිණිය දක්වා මැවීම් නිමර්ාණය කිරීමට හෝ පිළිම හා ස්වභාව ධමර්යාට කිසිදු බලයක් නොමැති බව අපගේ සහජ ධමර්තාව තුළින් අපි වටහා ගනිමු.

දේවත්වය ප්රතික්ෂේප කරන්නන් නමදින පිළිම හා අදේව වාදියා විශ්වාස කරන ස්වභාව ධමර්ය යන දෙකම එහි මැවුම්කරුගේ අවශ්යතාව අපේක්ෂා කරති.

එම පිළිම වලට හෝ ස්වභාව ධමර්යාට හෝ කිසිවක් සතු නොවන්නේය. තමන් තුළ ඇති හෝමෝන මෙතරම් විශ්මයජනක ලෙස නියාමනය කිරීමට ඒවාට නොහැක. සෑම සජීවී සෛලයකටම මිලියන ගණනක තොරතුරු ඇතුළත් ජාන කේතය දැමීමට ඒවාට බලයක් නැත. එමෙන්ම කිසියම් දෙයක් ඇති කිරීමට හෝ ඒවා විසින් තමන් බිහි කිරීමට පවා ඒවාට බලයක් නැත.

මේ ආශ්චයර්යන් සහිත මේ ලෝකයේ නිමර්ාතෘ මහා මැවුම්කරු, සවර්ඥානී, සවර්බලධාරී, සවර් ප්රඥාවන්ත සුවිශුද්ධයාණන්ය.

අදේවවාදීන්ගේ සැකයන් සහ මැවුම්කරුගේ තාකරීක සහ සහජ පැවැත්ම පිළිබඳ සාක්ෂි බොරු කිරීමට ඔවුන් දරන උත්සාහයන්, මෙම පොත් පිංචය තව දුරටත් සාකච්ඡා කරයි.

ඔවුන්ගේ වඩාත් ප්රසිද්ධ ව්යාජ තකර්යක් නම් "විශ්වයේ මතුවීමේ අහඹු සිදුවීමකි" යැයි පැවසීමයි. මෙයට හේතුව ඔවුන් විභවයන්ගේ මූලාරම්භය තේරුම් නොගැනීම හෝ නොසලකා හැරීමයි. මක්නිසාද යත් අහම්බෙන් සිදුවීම යන්නට වෙන් කළ නොහැකි කොන්දේසි දෙකක් පවතින බැවිනි.

ඒවා නම්: කාලය හා ස්ථානයයි.

අහඹු සිදුවීමකට, එහි බලපෑම් ඇති කරන සිද්ධිදාමයන් ක්රියාත්මක වන කාලයක් අවශ්ය වේ.

එමෙන්ම එහි බලපෑම ඇති කිරීම සඳහා ස්ථානීය වශයෙන් භෞතික පැවැත්මක් අවශ්‍ය වේ.

කාලය හා ස්ථානය නොමැති ශූන්‍යයෙන් අපගේ විශ්වය පැමිණි හේතුවෙන්, විශ්වය නිමර්ාණය කිරීමේදී අහම්බයට භූමිකාවක් ඇතැයි කියන්නේ කෙසේද? එනිසා "අහම්බෙන් සිදුවවක්" යන සංකල්පය ද අවලංගු වේ.

අනතුරුව මෙම පොත් පිංචය, ආගමේ පැවැත්මේ අවශ්‍යතාවය, ආගමේ අරුත සහ සවර්ලෝකයන්හි පරමාධිපතිට යටත් වී උන්වහන්සේට කීකරු වීමේ අවශ්‍යතාවය පිළිබඳ තාකරීක සාක්ෂි කිහිපයක් ඉදිරිපත් කරයි. දෙවිඳුන් අල්ලාහ්ට යටත් වීම සහ කීකරු වීම එයයි ආගමේ යථාථර්ය වනුයේ.

ඔබ අල්ලාහ්ට යටත් පහත් වන්න. ඔබේ මැවුම්කරු, සැපයුම්කරු, සියලු ආශීවර්ාද, අනුග්රහය සහ මඟ පෙන්වීම් ලබා දෙන්නාට නැමදුම් කරන්න.

නමස්කාර කිරීම අල්ලාහ් තම ගැත්තන් මත නියම කර ඇති වගකීමකි. සැබැවින්ම සුවිශුද්ධයාණන් වන ඔහු අප මවා, ජීවය ලබා දී, පෝෂණය කොට, අපට මඟ පෙන්වා, අප අතරින් කවරෙකු වඩාත් දැහැමිව කටයුතු කරන්නේ දැයි අප පරීක්ෂා කරනු පිණිස, අප වෙත ඔහුගේ දූතවරන් ඔහු එවවේය. එහෙයින් ඔහුට නැමදුම් කිරීම, අප වෙත පැවරුණු අල්ලාහ් වෙනුවෙන් කළ යුතු වගකීම වන්නේය. "ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. නුඹලා අතරින් කවරෙකු ක්රියාවෙන් වඩාත් දැහැමි දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය. තවද ඔහු සවර් බලධාරීය. අතික්ෂමාශීලීය." 67:2 සූරා අල් මුල්ක්

අනතුරුව මෙම පොත් පිංචය ඊළඟ අදියරයේදී ඉස්ලාමයේ නිරවද්‍යතාව පිළිබඳව හා එය හැර වෙනත් දහමක් අල්ලාහ් විසින් පිළිගන්නේ නැතැයි යන යථාථර්ය පැහැදිලි කරන ඇතැම් සාධක ඉදිරිපත් කරයි. "කවරෙකු ඉස්ලාමය හැර වෙනත් දහමක් සොයන්නේ ද, එවිට ඔහුගෙන් කිසිවක් පිළිගනු නොලබන්නේ ම ය. තවද ඔහු මතු ලොවෙහි අලාභ වන්තයින් අතරින් කෙනෙකි." 3:85 සූරා ආලු ඉම්රාන්

සියලුම නබිවරුන්ට හා දහම් දූතවරුන් සමඟ අල්ලාහ් එවූ ධමර්ය ඉස්ලාමයයි.

ඉස්ලාමයේ ප්‍රධාන ලක්ෂණ: එහි අල්ලාහ්ට යටහත් පහත් වීම හා ඔහුට පමණක් නැමදුම් කිරීම ඇතුළත් වේ.

එමෙන්ම ඉස්ලාමය යනු අල්ලාහ්ට යටත්වීම දිරි ගන්වන පූර්ණ ආගමික පිළිවෙතකි.

එය අල්ලාහ්ව ඒකීයකරණය කිරීම සඳහා ඇරයුම් කරන එකම දහමයි. තව්හීද් නොහොත් මෙම ඒකදේව වාදය සියලුම නබිවරුන් හට පැමිණි ප්‍රතිපත්තියයි.

නබිවරුන්ගේ පිළිවෙත් වෙනස් වුව ද ඔවුන් සියලු දෙනාම ඒකදේවවාදය මත පදනම්ව කටයුතු කළෝය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "(නබිවරය!)නියත වශයෙන්ම මා හැර වෙනත් දෙවියකු නොමැත. එහෙයින් නුඹලා මටම වන්දනාමානය කරනු' යැයි ඔහු වෙත දේව පණිවිඩ දන්වා සිටීමෙන් මිස නුඹට පෙර කිසිදු ධර්ම දූතයකු අපි නොඑව්වෙමු." 21:25 සූරා අල්-අන්බියා.

ඉස්ලාම් දහම හැර ඒකදේව වාදය මත පදනම් වූ වෙනත් දහමක් මෙම මිහිකත මත ඉතිරිව නැත. වෙනත් පිළිවෙත් හා බැඳුණු සෑම අයකුම අඩුවෙන් හෝ වැඩියෙන් හෝ වේවා, ෂිකර් හෙවත් දේවත්වයට ආදේශය කරන තත්ත්වයක සිටී. ඒක දේව විශ්වාසය දේශනා කළ නබිවරුන් මිය ගිය පසු ව, එම ජනයා ඒක දේවවාදය අත හැර, මිය ගිය තම නබිවරයාට නැමදුම් කිරීමෙන්, කාලයත් සමගම බහු දෙවිවරුන් නමදිමින් බහු දේවවාදය පිළිපදින්නට ගත්හ. නබි වරුන් දේශනා කළ නිමර්ල ඒකදේවත්වය අද ඉස්ලාම්හි හැර අන් කිසිදු දහමක ඉතිරි ව නැත.

අවසානයේ මිනිසෙක් මුස්ලිම්වරයකු බවට පත් වන්නේ කෙසේද යන්නත් ඉස්ලාමයේ අථර්ය විවරණය හා එහි අවශ්‍යතාවය පැහැදිලි කරමින් මෙම පොත් පිංචය අවසන් වේ.

සෑම මිනිසෙකුගේම මනස තුළ දෝලනය වෙමින් පවතින සියලුම ප්‍රශ්ණවලට ඉස්ලාමය පිළිතුරු සපයයි: අප පැමිණියේ කොතැනින්ද? මෙම විශ්වයේ අපි සිටින්නේ ඇයි? අප යන්නේ කොයිබටද?

ශුද්ධ වූ අල් කුආර්නයේ එක් පාඨයක මේ සෑම එකක් පිළිබඳ ඉස්ලාමය පිළිතුරු දී ඇත. අපගේ ශුද්ධ වූ පරමාධිපතියාණන් මෙසේ පවසයි: "මා මැවූ

ඔහුට මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද? තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය." (36:22) සූරා යාසීන්.

ඔබ කොතැනක සිට පැමිණියෙහි ද? අල්ලාහ් මා මැව්වේය. (ඔහු මා බිහි කළේය.)

මා යන්නේ කොයිබටද? මා කළ ක්රියාවන් සඳහා විනිශ්චය කරනු ලබන පිණිස මතුවට මම අල්ලාහ් වෙත යමි. "තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය."

මෙලොවට මම පැමිණියේ කුමක් නිසාවෙන් ද? දෙවිඳාණන්ට නැමදුම් කිරීම පිණිසත්, මා පරීක්ෂණයට භාජනය වනු පිණිසත්ය.

මා අල්ලාහ්ට නැමදුම් කළ යුත්තේ ඇයි? මා මැවූ අල්ලාහ්ට මා නැමදීම සහජයෙන් සිදුවන්නකි. මෙම සහජ බැඳීම ගැත්තා අතර හා ඔහුගේ පරමාධිපති අතර පවතින්නකි. එනම් ගැත්තා ඔහුගේ පරමාධිපතියාණන් ඔහුගේ මැවුම්කරුවාණන් නැමදීමය. "මා මැවූ ඔහුට මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද? "

මිනිසා ප්රහේලිකාවක් බවට පත් කරගෙන ඇති මෙම අතිවැදගත් ප්රශ්ණ තුනට පිළිතුරු එකට ගොනු කර එකම පාඨයකින් ඉදිරිපත් කර ඇත. "මා මැවූ ඔහුට මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද? තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය." 36:22 සූරා යාසීන්.

ඉස්ලාමය යනු අල්ලාහ් ලොවට නීතිගත කළ පිළිවෙතයි.

ඉස්ලාමය යන්නෙන් අඟදස් කරන්නේ, ගැත්තා තම ආත්මය අල්ලාහ් වෙනුවෙන් යටත් කිරීම, අල්ලාහ් වෙනුවෙන් පහත් වීම, අවනත වීම තුළින් අල්ලාහ්ට කීකරු වීම, තම මැවුම්කරුවාණන් හා භාරකරුවාණන් වූ ඔහුට එකඟ වීමය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කරයි: "තවද කවරෙකු දැහැමියකු ව සිට තම මුහුණ අල්ලාහ් වෙතට යටහත් කරන්නේ ද එවිට සැබැවින්ම ඔහු බලවත් බැඳියාවක් තදින් ග්රහණය කර ගත්තේය. තවද සියලු කරුණු වල අවසානය අල්ලාහ් වෙතය." 31:22 සූරා ලුක්මාන්

ඉස්ලාම් යන්නෙන් අදහස් කරන්නේ, ඔබේ ජීවිතයේ සෑම කුඩා හා විශාල දෙයකදීම දෙවිඳාණන් අල්ලාහ්ට යටහත්පහත්භාවය පෙන්වීමයි. සවර්බලධාරි අල්ලාහ් මෙසේ පවසයි: "සැබැවින්ම මාගේ සලාතය, මාගේ

පුද පූජා ක්රියාවන්,මාගේ ජීවය සහ මාගේ මරණය ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් වෙනුවෙනි." 6:162 "ඔහුට සමාන කිසිවකු නොමැත. තවද මේ ලෙසය මම නියෝග කරනු ලද්දෙමි. තවද මම මුස්ලිම්වරුන්ගෙන් පළමු වැන්නා වෙමි." 6:163 සූරා අල්-අන්ආම්

මාගේ සලාතය, මාගේ නැමදුම, මාගේ ජීවය, මාගේ මරණය ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් වෙනුවෙනි: එනම් සෑම කටයුත්තක්ම මම අල්ලාහ් වෙනුවෙන් සිදු කරමි. අල්ලාහ් වෙනුවෙන් නැමදුම් ඉටු කරමි. අල්ලාහ් වෙනුවෙන් මාගේ දෙමව්පියන්ට කීකරු වෙමි. අල්ලාහ් වෙනුවෙන් මිනිසාට වඩාත් ප්රයෝජනවත් වන අයුරින් හදාරමි, මෙනෙහි කරමි. අල්ලාහ් කවර කරුණක් මට අණ කර ඇත්තේ ද එය ක්රියාත්මක කිරීමෙහි හෙට දින වඩාත් බලවත් අයකු වන පරිදි මම නින්දට යමි.

එය සෑම කටයුත්තකදීම අල්ලාහ්ට කෙරෙන ගැතිභාවයයි. මෙය අල්ලාහ්ට අවනත වීමේ සළකුණු හා සංඛේත අතරින් වඩාත් වැදගත්ම කරුණ වේ.

දැනුමේ සාගින්න... අප අවධානයට අදාල වන වැදගත්ම කරුණ දැන ගැනීමේ සාගින්න, එය ඉස්ලාමයෙන් මිස නිවෙන්නේ නැත.

සැබැවින්ම තමන් ඉපදුණේ මිය යන්නට පමණක් බව දන්නා මිනිසා අදේවවාදය සපයන දැනුමෙන් සෑහිමට පත් වන්නේ නැත.

මෙම පොත් පිංචය අදේවවාදයේ ගැටළු වල විද්යාත්මක හා මානසික කොටස් සඳහා උදාහරණ ඉදිරිපත් කරයි. එමෙන්ම ඉස්ලාමයේ වලංගු භාවය පිළිබඳවද සමහර සාක්ෂි ඉදිරිපත් කරයි.

එවා ප්රශ්ණ හා පිළිතුරු යන ක්රමයෙන් මෙහි දැක්වේ.

දෙවිඳාණන් අල්ලාහ්ගේ ආශිවර්ාදයෙන් අපි දැන් එය ආරම්භ කරමු.

## 1- අදේවවාදය යන්නෙහි තේරුම කුමක් ද?

**පිළිතුර:** අදේවවාදය යනු: කිසියම් අදෘශ්‍යමාන බලයක් කෙරෙහි විශ්වාසය ප්‍රතික්ෂේප කිරීමයි.

අදේව වාදියා මැවුම්කරුවෙක් සිටිනා බව, දූතතත්වය (දිවැසිවරු) හා (මරණයෙන් පසුව) යළි නැගිටුවනු ලැබීම ප්‍රතික්ෂේප කරයි.

## 2- අදේවවාදයට ඔබ චෝදනා කරන කරුණු මොනවාද?

**පිළිතුර:** අදේවවාදයට ආගමික විශ්වාසයට වඩා ඉහළ විශ්වාසයක් අවශ්‍ය වේ.

නමුත් එය අපගේම ඇසින්, බුද්ධිමය ප්‍රමුඛතා සහ නෛතික සාක්ෂි මගින් අපි නිරීක්ෂණය කරන සහජ සහ නිශ්චිත ප්‍රත්‍යක්ෂ මත පදනම් වූ ආගමික විශ්වාසයට ප්‍රතිවිරුද්ධව, මිත්‍යා උපකල්පන සහ ව්‍යාජ පරිකල්පන (fantasy) මත පදනම් වූ විශ්වාසයකි.

**ඒ අනුව, ඔබ අදේවවාදියෙකු වන තරමට පහත සඳහන් කරුණු සිතන්නට ඉඩ පාදයි.**

**(අ)** නැති දෙයක් නැති දෙයකට සම්මිශ්‍රණයවී, එය ආශ්වයර්මත්, අති විශිෂ්ට විශ්වයක් බවට පත් වීම. එය ඉතාමත් නිවැරදි ක්‍රමාංකනය සහ තීරනාත්මක සීමාවන් සමඟ විය හැකි පරිදි විශ්මය ජනක වී ඇත.

**(ආ)** අහම්බෙන් සිදුවූ තීරණාත්මක සීමාවන් සහ භෞතික නියතයන් තුළින් විශ්වය බිහිවීම. අහම්බයේ කොන්දේසි දෙක අවකාශය සහ කාලය වන අතර විශ්වය බිහි වී ඇත්තේ ද අවකාශය හා කාලය තුළිනි. එබැවින් එය අහම්බයකින් සිදු වූවක් නොවේ.

**(ඇ)** අහඹු භාවය සහ පෘථිවියේ පළමු පරිසර පද්ධතිය ජීවය ඇති කර බැක්ටීරියා සහ මිනිසුන් නිමර්ාණය කර ඇත. මිනිස් බුද්ධිය දැන් එහි ශක්තියේ උච්චතම ස්ථානයේ පවතින අතර එයට සරල ජීව ස්වරූපයන් පවා නිපදවිය නොහැක.

**(ඇ)** අපි නිවැරදි යැයි පිළිගන්නා සියලුම සදාචාරාත්මක සාරධමර් බොහොමයක්, භෞතිකවාදයට සම්පූණර්යෙන්ම විරුද්ධ දිශාවට ගමන් කරයි. මූලික සදාචාරයන් භෞතික වශයෙන් බරක් සහ ලෞකික යහපත මට්ටමින් අලාභයක් පෙන්නුම් කරයි. ඒවා භෞතිකත්වයේ සහ ඒවායෙහි විපාකයේ වේ. අදේවවාදය තුළ ඔබේ ආරම්භය පිහිටන පිණිස මෙවැනි බුද්ධියට නොගැලපෙන දෑ විශ්වාස කිරීමට ඔබට සිදුවනු ඇත.

**(ඉ)** අදේවවාදය තුළ පෘථිවියේ සියලුම මිනිසුන් විනාශ කිරීම වළක්වන බුද්ධිමත් හෝ ලෞකික අධිකාරියක් දක්නට නොමැත.

ඇත්ත වශයෙන්ම, භෞතික ලෝකය හරි වැරැද්ද හඳුනන්නේ නැත.

එබැවින්, පෘථිවියේ සියලු මිනිසුන්ගේ විනාශ කිරීම හා ඔවුන් ජීවත් කරවීම අතර, අදේවවාදී සංකල්පය කිසිදු වෙනසක් නොදකී.

අදේවවාදය ද විශ්වාසය මත පදනම් වූවකි. නමුත් එය දැනුම, සම්ප්රේෂණය, බුද්ධිමය හෝ සදාචාරාත්මක බලපෑමක් නොමැති විශ්වාසයකි.

## 3- මැවුම්කරුගේ පැවැත්ම පෙන්වා දෙන සාධක මොනවාද?

**පිළිතුර:** ඒ සඳහා සාධක බොහෝමයක් තිබුණ ද සාධක දෙකක් සමග අපි සීමා කර ගන්නෙමු.

**1-** මැවුම් කරුවෙකුගේ පැවැත්ම පෙන්වා දෙන සාධකය.

**2-** ආරක්ෂාව හා නිරවද්යතාව පෙන්වා දෙන සාධකය.

## 4- පැවැත්ම පෙන්වා දෙන සාධකය යන්නෙහි අථර්ය කුමක් ද?

**පිළිතුර:** පැවැත්ම පෙන්වා දෙන සාධක යනුවෙන් අදහස් කරනුයේ:

සැබැවින්ම සෑම දෙයක්ම බිහි කරනු ලැබූ දෑය. එනම් ඒවා නොතිබූ ශූන්ය තත්ත්වයෙන් පසු ඇති කරනු ලැබූ දෑය. එසේ නම් ඒවාට නිමැවුම් කරුවකු සිටිය යුතුය. එනම් බිහි කළ තැනැත්තෙකි.

ඒ අනුව, ශුද්ධවූ මැවුම්කරුගේ පැවැත්ම පෙන්වා දෙන අසීමිත සාධක අප සතු වන්නේය.

විශ්වයේ ඇති සෑම පරමාණුවක්ම මැවීමේ සාක්ෂි වේ. එසේ නම් බිහිව ඇති සෑම දෙයක්ම පැවැත්ම සනාථ කරනු ඇත. එය මැවුම්කරුගේ පැවැත්ම සහතික කරන්නකි.

තවද, ඔබ, පැවැත්ම දෙස බැලුවහොත්, එය අහම්බෙන් සිදුවන සහ වෙනස්වන සහ ස්ථිර හෝ සදාකාලික නොවන බව ඔබට පැහැදිලි වේ, එබැවින් එය ස්වයංපෝෂිත නොවන අතර, මෙය ඔබට මැවුම්කරුවෙකු සිටින බව ඔබේ මනසෙහි සහතික කරයි. එබැවින් විශ්වය දෙස බැලීමෙන් ඔබේ ඇස් විශ්වයේ මැවුම්කරු දෙසට යොමු වේ.

මේ හේතුවෙන්, විශ්වය දෙස හා අප අවට පවතින වස්තූන් දෙස බලන මෙන් වූ අල්කුආර්නයේ පාඨ බොහෝමයක් ඇත. "අහස්හි හා මහපොළොවේ කුමක් ඇත්තේ දැයි නුඹලා සිතා බලනු. විශ්වාස නොකරන ජනයාට, සංඥාවන් හා අවවාදයන් ප්රයෝජනවත් නොවනු ඇතැයි (නබි මුහම්මද්!) නුඹ පවසනු." 10:101. සූරා යූනුස්

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "ඔවුහු තමන් ගැන කල්පනා නොකළෙහු ද? අහස හා මහපොළොව ද ඒ දෙක අතර ඇති දෑ ද යුක්තියෙන් හා නියමිත කාල නිර්ණයකට අනුව මිස අල්ලාහ් මැව්වේ නැත. තවද ජනයා අතරින් බහුතරයක් දෙනා ඔවුන්ගේ පරමාධිපතිගේ හමු ව ප්රතික්ෂේප කරන්නෝ වෙති." 30:8 සූරා අර්-රූම්.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "අහස්හි හා මිහිතලයේ ආධිපත්යයෙහි ද? යම් දෙයකින් අල්ලාහ් මවා ඇති දෑ ගැන ද බලන්නේ නැද්ද?" 7:185 සූරා අල්-අඃරාෆ්

බිහි කරනු ලැබ ඇති සෑම දෙයක් ම බිහි කරන්නෙකු සිටින බව සෘජුවම පෙන්වා දෙයි!

## 5. ඒකවරණය සහ පරිපූර්ණත්වය පෙන්වා දෙන සාධකය යන්නෙහි තේරුම කුමක් ද?

ඒකවරණය සහ පරිපූර්ණත්වය පෙන්වා දෙන සාධකය යනුවෙන් අදහස් කරනුයේ:

සැබැවින්ම පරමාණුවක ව්‍යුහයන් සෑදෙන කුඩාම නිරීක්ෂිත ද්‍රව්‍යය වන ක්වාකර් (quark) සිට මන්දාකිණි දක්වා පවතින සෑම දෙයකටම ක්‍රියාකාරී සංකීර්ණතා මට්ටමක් තිබේ.

එනම්, එය විශේෂිත කාර්යයක් සහ නිශ්චිත කාර්යයක් ඉටු කරයි.

එමෙන්ම ස්වභාවධර්මයේ ඇති සෑම ක්‍රියාකාරී සංකීර්ණතාවයක්ම හුදු පැවැත්මෙ අතිරික්ත පිළිවෙලයි.

පැවැත්මට පිළිවෙලක් ඇත.

පවතින දෙය තුළ ඇති සංකීර්ණත්වය හුදු පැවැත්මේ අතිරික්ත පිළිවෙලකි.

ඔබ වටා ඇති සෑම දෙයක්ම නිශ්චිත කාර්යයක් ඉටු කිරීමට සැලසුම් කර ඇත.

එබැවින් ඔබ වටා ඇති සෑම දෙයක්ම ක්‍රියාකාරී සංකීර්ණත්වය දරයි.

ක්‍රියාකාරී සංකීර්ණත්වය යනු නිමැවුමෙ සහ බිහි කිරීමෙ සාක්ෂියයයි.

එසේ නම් බිහි කරන්නෙකු සිටිය යුතුය.

ඊට උදාහරණයක් නම් "විදුලි බල්බයකි": මෙය ක්‍රියාකාරී සංකීර්ණතාවය නිරූපණය කරයි.

විදුලි බල්බය සමන්විත වන්නේ:

1- සූත්‍රිකාව.(ෆිලමන්ට් එක)

2- සූත්‍රිකාවට විදුලිය සන්නයනය කරන ඊයම් කම්බිය.

3- සූත්‍රිකාව ආරක්ෂා කරන; එය සමඟ හෝ විදුලිය සමඟ හෝ ක්‍රියාකාරී නොවන නිෂ්ක්‍රීය වායුව.

4- වාතය ඇතුළුවීම හෝ නිෂ්ක්‍රීය වායුව පිටවීම වළක්වාලන වීදුරු ආවරණය. එය නොතිබෙ නම් සූත්‍රිකාව පිලිස්සී යනු ඇත.

**5-** විදුලි බල්බයේ අඩිය: මෙය පාදයට(හෝල්ඩරයට) බල්බය සම්බන්ධ කර, විදුලි ධාරා ගමන් කිරීම සඳහා මාගර්ය පාදා දෙයි.

මෙහිදී, විදුලි බල්බය සරල කළ නොහැකි සංකීණර් පද්ධතියක් වන අතර, ඊට පරව එම විචිත්රවත් නිමර්ාණයට එලදායීවන මූලික බුද්ධිමය සාධක ද පවතී.

විදුලි බල්බයේ විචිත්රවත් නිමර්ාණය ප්රතික්ෂේප කරන හෝ එය අහම්බෙන් මතු වූවා යැයි තකර් කරන පුද්ගලයා ඒ සඳහා සාක්ෂි හා සාධක ඉදිරිපත් කළ යුතුය.

බල්බය සැදූ තැනැත්තා විදුලියේ අරුත, එහි මාගර්, බල්බයේ ප්රයෝජනය සහ සූත්රිකාවේ සංවේදීතාව මැනවින් දනී. එබැවින් බල්බය පැවතීම, එයට දක්ෂ නිෂ්පාදකයෙකු සිටින බවට ඍජු ඇඟවීමක් මිස අහඹු සිදුවීමක් නොවේ. එයට වඩා හැඩයෙන්, සම්පූණර්යෙන්ම වෙනස් විදුලි බල්බ ඇති නිසා එය අහඹුවක් යැයි පවසා සිටීම සුදුසු නැත.

තාකරීක බුද්ධිමය තකර්නය තුළින්ම මිනිසකු වැනි ක්රියාකාරී සංකීණර් දෙයකට එය මැවුම් කළ මැවුම්කරුවෙකු සිටින බව අපට පෙනී යයි.

විදුලි බල්බය සංරචක (කොටස්) 5 කින් සමන්විත වේ ...

මිනිසාගේ සෑම සෛලයකම එහි සංරචක බිලියන 4 කින් සමන්විත වේ.

සංරචක බිලියන 4 ක් ජීවියෙකුගේ කායර්යන් සෑදී ඇත, එය: ජාන කේතය, ජෙනෝමය හෝ DNA, යනුවෙන් හැඳින්වේ. මෙම සංරචක ඔබේ එක් එක් සෛලවල න්යෂ්ටිය තුළ පිහිටා ඇත.

විදුලි බල්බයේ සංරචක 5 ට නිෂ්පාදකයෙකු ඇති බවත් ඔබට නිමර්ාණකරුවකු නොමැති බවත් ඔබ සිතන්නේ නම්, මෙය ඔබේ ගැටලුවයි.

"කිසිවක් නොමැතිව ඔවුහු මවනු ලැබුවෝ ද එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?" 52:35 සූරා අත්-තූර්

ඔබ වටා ඇති සෑම දෙයක්ම සංකීණර් වන අතර ස්වභාවධමර්යේ හෝ පරමාණුවල හෝ ග්රහලෝකවල හෝ ඔබේ ශරීරය තුළ හෝ ක්රියාකාරී සංකීණර්තාවයකින් තොරව කිසිවක් නොමැත.

සෑම පරමාණුවකම සහ සෑම අංශුවකම ක්රියාකාරී සංකීණර්ත්වය සහ ක්රියාකාරීත්වය විශ්වයේ ඇති සෑම දෙයකම පවතී.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "නියත වශයෙන්ම (අල්ලාහ් විසින්) අහස් හා මහපොළොව මැවීමෙහි ද රාත්‍රිය හා දහවල මාරුවෙහි ද ජනයාට ප්‍රයෝජනවත් දෑ රැගෙන මුහුදෙහි ගමන් කරන නැව්හි ද අහසින් ජලය පහළ කර මහපොළොව මිය ගිය පසුව එය එමගින් ජීවමාන කොට එහි සෑම සත්වයෙකුම ව්‍යාප්ත කිරීමෙහි ද, සුළං හැමීමෙහි ද, අහස හා මහපොළොව අතර වසඟ කරනු ලැබූ වලාවන්හි ද අවබෝධ කරන ජනයාට සාධක ඇත." 2:164. සූරා අල් බකරා

මේ පිළිබඳ පෙන්වා දෙන අල් කුආර්න් පාඨ බොහෝමයක් ඇත.

තම බුද්ධිය භාවිත කරන්නන් හැර වෙනත් කිසිවකු ඒවා මෙනෙහි නොකරයි. "බුද්ධිමත් අය හැර වෙනත් කිසිවෙක් මෙනෙහි කරන්නේ නැත." 3:7 සූරා ආලු ඉම්රාන්.

යමෙක් තම බුද්ධිය භාවිතා කර; පැවැත්ම (මැවීමේ සාක්ෂි) දෙස බලා, මවන ලද ජීවීන්ගේ නිරවද්‍යතාවය සහ ක්‍රියාකාරිත්වය (සැලකිල්ල සහ පරිපූර්ණත්වය පිළිබඳ සාක්ෂි) සලකා බලන්නේ නම් බුද්ධිමය වශයෙන්, මැවුම්කරුගේ පැවැත්මේ සාධකවල වලංගු භාවය පදනම් කර ගනිමින් මැවුම්කරුගේ වළංගුභාවය නියත වශයෙන්ම ඔහු පිළිගනු ඇත.

## 6- මිනිසුන් සහ අනෙකුත් ජීවීන් ඉතා සරල මූල ජීවීන්ගෙන් (ප්‍රෝටෝ ජීවීන්ගෙන්) පැමිණිය හැකි නොවේ ද?

**පිළිතුර:** මෙහි ගැටළු දෙකක් පවතී:

**පළමු ගැටළුව:** මිනිසා ප්‍රාථමික ජීවීන්ගෙන් පැමිණියේය යන මෙම දැවැන්ත උපකල්පිත පිම්මට අමතරව, එක් ජීව වගර්යක් තවත් වගර්යකට සම්ප්‍රේෂණය කිරීම පිළිබඳ තනි නිරීක්ෂණ සාක්ෂි නොමැති වීම.

අදේවවාදියෙකු කිසිදු සෘජු සාක්ෂියකින් තොර ව මෙම උපකල්පනය විශ්වාස කර තාකරීක ආගමික සාධක අපි උපයෝගි කිරීම ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද?

**දෙවන ගැටලුව:** Minimum gene set concept (අවම ජාන කට්ටල සංකල්පය) අනුව කිසිම ජීවියෙකු, කොතරම් සරල වුවත්, ජාන 200කට අඩුවෙන් පැවතිය නොහැක.

තවද අවම ජාන සංඛ්‍යාව වන්නේ: කිසිදු ජීවියෙකුට නොනැසී පැවතිය හැකි අවම ජාන ප්‍රමාණයයි!

එනම්, සංඛ්‍යාව අවම ප්‍රමාණයට වඩා එකකින් හෝ අඩු වුවහොත් කිසිදු ජීවී ජීවියෙකු මෙහි කිසිවිටෙක පවතින්නේ නැත.

ජානයක් යනු තොරතුරු කේතනය කරන ජාන කේත විශාල සංඛ්‍යාවක් අඩංගු තොරතුරු පටයකි.

මෙහි ජීවය සඳහා අවශ්‍ය අවම ජාන සංඛ්‍යාවක් ඇති බැවින්, මෙම ජාන සමූහය ශක්තිය සඳහා කේතනය කරයි. - ඊට හේතුව ශක්තියෙන් තොර ව ජීවියෙකුට ජීවයක් නොමැති බැවිනි. - එමෙන්ම ආහාර සඳහා වෙනත් ජාන කේත ඇති අතර ප්‍රජනනය සඳහා ද තවත් ජාන කේත ඇත. ජීවිතයේ මූලික කාර්යයන් සඳහා ද කේතනය කරන වෙනත් කේත ද ඇත.

ජීවයට අවශ්‍ය අවම ජාන සංඛ්‍යාව ගණනය කර එය ජාන දෙසීයකට අඩු නොවිය යුතු බව විද්‍යාඥයන් තීරණය කර ඇත.

ජීවයට අවශ්‍ය අවම ජාන සංඛ්‍යාව ජාන තුන්සිය අසූ දෙකකට නොඅඩු යුතු බව Craig Venter නම් ආයතනය නිගමනය කර ඇත.(1)

පෘථිවියේ වඩාත්ම සියුම් ජීවිය වන මයිකොප්ලාස්මා (Mycoplasma) හි ජාන 468 ක් ඇති බව විද්‍යාඥයින් සොයාගෙන ඇත.

එය හුදෙක් පදාර්ථයක් නම් සහ ලෝකය භෞතික පද්ධතියක් පමණක් නම්, අපට හයිඩ්‍රජන් සිට මිනිසා වෙත යාමට අවශ්‍ය වූ විටෙක, අපි ශුන්‍ය ජානයෙන් ආරම්භ කළ යුතු වේ!

කෙසේ වෙතත් විද්‍යාව අපට පවසන්නේ ශුන්‍ය ජාන, එක් ජානයක් හෝ ජාන සියයක් වැනි දෙයක් නොමැති බවයි. අවම වශයෙන් අපට දැවැන්ත තොරතුරු සමූහයක් අවශ්‍ය බව විද්‍යාව පවසයි. එසේ නොවුවහොත් ජීවියා ආරම්භයේ සිටම කිසිසේත් බිහි වන්නේ නැත.

ස්වභාවධර්මයේ ප්‍රාථමික ලෙස කිසිවක් නැත, නමුත් සෑම පද්ධතියක්ම ස්වාධීන විස්මයකින් ආරම්භ විය!

---

(1) J. Craig Venter Institute (JCVI) විසින් Global transposon mutagenesis හරහා M. genitalium හි සියලුම අත්‍යවශ්‍ය ජාන සොයා ගැනීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රෝටීන් කේතීකරණ ජාන 482 න් 382 ක් අත්‍යවශ්‍ය බව ඔවුන් සොයා ගත්හ.

ජීවීන් පෙනී සිටීමට පෙර, ඔවුන් සංකේතනය කරන තොරතුරු පද්ධතිය තුළ විස්මය පවතිනු ඇත. මෙම විස්මය අදේවවාදය හමුවේ බාධාවක් ලෙසින් හා දිව්‍යමය මැවීම ප්‍රතික්ෂේප කරන්නන් ඉදිරියේ බාධාවක් ලෙසින් සෑම විටම පවතිනු ඇත.

නිශ්චිත වැදගත් කාර්යයන් නිෂ්පාදනය කිරීමට විශේෂිත වූ තොරතුරු - ඔබේ එක් එක් සෛලවල න්‍යෂ්ටිය තුළ අඩංගු තොරතුරු- කොටස් බිලියන 4ක් ඉදිරියේ ඔබ සිටියි.

ශුන්‍ය ජානයෙන් ආරම්භ වූ ජීවීන් සිටින බව අදේවවාදියා සිතින් මවා ගෙන තිබුණත්, මෙම සිහිනය නැති කිරීමට, අවම ජාන පිළිබඳ න්‍යාය පැමිණියේය.

ජීවී ජීවීන්, පළමු මොහොතේ සිට ක්‍රියාකාරීව සංකීර්ණ ලෙස පෙනී සිටියේය; එසේ නොවුවහොත් ඔවුන් ආරම්භයේ සිටම පෙනී නොසිටිනු ඇත.

## 7- දේවාරක්ෂාව සහ පරිපූර්ණත්වය පෙන්වා දෙන සාධක සඳහා උදාහරණ මොනවාද?

**පිළිතුරු:** එවන් උදාහරණ අසීමිතය.

මහපොළවේ ඇති පුස්තකාල ඒ සඳහා ප්‍රමාණවත් වන්නේ නැත.

"මහපොළොවේ ගස් (සියල්ල) පන්හිඳවල් වී තවද මුහුද ද එයට පසු ව තවත් මුහුදු හතක් (තීන්ත බවට) එයට එකතු වුව ද අල්ලාහ්ගේ වදන් නිමා නොවනු ඇත. නියත වශයෙන්ම අල්ලාහ් සවර් බලධාරීය. මහා ප්‍රඥාවන්තය." 31:27 සූරා ලුක්මාන්

විශ්වයේ ඇති සෑම පරමාණුවක්ම අද අප දන්නා දේවාරක්ෂාව පෙන්වා දෙන සාධකයකි. එසේ නැතහොත් අද හෝ හෙට මෙම යථාර්ථය පිළිබඳ දැනගත හැකි වන්නේය.

a- ඉන්සියුලින් - ග්ලූකෝස් ජීර්ණය කරන හෝමෝනය - ඔබ අනුභව කළ සීනි ප්‍රමාණයම අග්න්‍යාශය (ඇල දිව) මගින් සිරුරට සපයයි.

b- හදවතේ රුධිරය පොම්ප කිරීමේ බලය, වැය කරන බලයට අනුව මාංශ පේශිවලට අවශ්‍ය ශක්තියට සමාන වේ.

c- කුස තුළ ආති ආහාර ඔබේ මුඛයට නැවත හැරී ඇවිත් ඔබ හානියට පත් නොවන අයුරින් ඔබේ උදරයේ කපාට පිහිටීම.

d- කිසිම මොහොතක ඔබේ ඇඳුම් වලට හානියක් නොවන පරිදි කපාට පිහිටා තිබීම.

e- ඔබේ හිස් කබලේ අස්ථි ආරක්ෂිතව සහ පහසුවෙන් මව් කුසෙන් බැහැර වන තුරු ඒවා එකට සංසන්ධිත වන්නේ නැත. මන්ද ඒවා සංසන්ධිත වී ඇත්නම්, ඔබේ මවගේ ගභර්ාෂයෙන් එය පහළ වනුයේ බිඳී යාමෙන් පසුවය. එමෙන්ම ඔබේ මොළයේ වධර්නය සම්පූණර් වන තුරු ඒවායෙහි (අස්ථි) වධර්නය සම්පූණර් වන්නේ ද නැත.

f- විද්යුත් සංඥා සම්ප්රේෂණය කරන ඔබගේ සියලුම ස්නායු පරිවාරක තට්ටුවකින් ආවරණය කර ඇත - අපි දැන් විදුලි රැහැන් ආවරණය කර තිබෙන පරිදි - එය විද්යුත් සංඥාව විසිරී, නාස්ති වී නොයනු පිණිසය. එසේ නැතහොත් ඔබට බාධාවක් සිදුවීමට හේතුවක් නොවනු පිණිසය.

g- ඉලෙක්ට්රෝනය තත්පරයට කිලෝමීටර් දහසක වේගයෙන් න්යෂ්ටිය වටා භ්රමණය වන අතර එසේ නොවුවහොත් ධන න්යෂ්ටිය සමඟ ඇති ආකෂර්ණ බලය නිසා එය න්යෂ්ටිය තුළට වැටෙනු ඇත. විශ්වය ආරම්භ වීමට පෙර එය බිඳ වැටෙනු ඇත, මෙය පරමාණුව සෑදීම සඳහා වන සුදුසු වේගයයි.

h- හයිඩ්රජන් පරමාණු දෙකක් විලයනය වන විට, හයිඩ්රජන් ස්කන්ධයෙන් 0.007% ශක්තිය බවට පරිවතර්නය වන අතර, මෙම ස්කන්ධය 0.007% වෙනුවට 0.006% නම්, ප්රෝටෝනය නියුට්රෝනය සමඟ විලයනය නොවන අතර විශ්වය හයිඩ්රජන් පමණක් පවතිනු ඇත. තවද, ඉතිරි මූලද්රව්‍ය කිසිවක් බිහිවන්නේ නැත. එමෙන්ම, පරිණාමනය වූ ස්කන්ධය 0.007% වෙනුවට 0.008% ශක්තියක් බවට පත් වුවහොත්, ඒකාබද්ධ වීම අධික වේගවත් වන හෙයින්, එය විශ්වයෙන් හයිඩ්රජන් ක්ෂණිකව අතුරුදහන් වීම සිදුවනු ඇත. එයින් ජීවියක් ජීවත් වීමට නොහැකි වනු ඇත. එබැවින් එම ප්රමාණය 0.006% සහ 0.008% අතර විය යුතුය.

i- ඉලෙක්ට්‍රෝන ස්කන්ධය නියුට්‍රෝන ස්කන්ධයෙන් 0.2% නියෝජනය කරන අතර පරමාණුවක් සෑදීමේ සම්මත ස්කන්ධයේ ප්‍රමිතිය මෙයයි.

j- ශාකය ප්‍රරෝහණයෙන් පසු අංකුර ඍජුවම ආලෝක ප්‍රභවය දෙසට ගමන් කරයි. මුල් පහළට බසී. එහිදී අංකුර ආලෝකයට අධි සංවේදී වෙයි. ඒවායෙහි කායර්ය කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු බීජය තුළ කේතනය කරනු ලැබ ඇත. ශාකයේ ඉහළ සහ පාශර්වීය වධර්නය තුළත් මුල්වල දිශාව තුළත් පාලනය කරන හෝමෝන ඇත. ඒ සියල්ල බීජය තුළ කේතනය කර ඇත.

k- ඔබ රසවත් පලතුරු අනුභව කර, වියළි, රස නැති බීජ ඉවතට විසි කරයි. එමගින් ඔබ එම පලතුරට එහි ජාන හරහා යාමට ඉඩ සලසයි. මන්ද පලතුරු ඔබට රසවත් රසයක් ලබා දෙන අතරම ඔබට නොපෙළඹෙන අයුරින් එහි ජාන - එහි ජීවයේ ආරම්භය - වියළි සිනිඳු බීජයේ හදවත තුළ සඟවා ගනියි. මෙම බීජය බිම තබා, සුදුසු තත්වයන් ඇති විට, එහි කොටස්, අතු සහ මුල් සහිත පලතුරු සහිත ගසක් සෑදීමට පටන් ගනී, මේ සියල්ල සිදුවන්නේ කිසිම දෙයක් නොදන්නා ශාකවල ය.

l- කතා කළ නොහැකි, සවන් දිය නොහැකි පලතුර සඳහා එම තොරතුරු සකස් කළේ කවුද? ඔබ රස විඳින පරිදි එහි සීනි ප්‍රමාණය සකස් කළේ කවුද?

පසුව: ඔබ එය අත්හැර දමා ඉවත දමන තරමට පිළිගත නොහැකි හා රසවත් නැති එම බීජය සකස් කළේ කවුද?

පසුව: සියළුම විස්තර සහ ක්‍රියාකාරකම් සහිත නව ශාකයක් නිමර්ාණය කිරීමට ප්‍රමාණවත් ප්‍රවේණික තොරතුරු බීජයට පැටවූයේ කවුද?

m- මැතක දී අපට පෙන්වා දී ඇත්තේ මෙසේය: අප ප්‍රීතියෙන් ජීවත් වන අවස්ජීති බව නොහොත් අකමර්කතාව (inertia) සමස්තයක් ලෙස විශ්ව ස්කන්ධයේ ප්‍රතිඵලයකි.

## අවස්ජීති බව (අකමර්කතාව) යන්නෙහි අථර්ය කුමක් ද?

ඔබ මෝටර් රථයක ගමන් කරමින් සිටියදී හදිසියේම මෝටර් රථය නතර වුවහොත් කුමක් සිදුවේද?

ඔබ ඉක්මණින් ඉදිරියට තල්ලු කරනු ලබයි. එය එසේ නොවේද?

මෙය අවස්ථිති බව (උදාසීනත්වය) හෝ අකමර්කතාවයයි.

අපේ ලෝකයේ අවස්ථිති භාවය දැන් පවතිනවාට වඩා අඩු නම්, සියුම් සුළඟට පවා පවර්තය චලනය කළ හැකි වේ. මෙලෙස සියලුම වගර්යේ දෑ විනාශ වී යන බැවින් මෙලොවෙහි නිරන්තර පැවැත්ම ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් වෙමු.

දැන් තිබෙන තත්ත්වයට වඩා අකමර්තාවය වැඩි නම්, අපට ඇඟිලි සෙලවීමටවත් නොහැකි වනු ඇත.[1]

අකමර්තාවයේ බලය හෝ අවස්ථි බව ස්කන්ධය(mas) මත රඳා පවතී.

භෞතික විද්‍යාඥයින් මවිතයට පත් කළ කරුණ නම්, අපගේ සෞරග්‍රහ මණ්ඩලය අඩංගු මන්දාකිණිය වන ක්ෂීරපථයේ ස්කන්ධය මිලියන 0.1 කින් පමණක් අවස්ථිති පාලනයට දායක වන අතර පෘථිවි ස්කන්ධයෙන් අවස්ථිති භාවය පාලනය කරන්නේ මිලියන 0.001 කින් පමණක් වීමයි.

එහෙයින්, ඵලදායී ලෙස අප ජීවත් වන පරිපූණර් අවස්ථිති භාවය සහ අපගේ සියලු ක්‍රියාකාරකම් අභ්‍යාස කිරීම තුළින් පවතින දෑ සමස්ත විශ්වයේ ශක්තියේ එකතුවේ ප්‍රතිඵලයකි.

"මෙම අහස හා මහපොළොව ද ඒ දෙක අතර ඇති දෑ ද නිෂ්ඵලයක් ලෙසින් අප විසින් මවා නැත. එය දෙවියන් ප්‍රතික්ෂේප කළවුන්ගේ සිතුවිල්ලයි. එහෙයින් දෙවියන් ප්‍රතික්ෂේප කළවුනට (නිරා) ගින්නෙන් වූ විනාශය අත්වේවා!" 38:27. සූරා සාද්.

දැනුම පුළුල් වන තරමට ප්‍රඥාවේ අරුමය සහ මැවිල්ලේ සියුම් බව මතු වනු ඇත![2]

n- එසේ නම්, ඇස දෙස ගොස් බැලුවේ නම් කෙසේ ද?

(1) Nature's Destiny: How the Laws of Biology Reveal Purpose in the Universe, Michael Denton.

(2) මෙම ප්‍රශ්නය Michael Danton විසින් ඔහුගේ: "The fate of nature" නම් ග්‍රන්ථයේයේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇති අතර, මෙම පොත ඩාර් අල්-කාතිබ්හි ප්‍රකාශන ඇසුරෙන් පරිවතර්නය කෙරී ඇත.

එය මිල කළ නොහැකි ආශිර්වාදයකි. "ඔහුට අපි දෑස් ඇති නොකළෙමුද?" 90:8 සූරා අල්-බලද්.

අක්ෂි විභේදනය මෙගා පික්සල් (mega pixels) පන්සිය හැත්තෑ හයකට සමාන වේ.

ලෝකයෙහි පවත්නා පිරිසිදුම කාචය ඇස තුළ අන්තගර්තව ඇත.

දෘෂ්ටි විතානයේ (Retina) ඇති ප්‍රකාශ ග්‍රාහකයේ(photo receptor) ප්‍රමාණය වගර් මිලිමීටර භාගයක් නොඉක්මවන අතර එය විවිධ මානයන්ගෙන් යුත් වණර් මිලියන දහයක් අතර වෙන්කර හඳුනා ගනී. එය ආශ්වයර්මත් හා විස්මිත දිව්‍ය නිමර්ාණයකි.

තවද, ඔබ ඉදිරියෙන් යමක් දෙස බලා ආලෝකය දෘෂ්ටි විතානය (රෙටිනා) මත පතිත වන විට, මේ මොහොතේ සංකීණර් රසායනික ක්‍රියාවලීන් කිහිපයක් සිදු වන අතර අවසානයේ විද්‍යුත් ධාරාවක් ජනනය වේ. මෙම ධාරාව ඔබේ ඇසේ දෘෂ්ටි විතානයේ (රෙටිනා) සිට ස්නායු ධාරා හරහා ඔබේ මොළයට සම්ප්‍රේෂණය වේ. මොළය මෙහි මෙම විද්‍යුත් ධාරාවේ සංඛ්‍යාතය දශර්නයක් ලෙස අථර්කථනය කරයි, මොළයට කල්තියා ඒකාබද්ධ ශබ්දකෝෂයක් තිබෙනවාක් මෙන් ළඟා වූ විද්‍යුත් ධාරාව ඔබ ඉදිරියෙහි ඇති දේ පිළිබඳ දශර්නයක් බවට එය පරිවතර්නය කරයි.

ඔබ ඒ ගැන සිතන්නේ නම්, එය ඉතා විශ්මිතය!

**මොහොතකට සිතන්න:** මෙම මොළය අඳුරු අස්ථි පෙට්ටියක් තුළ පිහිටා ඇත - මෙම අඳුරු පෙට්ටිය හිස් කබලයි.

ඔබේ මොළයට ළඟා වන්නේ විද්‍යුත් ධාරාවන් පමණි.

එසේ නම්, මොළය මෙම ධාරාව දශර්ණයක් ලෙස අථර්කථනය කරන්නේ කෙසේද?

එය ඔබට දශර්නය ලබා දුන්නේ කෙසේද?

ඇස් විවෘත කර බලන වහාම මේ ආශ්වයර්ය ක්ෂණයකින් සිදුවන්නේය!

සවන වෙත එය අදාළ කර ගත් විට එය ද එසේම වන්නේය.

ශබ්ද තරංග ඔබේ කන් බෙරය තුළට ඇතුළු වන විට, කන් බෙරය ඒවා තරංගවල සිට යාන්ත්‍රික චලනය බවට පරිවතර්නය කරයි. මෙම

යාන්ත්‍රික චලනය මැද කනේ ඇති කුඩා අස්ථි තුනක් හරහා අභ්‍යන්තර කන වෙත සම්ප්‍රේෂණය වන අතර, එමඟින් එය විද්‍යුත් ධාරාවක් බවට පරිවතර්නය වේ.

මෙම විද්‍යුත් ධාරාව දැන් අභ්‍යන්තර කනේ සිට මොළයට සම්ප්‍රේෂණය වනු ඇත. එවිට මොළය මෙම විද්‍යුත් ධාරාව ශබ්ද ලෙස වෙන්කර හඳුනා ගැනීමට පටන් ගනී. එවිට ඔබට ශබ්දය ඇසෙනු ඇත!

මේ සියල්ල සිදුවන්නේ තත්පරයකටත් අඩු කාලයකදී ය. "නුඹලාගේ මව්වරුන්ගේ කුස තුළින් නුඹලා කිසිවක් නොදැන සිටි තත්ත්වයේ නුඹලා ව බැහැර කළේ අල්ලාහ්ය. තවද ඔහු නුඹලාට ශ්‍රවණය ද බැල්ම ද හදවත් ද ඇති කළේය. නුඹලා කෘතවේදී විය හැකි වනු පිණිස." 16:78 සූරා අන්-නහ්ල්.

මේ සියලු සංඥා නිවැරදිව වෙන්කර හඳුනා ගැනීම සඳහා ඇස, කන, ස්පශර්ය, රස, ගඳ සුවඳ, සහ ශරීරයේ විවිධ කොටස් වලින් මොළයට සෑම මොහොතකම විද්‍යුත් සංඥා දහස් ගණනක් ලැබෙන බව සිතන්න. "මෙය අල්ලාහ්ගේ මැවීමය. එහෙයින් ඔහුගෙන් තොරව (ඔබ නමදින) ඔවුහු මැව්වේ කුමක් ද? යන්න ඔබ මට පෙන්වනු. නමුත් අපරාධ කරුවෝ පැහැදිලි මුළාවෙහිය." 31:11 සූරා ලුක්මාන්.

"එය සෑම දෙයකටම ස්ථාවරත්වයක් ඇති කළ අල්ලාහ්ගේ නිමැයුමකි. නියත වශයෙන්ම ඔහු නුඹලා සිදු කරන දෑ පිළිබඳ ව අභිඥානවන්තය." 27:88. සූරා අන්-නම්ල්.

අල්ලාහ්ගේ ආශිවර්ාද අතරින් එක් ආශීවර්ාදයක් හෝ ගණන් කළ හැක්කේ කාටද?

ඔබේ ශරීරයේ සෑම සන්ධියක් සහ ඔබට අවශ්‍ය පරිදි චලනය වීමට ඉඩ සලසන සෑම අස්ථියක් ගැනම සිතන්න!

සන්ධි ගැන සිතන්න! අස්ථි අතර ඝෂර්ණයකින් තොරව චලනය වීමට ඉඩ සලසන, බාදනය නොවන සිනිඳු සන්ධි මත, යන්ත්‍රවල සන්ධිවල තැන්පත් කරන ලිහිසි තෙල් වැනි ද්‍රවයක් දෙවියන් වහන්සේ තැන්පත් කර ඇත.

අල්ලාහ්ගේ ආශිවර්ාදය ගැන සිතන්න, මෙනෙහි කරන්න, ඔහුගේ ආශිවර්ාදයට කෘතඥ වන්න, ඔහු සුවිශුද්ධය.

අල්ලාහ්ගේ ආශිවර්ාද අප්රමාණය. "අහස්හි ඇති දෑ හා මහපොළොවේ ඇති දෑ නියත වශයෙන්ම අල්ලාහ් නුඹලාට වසඟ කර දුන් බවත් ඔහුගේ ආශිවර්ාදය නුඹලා වෙත මතුපිටින් ද ඇතුළාන්තයෙන් ද සම්පූණර් කර, දී ඇති බවත් නුඹලා නොදුටුවෙහුද? කිසිදු දැනුමකින් හෝ මග පෙන්වීමකින් හෝ ආලෝකය ලබා දෙන දේව ග්රන්ථයකින් හෝ තොර ව අල්ලාහ් විෂයයෙහි තකර් කරන්නෝ ද ජනයා අතරින් වෙති." 31:20 සූරා ලුක්මාන්.

## 8- සමහර අදේවවාදීන් දෙවාරක්ෂාව පරිපූණර්ත්වයේ සාධක විවේචනය කරති; රෝග හා භූමිකම්පා වැනි පරමාදශර්ී නොවන කරුණු මෙහි ඇතිවන්නේ ඇයි දැයි විමසති.

**පිළිතුර:** අදේවවාදියෙකුගේ ප්රකාශනයට අනුව, විශ්වයේ පරිපූණර් දේවල් නොමැතිකම, පරිපූණර්ත්වයේ පැවැත්ම ප්රතික්ෂේප නොකරයි.

එමගින් විශ්වයේ පරිපූණර්ත්වයේ පැවැත්ම ඔහු තහවුරු කරයි.

කිසිසේත්ම පරිපූණර්වයක් නොතිබුනේ නම්, අදේවවාදියා අසම්පූණර් දේවල පැවැත්ම අවබෝධ කර නොගනී.

එසේනම්, නිමර්ාණයක් නැති ලෝකයක කෙනෙක් නිමර්ාණ දෝෂයක් ගැන කතා කරන්නේ කෙසේද?

ඔවුන් අසම්පූණර් යැයි විස්තර කරන දේ සම්බන්ධයෙන් වූ කලී, මෙය දැනුම නොමැතිකම හෝ කරුණු පිළිබඳ ප්රඥාව වටහා ගැනීමට අපොහොසත් වීමකි.

විශ්වය සවර් සම්පූණර්යි, එහි කිසිදු විපතක් සිදු නොවේ යැයි දේවත්වය විශ්වාස කරන්නන් පවසන්නේ නැත. ඔවුන් පවසා සිටිනුයේ: විශ්වය පරිපූණර්යි, අරමුණක් නොමැතිව එහි කිසිවක් සිදු නොවේ යනුවෙනි.

අදේවවාදියාගේ ස්ථාවරය, අභ්යවකාශ යානයේ පරිපූණර්ත්වය ප්රතික්ෂේප කරන අයකුට සමාන වන්නේය. එය එහි විශාල ඛනිජ තෙල් ද්රව්ය ප්රමාණයක් ඇති බැවින් ඕනෑම මොහොතක යානය පුපුරා යා හැකි බැවිනි![1]

(1) නූතන දශර්නය තුළ ආගම විවේචනය කිරීමේ සංසිද්ධිය, Dr. Sultan Al-Umari, Ph.D. නිබන්ධනය.

තවද ලෝකය, සදාකාලික හෝ කාලානුරූපී ලෝකයක් ලෙස නිර්මාණය කර නොමැති අතර අපව දෙවිවරුන් ලෙස නිර්මාණය කර ද නැත.

ඒ වෙනුවට, අපව නිර්මාණය කර ඇත්තේ යහපත් හා අයහපත් දැයින් පරීක්ෂා කරනු ලබන්නටය. "තවද නපුරෙන් හා යහපතින් පරීක්ෂණයක් ලෙසින් අපි නුඹලා පිරික්සන්නෙමු. තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ අප වෙතමය." 21:35. සූරා අල්-අන්බියා.

හොඳ සහ නරක මෙන්ම සෑම පරීක්ෂණයක්ම ප්‍රඥාවේ සහ දිව්‍ය කැමැත්තේ රාමුව තුළ කැරකෙයි.

## 9- විශ්වය නිර්මාණය කළ භෞතික හේතුවක් පැවැත්ම වළක්වන්නේ කුමක් ද? උදාහරණ වශයෙන්: තවත් ශිෂ්ටාචාරයක් හෝ වෙනත් දෙයක්? විශේෂයෙන්ම සදාකාලික දෙවියන් වහන්සේ කුමකට ද?

**පිළිතුර:** මීට වසර දහසකට පෙර ඉස්ලාමීය විද්වතුන් විසින් ස්ථාපිත කරන ලද රීතියක් ඇත, මෙම රීතිය පවසන්නේ: "ක්‍රියාකාරීන්ගේ අනුපිළිවෙල අනිවාර්යයෙන්ම ක්‍රියාවන් සිදු නොවීමට හේතුවේ"(1)

ක්‍රියාකාරීන්ගේ ඇති අනුපිළිවෙල, එනම්: එක් මැවුම්කරුවකුට වඩා අධික අය සිටී. මෙම ප්‍රශ්නය තවත් ශිෂ්ටාචාරයක්, ඊට පෙර බිහි කළ ශිෂ්ටාචාරයක් සහ ඔවුන්ව බිහි කළ ඔවුනට පෙර පැවති ශිෂ්ටාචාරයක් ගැන සඳහන් කරයි. මෙය මැවුම්කරුවන්ගේ අනුපිළිවෙල පවතින දාමයයි.

මෙම දාමය අනිවාර්යයෙන්ම ක්‍රියාවන් සිදු නොවුනු බවට සාධකයකි.

එනම්, (මේ හේතුවෙන්) ක්‍රියාවන් සිදු නොවීම. එනම් විශ්වය, මිනිසා සහ වෙනත් ජීවීන් වැනි මැවීම් නොවීමයි.

ක්‍රියාකාරීන් තුළ පවතින දාමය යනු විශ්වයේ සහ පැවැත්මේ විද්‍යාමානය පෙන්වා දෙන්නේ නැත.

ශිෂ්ටාචාරයක් රඳාපවතින්නේ එය නිර්මාණය කළ වෙනත් ශිෂ්ටාචාරයක් මත නම්, එම ශිෂ්ටාචාරය ඊට පෙර සහ එය නිර්මාණය කළ

(1) නූතන දර්ශනය තුළ ආගම විවේචනය කිරීමේ සංසිද්ධිය, Dr. Sultan Al-Umari, Ph.D. නිබන්ධනය.

ශිෂ්ටාචාරයක් මත රඳා පවතී නම්, මෙසේ අනන්තය දක්වා ගිය කල, මෙම ශිෂ්ටාචාරය හෝ ඊට පෙර හෝ ඒවා දෙකටම පෙර පැවති ශිෂ්ටාචාරය බිහි නොවන බව පෙනෙන අතර, පැවැත්ම හෝ කිසිවක් බිහි නොවන බව ද පෙනේ.

මන්ද මේ ආකාරයට සෑම ශිෂ්ටාචාරයක්ම ඊට පෙර පැවති ශිෂ්ටාචාරයක් මත රැඳී පවතින නිසා, කිසිදු ශිෂ්ටාචාරයක් හෝ කිසිවක් හෝ බිහි නොවන්නේමය.

එහෙයින් සෑම දෙයක්ම මුලින්ම නිමර්ාණය කළ නිත්‍ය මැවුම්කරුවෙකු සිටිය යුතුය!

අසීමිත අනුපිළිවෙලක් තිබේ නම් සහ දාමයේ සෑම සබැඳියක්ම එයට පෙරවූ දැය මත රඳා පවතී නම්, එවිට කිසිදු ජීවියෙක්, මැවීමක් හෝ පැවැත්මක් නොදකිනු ඇත. මන්ද ක්‍රියාකරුවා තමාට පෙර සිටී නියෝජිතයෙකු මත රඳා පවතින අතර, ඔවුන් දෙදෙනාට පෙර පූවර්ගාමියා මත රඳා පවතින අතර, ඔහු ද තමාට පෙරවූ දෑ මත රඳා පවතින බැවිනි. මේ හේතුවෙන්, එහි කිසිවක් නොවනු ඇත.

අනුපිළිවෙල / දාමය යම් ස්ථානයේ නතර විය යුතුය.

මෙහි දී කිසිවෙකු අබිබවා නොගිය ප්‍රථම මැවුම්කරු පිළිබඳව අපි තරයේ විශ්වාස කර ප්‍රකාශ කර සිටිමු.

## 10- විශ්වය පාලනය කරන නීති අපි දන්නා අතර, භූමිකම්පා ඇතිවීමට හේතුව අපි හොඳින් දනිමු; එසේනම් අපි නීතිය දන්නා තාක් කල් අපට මැවුම්කරුවෙක් අවශ්‍ය වන්නේ ඇයි?

**පිළිතුර:** විශ්වයේ නිමර්ාණය සහ එහි විද්‍යාමානය සඳහා නීතීන් ප්‍රමාණවත් යැයි අදේවවාදියෙකු උපකල්පනය කරයි. සමහර අදේවවාදීන් "ගුරුත්වාකෂර්ණ නියමය" පිළිබඳ අදහස මත විශ්වාසය තබා ඇති බවත්, එය විශ්වයේ මතුවීම සඳහා ප්‍රමාණවත් වේ යන බවත් විශ්වාස කරති. ගුරුත්වාකෂර්ණ නියමයේ (law of gravity) මූලාශ්‍රය ගැන සිතීමෙන් හෝ එය නියම කළේ කවුරුන්ද හෝ එයට මැදිහත්වීමේ හා බලපෑම් කිරීමේ ගුණාංගය ලබා දුන්නේ කවුරුන්ද යන්න ගැන පමණක් සිතීම

තුළින් ආත්මීය වශයෙන් එම විශ්වාසය බිඳ වැටීමෙන් එම දශර්ණය නොසළකා හැරේ.

මෙම මූලික ප්‍රත්‍යක්ෂයෂය පිළිබඳ නොතැකුව ද 'ගුරුත්වාකෂර්ණ නියමය' බිලියඩ් බෝලය (billiard ball) පෙරළීමට හේතු නොවේ!

යමක විද්‍යාමානයෙන් තොරව නීතියට පමණක් කිසිවක් කළ නොහැක.

ගුරුත්වාකෂර්ණ නියමය බිලියඩ් බෝලයක් නිපදවන්නේ නැත, නමුත් එය දිස්වූ විටෙක බිලියඩ් පොල්ලකින් පහර දුන්නොත් පමණක් එය චලනය කරයි.

නියත වශයෙන්, ගුරුත්වාකෂර්ණ නියමය ස්වාධීන දෙයක් නොව ස්වභාවික සිදුවීමක් විස්තර කිරීමකි.

තවද ගුරුත්වාකෂර්ණ නියමය, බිලියඩ් පොල්ල තද කර එය චලනය කිරීමේ බලයෙන් තොරව බිලියඩ් බෝලය චලනය නොකරනු ඇත. මෙම අවස්ථාවේ පමණක් බිලියඩ් බෝලය චලනය වන අතර ගුරුත්වාකෂර්ණ නීතියේ බලපෑම ද දිස්වේ.

නමුත්, අදේවවාදියෙකු උපකල්පනය කරන්නේ ගුරුත්වාකෂර්ණ නියමයේ පැවැත්ම බිලියඩ් බෝලයක්, බිලියඩ් පොල්ලක් සෑදීමට සහ බෝලය පෙරළීමට ප්‍රමාණවත් බවයි!

මෙම විශ්වයේ විද්‍යාමානයට හේතු වූ සාධක අතර බුද්ධියට සහ තකර්යට වඩාත් සමීප වන්නේ මේ දෙකින් කුමක් ද?: මැවුම්කරු ද? එසේ නැතහොත් නීතිය ද?

ඒ හා සමානව, මෝටර් රථ එන්ජිමක අභ්‍යන්තර දහන නීති මගින් මෝටර් රථ එන්ජිමක් නිමර්ාණය නොවේ.

අපි මෝටර් රථයේ මෝටරයට අභ්‍යන්තර දහන නීති එකතු කළහොත්, මෝටරය ද ක්‍රියා නොකරනු ඇත, එබැවින් ඒ සඳහා ශක්තිය ලබා දෙන පෙට්‍රල් තිබිය යුතුය. දහනය සඳහා ස්පාකර් ප්ලග් (spark plug) එකක් තිබිය යුතුය. ඊට පෙර මෝටරයේ පැවැත්ම තිබිය යුතුය. මෙහිදී අභ්‍යන්තර දහන නීති මතුවී මෝටරය ක්‍රියා කරනු ඇත.

මෝටරය, ස්පාකර් ප්ලග්, පෙට්‍රල්, රියදුරු සහ මහා මාගර්ය නිමර්ාණය කිරීමට අභ්‍යන්තර දහන නීති (internal combustion law)

ප්‍රමාණවත් යැයි උපකල්පනය කිරීම බුද්ධිමය වශයෙන් සාධාරණ නොවේ.

විශ්වයේ බිහිවීම පැහැදිලි කිරීම සඳහා නීතිය ප්‍රමාණවත්ය යන අදහස කිසිදු අයුරකින් නුවණට සුදුසු නැති අදහසකි.

එපමණක් නොව, අපි මෙම අදහස උපකල්පනය කළහොත්, එය පෙර ප්‍රශ්නයේ පිළිතුරෙහි අප පැහැදිලි කළ ක්‍රියාකාරීන්ගේ අනුපිළිවෙල තුළට අප ඇතුළත් වන්නෙමු. එනම් මෙම නීතිය නිමර්ාණය කළේ කවුද? එය බිහි කළේ කවුද? යන්නය. එය වෙනත් නීතියක් යැයි ඔවුන් ප්‍රකාශ කළහොත්, කිසිදු නීතියක් හෝ කිසිදු ජීවියෙකු විද්‍යාමාන නොවන බව නියම කරනු ලබන ක්‍රියාකාරීන්ගේ අනුපිළිවෙළ තුළට අපි ඇතුළු වෙමු.

## 11- විශ්වයේ මූලාරම්භයට සන්නිපතිතය (Coincidence) හේතු විය නොහැක්කේ කෙසේද?

**පිළිතුර:** සන්නිපතිතය(coincidence) යන අදහස පිළගැනීම යනු, වියහැකිදේ පිළිබඳ මූලධමර්ය නොදැන සිටීමයි. මක්නිසාද යත් සන්නිපතිතයට අත්‍යාවශ්‍ය කොන්දේසි දෙකක් ඇති බැවිනි.

ඒවා නම්: කාලය හා ස්ථානයයි.

සන්නිපතිත සිදුවීමේ විපාකය දැක ගන්නට කාලයක් අවශ්‍ය වේ.

එමෙන්ම එහි විපාකය ඇති කිරීම සඳහා භෞතික ස්ථානයක් අවශ්‍ය වේ.

අපගේ විශ්වය, කාලය සහ ස්ථානය නොමැතිව පැමිණ තිබියදී, විශ්වය බිහි කිරීමේදී සන්නිපතිත භූමිකාවක් ඇතැයි අප පවසනුයේ කෙසේද?

සන්නිපතිය හටගත් නැති විට සන්නිපතියේ විපාකය සිදු වන්නේ කෙසේද?

සන්නිපතිතට අත්‍යාවශ්‍ය කාලය හා ස්ථානය තවමත් බිහි නොවූ විට සන්නිපතිතයේ විපාකය ලබා ගන්නේ කෙසේද?

## 12- විශ්වය සදාකාලික බව තරයේ පවසන අදේවවාදියෙකුට අප ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

පිළිතුර: තාප ගති විද්‍යාවේ දෙවන නියමයට (Second Law of Thermodynamic) අනුව විශ්වය සදාකාලික විය නොහැක.

මෙම නීතිය සරල කිරීම සඳහා, මෙසේ පැහැදිලි කරමු. උදාහරණය ලෙස, ඔබේ කාමරයේ උණු වතුර කෝප්පයක් තිබේ නම්, කාමරයේ උෂ්ණත්වය කෝප්පයේ උෂ්ණත්වයට සමාන වන තෙක් තාපය උණු වතුරේ සිට කාමරයේ වායුගෝලයට මාරු කරනු ලැබේ. මෙය, තාප ගති විද්‍යාවේ දෙවන නියමය වන අතර, කාලය ගෙවී යනවිට, ශක්තිය ඉහල සිට පහලට ගලා යයි.

විශ්වයේ ආරම්භයේ සිට සෑම මොහොතකම විශ්වයේ ඇති සෑම දෙයකම මෙම නියමය ක්‍රියාත්මක වන අතර, විශ්වයේ ඇති සෑම දෙයකම උෂ්ණත්වය සමාන වන තෙක් මෙය සිදුවේ. මෙසේ උෂ්ණත්වය සමාන වන විට, එය විශ්වයේ තාප මරණය (Thermal Death of Universe) ලෙස හැඳින්වේ. විශ්වය සදාකාලික නම්, දැනටමත් 'තාප මරණය' නම් නතරවීම සිදුවිය යුතය. නමුත් ඇත්ත වශයෙන්ම විශ්වය දැන් උපරිම එන්ට්‍රොපියට (ප්‍රලය නොහොත් වැනසීමට) වඩා අඩු තත්වයක පවතින අතර තවමත් තාප මරණයට ළඟා වී නැත. එබැවින් එය සදාකාලික නොවේ. නමුත් ඒ වෙනුවට කාලය සහ ස්ථානය සමග මතු වූ ස්ථාවර මූලාරම්භයක් එයට ඇත.

විශ්වය ආරම්භ වූයේ අවම එන්ට්‍රොපියකින් බව, එම නීතියට අනුව සනාථ වී ඇත. එයින් අදහස් කරන්නේ එය පෙර උදාහරණයකින් තොරව - ශූන්‍යයකින් නිර්මාණය සිදුකරනු ඇත යන්නයි.

මෙය එක් පැත්තකින් විද්‍යාත්මක නීතියක් වන අතර, අදේවවාදය සම්පූර්ණයෙන්ම එයට විරුද්ධ පැත්තෙන් පවතී.

## 13- හේතුඵල නීතිය මැවුම්කරුට අදාළ නොවන්නේ ඇයි? වෙනත් වචන වලින් කියනවා නම්: මැවුම්කරු නිර්මාණය කළේ කවුද?

**පිළිතුර: පළමුවැන්න:** ඔහුගේ මැවීම්වල නීති, මැවුම්කරුට අදාළ නොවන අතර, මෙය පැහැදිලි යථාර්ථයකි.

එසේ නැතහොත් අපට මෙසේ පවසන්නට තිබුණි: කෝකියාව පිසුවේ කව්ද?

තීන්ත අලේප කරන්නාට තීන්ත ආලේප කළේ කවුද?

මැවුම්කරු යනු ඔහු කාලය හා ස්ථානය බිහි කළේය. නීති ඇති කළේ ඔහුය. එය පැහැදිලි යථාථර්යකි. නීති ඇති කළ ඔහුට එම නීති අදාළ යැයි පැවසීම සිතාගත නොහැක. ඔහු සුවිශුද්ධය.

**දෙවැන්න:** සිදුවන සෑම දෙයකටම සිදු කරන අයකු සිටිය යුතුය. මෙය සත්යයකි. නමුත් මැවුම්කරු වනාහි, "ඔහු මෙන් කිසිවක් නැත." 42:11 සූරා අෂ්-ෂූරා.

**තෙවනුව:** මැවුම්කරු නව නිමර්ාණයක් නොවේ - ඔහු සදාකාලික ය. - එසේ නම් ඔහුව මැව්වේ කවුදැයි අප විමසනුයේ කෙසේද?

**හතරවනුව:** මැවුම්කරු සදාකාලික විය යුතු අතර පැවැත්ම ද අවශ්ය විය යුතුය. එසේ නොවුවහොත්, “ක්රියාවන් සිදු නොවීම සඳහා අවශ්යයෙන්ම බලපාන ක්රියාකාරීන්ගේ දාමය” යන ගැටලුවට අපි පිවිසෙන්නෙමු. මෙය අපි මීට ටික වේලාවකට පෙර විස්තරාත්මකව පැහැදිලි කළෙමු. එබැවින් මැවුම්කරුට මූලික සදාකාලික පැවැත්මේ අනිවායර්ය භාවය තිබිය යුතුය. ඔහු සුවිශුද්ධිය.

## 14- විශ්වය අති විශාලයි; අපගේ මේ කුඩා ප්රමාණය සහිත අපි, මෙම යෝධ විශ්වයේ කේන්ද්රයක් වන්නේ කෙසේද?

**පිළිතුර:** අදේවවාදියා නිෂ්ඵල උපකල්පනයක් කරමින් මෙසේ කියයි: විශ්වය අතිවිශාල බැවින්, මිනිසා මේ විශ්වයේ කේන්ද්රයක් නොවේ!

මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ ඔහුගේ සිතුවිලි මත ය: ගොවිපළ විශාල වන හෙයින්, එය හා සසඳා බලන විට එහි හිමිකරු ඊට වඩා ඉතා කුඩාය. එහෙයින්, ඔහු අයිතිකරු නොවේ!

ඇත්ත වශයෙන්ම එය කිසිසේත් ප්රමාණය සමග අදාළ වන්නේ නැත.

ශ්රේෂ්ඨතම සහ ඉතා නින්දිත පුද්ගලයන් අතර වෙනසෙහි, සදාචාරය ශ්රේෂ්ඨතම නිණර්ායකය වේ. මෙහි ද්රව්යමය ප්රමාණය අදාල නොවේ.

නියත වශයෙන්ම, මිනිසුන් ඔවුන්ගේ සදාචාරය මත තක්සේරු කරනු ලබති.

එහෙයින්, ප්රමාණය පිළිබඳ ප්රශ්නය, මිණුම් තලයක් නොවේ!

අපි මේ උදාහරණය දෙමු: අපට රජෙක් සිටියා නම්, මේ රජු තම පුත්‍රයාට යම් ආඥාවක් හා අවවාද කර, ඒ ගැන ඔහුට ලිපියක් ලිව්වා නම්, විරුද්ධවාදියෙකුට පැමිණ මෙසේ පැවසිය හැකිද?: අක්කර මිලියන ගණනක් සහ අසීමිත විශාල ඉඩම් ප්‍රමාණයක් හිමි රජෙකු තම පුත්‍රයා රැකබලා ගන්නේ කෙසේද? පුතාගේ ප්‍රමාණය සහ බර මේ රජු සතු ඉඩම් අක්කර ප්‍රමාණයෙන් මිලියනයෙන් පංගුවක් වේ.

තවද, අල්ලාහ් දෙවිඳුන්ට උතුම් පරමාදශර්ය ඇත.

මෙය කිසිසේත්ම සාධාරණ විරෝධයක්ද?

ප්‍රශ්නය ප්‍රමාණය හෝ බර සම්බන්ධව නෝවේ.

එසේ නම්, ලෝකයේ සියලුම භෞතික විද්‍යාඥයන් එකඟවන ආකාරයට, මේ විශ්වය බිහි වී ඇත්තේ, ඉදි කට්ටක අගට වඩා බිලියන වාර ගණනක් කුඩා තරමකින් නොවේද?

එහෙයින්, ප්‍රමාණය යනු සාපේක්ෂ වේ.

එසේ නම්, දෙවිඳුන් අල්ලාහ් තමන් කැමති දේ ඔහු කැමති ආකාරයට නිමර්ාණය කිරීමෙන් අදේවවාදියෙකුට හානියක් වන්නේ කුමක්ද?

අවශ්‍ය තරම් වියදම් කිරීමට දෙවියන්ට සම්පත්හි හිඟයක් තිබේද?

එයින් අල්ලාහ් උත්තරීතර විය.

කෙසේ වෙතත්, අපි ඇත්තටම මේ විශ්වයේ කේන්ද්‍රයක් නියෝජනය කරනවාද?

'ඔව්'. මිනිසා! ඔබ දිව්‍යමය වරම් ලැබීමෙන් මෙම විශ්වයේ කේන්ද්‍රයයි.

මෙම දිව්‍යමය වරම, දහමයි.

දහම යනු ඔබ දරා ඇති විශ්වාසය වන අතර එය ඔබ විසින් ඉටු කළ යුතු ශ්‍රේෂ්ටතම පරීක්ෂණයයි.

අහෝ මිනිස! ඔබ සවර්බලධාරි දෙවිඳුන් වන අල්ලාහ්ට ගැතිකම් කිරීමට අවශ්‍ය වන අතර, ඔබ විශ්වයේ කේන්ද්‍රය වන්නේ එමගිනි. මෙම විශ්වයේ කේන්ද්‍රය ඔබයි. එය ඔබේ ප්‍රමාණයෙන් හෝ බලයෙන් හෝ හැකියාවන්ගෙන් හෝ නොව දිව්‍යමය වරම ලැබීම තුළිනි.

තවද ඔබ යහපත කිරීමටත්, අයහපත අත්හැරීමටත් හැකියාව ඇති අයෙකි. විශ්වාස කිරීමටත් විශ්වාස නොකිරීමටත් හැකියාව ඇති අයෙකි.

අපි කැමති වුවත් නැතත්, එය පවරනු ලැබ ඇතැයි අපි කවුරුත් දනිමු!

අදේවවාදියා, ඇදහිලිවන්තයා, අඥේවාදියා, ඇතුළු සියලු දෙනාම සැබැවින්ම ආගමික වගකීමක් පවරනු ලැබ ඇති බව දනී. දිව්‍යමය වරම ගැන ද ඔවුන් හඟනු ඇත. සදාචාරාත්මක හෘදය සාක්ෂියක් මත පෙළෙන බවත්, "අසවල් දේ නොකරන්න. යහපත කරන්න, සහ නපුර නොකරන්න," යන හැඟීම් තමන් තුළ ඇති බවත් ඔහු දනී. සැබැවින්ම එය අපේක්ෂා කරනබව අපි කවුරුත් දනිමු.

දිව්‍යමය වරම් පැවරීමෙන් අපි මෙම විශ්වයේ කේන්ද්‍රයේ සිටිමු.

එමෙන්ම සංජානනීය සහ ඥානාත්මක වශයෙන් ද අපි මේ විශ්වයේ කේන්ද්‍රයේ සිටිමු. එබැවින් අපි අපේ පැවැත්මේ යථාර්ථයත්, අප අවට ඇති විශ්වයේ යථාර්ථයත් වටහාගෙන, අවබෝධ කරගෙන, අපගේ පැවැත්මේ අර්ථය හොඳින් වටහා ගනිමු.

අපගේ රාජකාරිවලට, භාරකාරත්වයන්ට, පවරනු ලැබූ දේවලට සහ ඒවායේ ප්‍රතිවිපායන්ට වගකිව යුත්තෝ අපමය වෙමු!

ප්‍රවේශමෙන් සකස් වීමේ අසිරිය දන්නා ජීවින් අපි වෙමු, පරිපූර්ණත්වය පිළිබඳ අවබෝධය ඇති ජීවින් අපි වෙමු. තමාට පැවරූ දෙය ඉටු කිරීමට හෝ පැවරූ දෑ ප්‍රතික්ෂේප කිරීමට හෝ සමත් වූවෝ අපි වෙමු. එහෙයින් තෝරා ගැනීමේ පූර්ණ හැකියාව ඇත්තෝ අපි වෙමු. අපට දේවත්ය විශ්වාස කිරීමට හා ප්‍රතික්ෂේප කිරීමට හැකියාව ඇත.

අපි මෙම විශ්වයේ කේන්ද්‍රයෙහි සිටිමු. "නියත වශයෙන්ම අපි (දේව මෙහෙයේ) භාරකාරත්වය අහස්, පොළොව හා කඳු වෙතට ඉදිරිපත් කළෙමු. නමුත් ඒවා එය ඉසිලීමට ප්‍රතික්ෂේප කළේය. තවද එයට ඒවා බිය විය. තවද මිනිසා එය ඉසිලීය. නියත වශයෙන්ම ඔහු අඥානකම් ඇති අපරාධකරුවකු විය." 33:72 සූරා අල්-අහ්සාබ්.

## 15- ඇතැම් අදේවවාදීහු මෙසේ පවසති: ග්‍රහලෝක විශාල ප්‍රමාණයක් දැක ගත හැක. ඒ නිසා සම්භාවිතා න්‍යාය අනුව, ජීවයට සුදුසු ග්‍රහලෝකයක් තිබීම ස්වභාවිකයි... මේ අනුමානය නිවැරදිද?

**පිළිතුර:** බොහෝ ග්‍රහලෝකවල පැවැත්ම සහ පූර්ණත්වය පිළිබඳ සාක්ෂි විවේචනයට ඇති සම්බන්ධය කුමක්ද?

මෙම ප්‍රශ්ණය ප්‍රමුඛ පෙළේ මාතෘකාවක් නොවේ.

සියලු එළවලු, පලතුරු සහ සතුන්ගෙන් පිරුණු වනාන්තරයක මා සිටින බැවින්, වනාන්තරය මැද, රසවත් පිසූ ආහාර බඳුනක්. හදිසියේම මා ඉදිරියේ දිස් විය යුතු බව එයින් අදහස් නොවේ. ගැටළුව අමුද්‍රව්‍ය නොවේ.

එමෙන්ම, ලෝකයේ කාන්තාරවල වැලි බහුලව ඇති බැවින්, වැලි වලින් සාදන ලද ඩිජිටල් ප්‍රොසෙසර් සහ ඉලෙක්ට්‍රොනික චිප්ස්, කාන්තාරයේ මා අවට සෑම ස්ථානයකම ඇති බව ද එයින් අදහස් නොවේ!

ගැටළුව අමුද්‍රව්‍ය නොවේ. ගැටළුව වන්නේ මැවුම හා පරිපූර්ණත්වයයි. (එනම් කරන්නේ කෙසේ ද යන දැනුම Know how).

ග්‍රහලෝක සමූහයක පැවැත්ම තිබුණු පමණින්, එවා පෘථිවිය මෙන් පරිපූර්ණත්වභාවයෙන් යුතුව ඒවා අතර දිස්වීමට ප්‍රමාණවත් වන්නේ නැත.

මෙහිදී ගැටලුව පරිපූර්ණත්වය, මැවීම හා නිමැවුමය. "එය සෑම දෙයකටම පරිපූර්ණත්වයක් ඇති කළ අල්ලාහ්ගේ නිමැයුමකි." 20:88. සූරා අන්-නම්ල්

තවත් බොහෝ ග්‍රහලෝක පැවතීම පෘථිවියේ ජීවය පැවැත්ම කිසිසේත් සාධාරණීකරණය නොකරයි.

වෙනත් ග්‍රහලෝකවල පැවැත්ම ඔබ තුළ පවතින අකුරු බිලියන හතරක ප්‍රවේණි කේතයක් (genetic code) සාධාරණීකරණය නොකරයි, එය ඔබම පවතින්නට පෙර, ඔබේ සියලු ක්‍රියාකාරකම්, අවයව සහ හෝමෝන චමත්කාරී ලෙස පාලනය කරයි!

ජීවය යනු විඥාපන (information) වේ; එය ද්‍රව්‍යයක් (matter) නොවේ.

අදේවවාදියෙකු සහ මා ග්‍රහලෝකයකට ගොස්, එහි සිත් ඇදගන්නාසුළු නිරවද්‍යතාවයකින් ක්‍රියා කරන සංකීර්ණ උපකරණයක් සොයා ගත්තේ නම් සහ එහි ක්‍රියාකාරිත්වය අපට තවමත් නොතේරුණි නම්, අප සිටින ග්‍රහලෝකයේ විශාලත්වය නිසාම මෙම උපාංගයේ නිෂ්පාදකයාව ප්‍රතික්ෂේප කළ හැකිද?

## මා හා අදේවවාදියා මෙම උපකරණය දකින විට, මානසික සහජඥානය අපව පොළඹවන්නේ බලසම්පන්න නිෂ්පාදකයා ගැන පිළිගැනීමටයි.

කවරෙකු මෙම මානසික සහජඥානය ප්‍රතික්ෂේප කරන්නේ ද, ඔහු එම නිෂ්පාදකයාව ප්‍රතික්ෂේප කරයි. ඒහෙයින් එය සඳහා සාධක පෙන්විය යුත්තේ ප්‍රතික්ෂේප කරන්නාය; නිෂ්පාදකයාව පිළිගත් අය නොවේ.

මෙම විස්මිත අලංකාර විශ්වයේ පැවැත්ම ප්‍රතික්ෂේ කරන්නා ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. ඇදහිලිවන්තයා නොවේ!

අඥේයවාදී අදේවවාදියෙකු වන 'කාල් සේගන්' වරක් "Contact - සම්බන්ධතා" නමින් නවකතාවක් ලීවේය. එහි විද්‍යාඥයින් පිටසක්වල බුද්ධිය සොයන ආකාරය ඔහු පවසයි.

එම ප්‍රබන්ධ නවකතාවේ දී, අභ්‍යවකාශයේ සිට එන ප්‍රාථමික සංඛ්‍යාවල දිගු මාලාවක් (series of prime numbers) විද්‍යාඥයන් සොයා ගත්හ. මෙම ආරම්භක අනුක්‍රමය, නිශ්චිත ගණිතමය අගයක්, යම් ආකාරයක පාලනයක් පෙන්නුම් කරන අගයක් වාතර්‍ා කරන නිසා, මෙම පණිවිඩය අප සමඟ සන්නිවේදනය කිරීමට උත්සාහ කරන වෙනත් ශිෂ්ටාචාරයකින් පැමිණෙන බව නිගමනය කිරීමට මෙය ප්‍රමාණවත් මානසික සාක්ෂියක් විය!

විහිළුව නම්, 'කාල් සේගන්' ප්‍රසිද්ධ Agnostic අඥෙයවාදියෙකු වීමයි. නමුත්, කුඩා ලිපියක සංකීණර්ත්වය හා පිළිවෙල යනු, එය නිමර්‍ාණයේ සහ සම්පූණර්ත්වයේ සාක්ෂියක් වන්නේය යන යතාථර්ය ඔහුගේ බුද්ධිය පිළිගනී.

නියත වශයෙන්ම, යෝධ ශිෂ්ටාචාරයක පැවැත්ම, ප්‍රාථමික සංඛ්‍යා මාලාවක් (series of prime numbers) තහවුරු කරයි; එහෙයින් ඔබේ ශරීරය තුළ සෑම සෛලයක් තුළම ඇති අකුරු බිලියන හතරක් ඔබ ආරෝපණය කරන්නේ කෙසේද? ඒවායින් එක් අකුරක් අඩුවුවහොත් මහා විනාශයක් සිදුවනු ඇත. මේ සියලු සම්පූණර්ත්වයන් අතාකරීක අදේවවාදී විකාරයට ඔබ ආරෝපණය කරන්නේ කෙසේද?

මැවුම්කරු පිළිබඳ, එහි අප්‍රකට්‍යන රාමුව තුළ සංසිද්ධිය අප්‍ර නිරූපණය කිරීම වැළැක්වීම සඳහා මඟහැරීම්වලට ආයාචනා කරන කිසිවක් සාධාරණ නොවේ. "අහස්හි හා මහපොළොවේ කුමක් ඇත්තේ දැයි නුඹලා සිතා බලනු. විශ්වාස නොකරන ජනයාට සංඥාවන් හා අවවාදයන් ප්‍රයෝජනවත් නොවනු ඇතැයි (නබි මුහම්මද්!) නුඹ පවසනු." 10:101 සූරා යූනුස්.

## 16- නිත්‍ය එක් මැවුම්කරුවෙකුට වඩා සිටිය නොහැක්කේ ඇයි?

**පිළිතුර:** උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "(අහස හා පොළොව වන) ඒ දෙකෙහි අල්ලාහ් හැර තවත් දෙවියකු සිටියේ නම් ඒ දෙකම අබර්දයට පත්වනු ඇත." 21:22. සූරා අල්-අන්බියා.

අල්ලාහ් සමග තවත් දෙවියකුගේ පැවැත්ම බහුත්වය නියම කරයි. බහුත්ව මදිපාඩුව පෙන්නුම් කරයි.

තවද මැවුම්කරුගේ මදිපාඩුව - සුවිශුද්ධයානන් එය තහනම් කර ඇත- විශ්වයේ අනාරක්ෂිත භාවය සහ එය බිඳවැටීමට හේතු වේ. එය විශ්වයේ දූෂණය පවා අවශ්‍යයෙන් උපදවයි.

මදිපාඩුව ඇති දෙවියන් සමඟ විශ්වයේ පැවැත්මට සහතිකයක් නැත!

"ඒ දෙකෙහි අල්ලාහ් හැර තවත් දෙවියකු සිටියේ නම්, ඒ දෙකම අබර්දයට පත්වනු ඇත. එහෙයින් ඔවුන් වර්ණනා කරන දැයින් (අෂර් හෙවත්) සැබෑ රාජධානියේ හිමිපාණන් වූ අල්ලාහ් සුවිශුද්ධය." 21:22. සූරා අල්-අන්බියා.

මැවුම්කරු සියළු අවශ්‍යතාවයෙන් හා මදිපාඩුවෙන් පිවිතුරුය. මන්ද සුවිශුද්ධයාණන් වන ඔහු පොහොසත්ය. සවර්බලධාරීය.

ඉහත සඳහන් කරුණුවලට මෙයද එකතු කර ගන්න: ඒවා දෙක තුළ දෙවිවරුන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් සිටී නම්, සමගියට වඩා ගැටුම් ඇතිවීමේ අවස්ථා වඩාත් සමීප ය. මන්ද එක් දෙවියෙකුට වඩා වැඩි නම්, බහු අදහස්, බහු අභිමතයන් මෙන්ම බහු අපේක්ෂාවන් යනු අදහස් කෙරේ. එනම් සෑම කෙනෙකුටම අවශ්‍යතාවක් ඇති බවයි. මෙය අහසේ සහ පොළොවේ දූෂණයට හේතු වේ.

**මිනිසාගේ සහජ බුද්ධිය නියත වශයෙන්ම දෙවිඳුන් එක් අයෙකු බව සනාථ කරයි. භෞතික විද්‍යාඥයෙකු හෝ වෙනත් පුද්ගලයෙකු මෙම විශ්වය දෙස බැලුවහොත්, ඔහු එක් මැවුම්කරුවෙකු පමණක් පරිකල්පනය කරනු ඇත, මන්ද මෙය ස්වභාවික සහජ බුද්ධිය වේ.**

## 17- දහම කුමකටද?

**පිළිතුර:** දරුණුම අදේවවාදියෙකු පවා විශ්වාස කරන්නේ සත්‍යය පැවසීම, බොරු කීමට වඩා හොඳ බවයි. එසේ නොවේද?

දරුණුම අදේවවාදියෙකු විශ්වාස කරන්නේ අවංකකම පාවාදීමට වඩා හොඳ බවයි. එසේ නොවේද?

මෙම පද මේ ලෝකයට අයත් නොවේ. භෞතික ලෝකයේ කිසිවක් එහි අර්ථය හෝ එහි අවශ්‍යතාවය සාධාරණීකරණය නොකරයි.

එසේ නම්, සත්‍ය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

අවංකකම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

අපි පරමාණුවේ ගැඹුර විශ්ලේෂණය කරන්නේ නම්, අපි සත්‍ය හෝ බොරුව වැනි අර්ථයන් හඳුනා ගනිමුද?

අපි මන්දාකිණිවල භෞතික විද්‍යාව හෝ හෝමෝනවල රසායන විද්‍යාව නිරීක්ෂණය කරන්නේ නම්, අවංකකම හෝ වංචාව අපට පිළිපැදිය හැකි ද?

මෙම පද මේ භෞතික ලෝකයට අදාල වන්නක් නොවේ.

නමුත් ඒවා සැබෑ නියමයන්ය.

එසේ නම්, ඒවා වැදගත්ම කරුණු අතරින් වේ.

මිනිසාගේ වටිනාකම පදනම් වන්නේ ඔහුගේ සදාචාරය මත මිස ඔහුගේ කායික ප්‍රමාණය, ඔහුගේ පරමාණු ගණන හෝ ඔහුගේ සෛලවල ශක්ති මට්ටම නොවේ.

මිනිසාගේ වටිනාකම, ඔහු තුළ ඇති දිව්‍යමය වරමේ බැඳියාවෙන් මණිනු ලැබේ.

මෙම වටිනාකම, භෞතික ලෝකයෙන් කිසිවක් මිනිසා සමඟ හවුල් වන්නේ නැත.

මෙහි දකින්නට ලැබෙනුයේ ධර්මිෂ්ඨ මිනිසෙකු හා දුෂ්ඨ මිනිසෙකි.

නමුත් ධර්මිෂ්ඨ කන්දක් හෝ දුෂ්ඨ කන්දක් හෝ දකින්නට නැත.

එමෙන්ම විශ්වාසවන්ත ග්‍රහලෝකයක් සහ ද්‍රෝහී ග්‍රහලෝකයක් අපි නොදකිමු.

වටිනාකම ගැන සැලකිලිමත් වන්නේ ද අරමුණ ගැන සැලකිලිමත් වන්නේ ද පැවැත්ම ගැන සැලකිලිමත් වන්නේ ද මිනිසා පමණි.

ඒවා ආගමෙන් පවරනු ලැබූ බව (හා එහි වටිනාකම) තේරුම් ගන්නේ මිනිසුන් සහ ජින්වරුන් පමණි.

සදාචාරයේ අර්ථය දැනගැනීම අප සෑම කෙනෙකු තුළම ඇති දිව්‍යමය වරමෙහි සහජ බුද්ධියේ කොටසක් පමණි.

මේ හේතුවෙන්, ආගම මිනිසාගේ අවබෝධය සඳහා අවශ්‍ය දෙයකි.

සදාචාරයේ අරුත, එය පවතින්නේ ඇයි? සහ එය පිළිපැදීමේ අවශ්‍යතාවය අපට දැනෙන්නේ ඇයි? ද යන්න සාධාරණීකරණය කරන එකම දෙය ආගම පමණි.

සදාචාරයට විශේෂිත ලක්ෂණය ලබා දෙන්නේ ආගම පමණයි.

ආචාර ධර්ම තේරුම් ගත හැක්කේ දේව වරමේ රාමුව තුළ පමණි.

එය මනුෂ්‍ය සංහතියට සහජයෙන්ම ඇත්තේ මන්දැයි දැනගත හැක්කේ ආගම තුළින් පමණි.

ආගම තුළින්, පැවැත්මේ අරමුණ අපි දනිමු, අප පිළිපැදිය යුතු යැයි හැඟෙන සදාචාරය, අප ඒවාට අවනත නොවූවත්, ඒවා දිව්‍ය වරමෙහි කොටසක් බව අපි දනිමු.

එ බැවින්, ආගම මානව අවශ්‍යතාවයකි.

තවද, අපි ජීවත් වනුයේ ඇයිදැ?යි අප දැනගනුයේ ආගම තුළින් පමණි.

මරණයෙන් පසු සිදුවන්නේ කුමක්දැයි අපි දැන ගන්නෙමු.

පැවැත්මේ අර්ථය අපි දැන ගන්නෙමු.

මෙම පැවැත්ම තුළ අපෙන් අවශ්‍ය වන්නේ කුමක්දැ?යි අපි දැන ගන්නෙමු.

මේ අනුව, මානව වගර්යාට අවශ්‍ය (ඔහු නිරත විය යුතු) වඩාත්ම වැදගත් කරුණු දැන ගැනීමට ආගම අනිවාර්යය කරයි.

එබැවින්, ආගම නොමැති නම්, මුළු ලෝකයම සම්පූණර් අන්ධභාවයට හා සම්පූණර් ශූන්‍යභාවයට හැරෙනු ඇත.

ඉබ්නු අල්-කයිම්, (රහිමහුල්ලාහ්) මෙසේ පැවසීය: "රසූල්වරුන්ගේ දැනෙහි හැර මෙලොව හෝ පරලොවෙහි සතුටට හා සාථර්කත්වයට වෙනත් මාගර්යක් නැත. එමෙන්ම යහපත හා අයහපත විස්තරාත්මකව දැන ගැනීමට ඔවුන් තුලින් මිස වෙනත් මාගර්යක් නැත. ඔවුන්ගේ දැතින් මිස දෙවිඳුන්ගේ තෘප්තිය කිසිසේත් ලැබෙන්නේ නැත."(1)

ෂෙයික් අල්-ඉස්ලාම් ඉබ්නු තයිමියා, (රහිමහුල්ලාහ්) පවසන පරිදි: ආගමේ හිරු එළිය සහ පණිවිඩයේ හිරු එළිය උදා නොවූයේ නම් ලෝකය අඳුරට සහ ශාපයට ලක්ව පවතී.(2).

ආගමෙන් තොරව පැවැත්මේ අරමුණ, යහපතෙහි අථර්ය හෝ එහි වටිනාකම හඳුනා ගත නොහැකිය.

දිව්‍ය පණිවිඩ නොමැති නම්, ලෝකය බිය උපදවන විකාරයක් බවට පත් වනු ඇත.

ආගම අතුරුදහන් වූ විට සහ මිනිසුන් වක්තෘ පණිවිඩ ප්‍රතික්ෂේප කරන විට, 'කාල් සේගන්' පවසන පරිදි තරු නාස්තියක් බවටත්, 'සාතර්ර්' පවසන පරිදි කෘමියෙකු බවටත් පත් වනු ඇත.(3)

(1) සාද් අල් මආද් 1-68
(2) මජ්මූඃ අල්-ෆතාවා 19:93,94.
(3) වීඩියෝ මූලාශ්‍රය: The Shores of the Cosmic Ocean කොස්මික් සාගරයේ වෙරළ [Episode 1] Some part of our being, knows this is where we came from. We long to return. And we can. Because the cosmos is also within us. We're made of star-stuff. We are a way for the cosmos to know itself. (අපගේ පැවැත්මේ ඇතැම් කොටස්, අප පැමිණියේ කොහෙන් දැයි දනී. අපි හැරී යෑමට ආශාවෙන් සිටිමු. එය අපිට හැකිය. මක්නිසාද යත් විශ්වය ද අප තුළම පවතින බැවිනි. අපි තරු වලින් සෑදී ඇත. විශ්වයට තමාව දැන ගැනීමට අප මාගර්යකි.) මිනිත්තු 6යි තප්පර 4යි. මිනිසා කෘමියෙකු වීම සම්බන්ධයෙන් සාතර්ර් සිය 'ඔක්කාරය' නම් නවකතාවේ සඳහන් කර ඇත.

ස්ටීවන් හෝකින් පවසන පරිදි: "ඇත්ත වශයෙන්ම, මිනිසා රසායනික අපද්‍රව්‍ය බවට පත් වේ; නැතහොත්, වඩාත් නිවැරදිව, එය රසායනික මංඩි (chemical scum) බවට පත් වේ."(1)

දේව අනාවැකි යනු පැවැත්මේ එකම ස්පන්දනය වන අතර, දේව අනාවැකි නොමැතිව, වඩාත්ම පුදුමාකාර නව නිපැයුම් සහ වඩාත්ම විනෝදජනක ආශාවන් භීෂණය බවට පත්වේ!

ආගමකින් තොරව, ලෝකය එහි සියලු අලංකාරයන් සමඟ බිහිසුණු අවතාර බවට පත්වේ.

අපි මේ ලෝකයේ සිටින්නේ ඇයි? හෝ මරණයෙන් පසු කුමක් සිදු වේද? යනාදී පැවැත්ම පිළිබඳ කවර ප්‍රශ්ණයක් අදේවවාදියෙකුගෙන් ඔබ විමසා සිටියහොත්,

සැබැවින්ම ඔහු ඔබගේ ප්‍රශ්නය වාග්ජාලයෙන් මඟ හරිනු ඇත, නැතහොත් සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද වනු ඇත.

එබැවින් මිනිසාගේ අවබෝධය සහ සදාචාරාත්මක සාරධර්මවල අවශ්‍යතාවය අවබෝධ කර ගැනීම සඳහා, ආගම ස්වභාවික අවශ්‍යතාවයක් වේ. තවද, පැවැත්මේ අර්ථය, පැවැත්මේ අරමුණ සහ දෙවිඳුන්ට වහල්භාවය තහවුරු කිරීම යනාදිය වටහා ගැනීමට එය අත්‍යවශ්‍ය කරුණකි . සාර්ථකත්වය ඇත්තේ එම වහල්භාවය තුළිනි.

## 18- මොළයක හෝ සමාජයක මෙම සදාචාරය නිෂ්පාදනයක් වීම වළක්වන්නේ කුමක් ද?

**පිළිතුර:** මොළය සෑදී ඇත්තේ භෞතික ලෝකයේ ඇති භෞතික සංරචක වලින්මය!

මොළය කෙතරම් සංකීර්ණ වුවත්, භෞතික ව්‍යුහයන්ගේ සංකීර්ණත්වය කුමක් වුවත්, ශුන්‍ය එකතුවෙන් ශුන්‍ය පමණක් නිපදවනු ඇත.

කාරණය හොඳ හෝ නරක නොදන්නේ නම්, මොළය ද දන්නේ නැත!

(1) From an interview with Ken Campbell on Reality on the Rocks: Beyond Our Ken, 1995

මෙහිදී අපි අදේවවාදියාගෙන් මෙසේ විමසමු: සමස්ත භෞතික ලෝකය, සදාචාරාත්මක ව අපක්ෂපාති නම් සහ හොඳ හෝ නරක නොදන්නේ නම්, හොඳ සහ නරක යන සංකල්පය ඇති වූයේ කෙසේද?

දෙවන ප්‍රශ්නය: පෘථිවියේ සියලුම මිනිසුන් සමූල ඝාතනය කිරීමෙන් මොළය වළක්වන්නේ කුමක්ද?

සත්ව කූඩුවල පහත් ජනවාගරීතක්වය ඇතුල් කිරීමෙන් මොළය වළක්වන්නේ කුමක්ද?

Nazi - Action T4 Project - විසින් සිදු කරන ලද ස්වභාවික වරණ ව්‍යාපෘතියේ සිදු වූ පරිදි , ආබාධිත, දුවර්ල සහ පහත් ජාතීන් විනාශ කිරීමෙන් මොළය වළක්වන්නේ කුමක්ද?[1]

ඇත්ත වශයෙන්ම, භෞතික මොළයට ඒ ගැන දෝෂයක් හෝ නිවැරදි කිරීමක් සමඟ පිළිතුරක් දීමට අදාළ නොවන ප්‍රශ්න වේ.

පෘථිවියේ පරමාණු වලින්ම මොළය සෑදී ඇති නිසා එය සම්පූර්ණයෙන්ම සදාචාරාත්මකව අපක්ෂපාතීය.

නියත වශයෙන්ම, මොළය සහ සදාචාරය අතර සමීපව හෝ දුරින් හෝ කිසිම සම්බන්ධයක් නැත.

සමාජය සදාචාරයේ උල්පත යන මතය සම්බන්ධයෙන් ගත් කල, මෙය අමුතු අදහසකි; මන්ද සදාචාරය යනු මිනිසා මිනිසෙකු ලෙස මිස සමාජයක්, සමස්ථ සමාජයක් නොවන බැවිනි.

එපමණක් නොව සමාජය, ද්‍රව්‍යයේ එකම සංඝටක වලින් යුක්ත වන අතර එම නිසා නැවතත් ශුන්‍ය එකතුවෙන් ශුන්‍යය පමණක් නිපදවනු ඇත. එසේනම් සමාජය මුලින්ම ද්‍රව්‍යමය ලෝකයට අයත් නොවන සදාචාරය ඇති කළේ කෙසේද?

මෙය සත්‍ය වන්නේ නම්, සහ සදාචාරය සමාජයේ නිෂ්පාදනයක් ලෙස අප සලකන්නේ නම්, එවිට සමාජය මෙය සදාචාර බව විශ්වාස කරන හේතුවෙන්, නාසිවාදීන් අන් අයව විනාශ කිරීම ද නිවැරදි වනු ඇත.

ලෝකය නාසිවරුන්ට නඩු පැවරීමට තීරණය කරන විට, මෙම තීරණය පදනම් වූයේ සදාචාරය සීමා රහිතය යන්න මිස, සමාජයේ නිෂ්පාදනයක්

(1) https://en.wikipedia.org/wiki/Aktion_T4

නොවන බැවිනි. එසේ නොවුවහොත්, ඔවුන්ට නාසිවාදියාට නඩු පැවරීමට නොහැකි වන අතර, ඔවුන් පළමුව වැරැද්දක් කළ බව ඔවුන්ට වැටහෙන්නේ නැත.

සදාචාරය සමාජයෙන් ස්වාධීන වන බැවින්, යහපත් සමාජය සහ දූෂිත සමාජය යන දෙකේම නිවැරදි දේ නිවැරදිමය.

එමෙන්ම, යහපත් සමාජයේ සහ දූෂිත සමාජයේ, වැරදි දේ වැරදිමය.

මොළයට හා සමාජයෙන් ඔබ්බට ගිය අර්ථයක් සදාචාරයට ඇත.

## 19- පෘථිවියේ ශිෂ්ටාචාරවල එක් දෙවියෙකුට වඩා ඇත; එසේනම්, දෙවිඳුන් අල්ලාහ්ව විශේෂයෙන් විශ්වාස කරන්නේ ඇයි?

**පිළිතුර:** පෘථිවියේ සියලුම ආගම්වල දෙවිඳුන් අල්ලාහ් හැර නැමදුමට සුදුසු වෙනත් දෙවි කෙනෙක් නැත.

සෙසු ආගම් සමඟ අපගේ එකඟ නොවීම නම්, ඔවුන් දෙවියන් වහන්සේ සමඟ කුඩා දෙවිවරුන් ගෙන තිබීමය. උදාහරණ වශයෙන් කිස්ත්රියානි ආගමේ ජේසුස්තුමා සහ ශුද්ධාත්මයාණන්, හින්දු ආගමේ විෂ්ණු, ශිවා සහ බ්රහ්ම ... යනාදී ලෙස ගෙන තිබීමය.

සියලුම ආගම් විශ්වාස කරන්නේ එකම දෙවිඳාණන්ව ය. ඔවුන්ගේ මතය අනුව ඔහු පැවැත්මේ නිර්මාතෘවරයා වේ.

නමුත්, ඔවුන් දෙවිඳුන් අල්ලාහ් සමඟ වෙනත් දෙවිවරුන් නිර්මාණය කරන අතර ඊට වඩා වෙනත් යමක් නැත.

තවද බහුදේවවාදීන්ගේ පිළිම පවා ඔවුන් දෙවිවරුන් ලෙස ගත්තේ නැත. ඔවුන් දෙවිඳුන් මැවුම්කරු බව පමණක් සුළු කොට පිළිගත් නමුත්, ඔවුන් දෙවිඳුන් සඳහා අතරමැදියන් නිර්මාණය කළෝය. "අහස් හා මහපොළොව මවා, හිරු හා සඳු වසඟ කළේ කවුරුන්දැ?යි ඔබ ඔවුන්ගෙන් විමසුවෙහි නම්, අල්ලාහ් යැයි සැබැවින්ම ඔවුහු පවසති. එසේ නම් ඔවුන් වෙනතකට යොමු කරනු ලබනුයේ කෙසේද?" 29:61. සූරා අල්-අන්කබූත්.

ෂෙයික් අල්-ඉස්ලාම් ඉබ්නු තයිමියා, (අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!) මෙසේ පැවසීය: "පිළිම වන්දනා කරන්නන් ගැන සිතා බලන යම් අයකු වේද, සැබැවින්ම ඔවුන් ඒවා ලෝකය නිර්මාණය කරන බවත්, ඒවා වර්ෂාව

ලබා දෙන බවත්, ඒවා ශාක වගා කරන බවත්, සතුන් හා වෙනත් දෑ නිර්මාණය කරන බවත් විශ්වාස කරමින් සිටින බවත් ඔහු සිතුවේ නම් ඔහු ඔවුන් ගැන නොදන්නා අයෙකි. පිළිම වන්දනා කරුවන් මෙම පිළිම වලට නැමදුම් කිරීමේ චේතනාව, සොහොන් අදහන බහුදේවවාදීන්ගේ චේතනාවම වේ."(1)

පිළිම වන්දනා කරන හින්දු ආගමේ මූලාරම්භය, එකම දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය වෙත, අවසානයේ යොමු වන බව, 'විල් ඩුරන්ට්' සහතික කරන අතර, ඔහු හින්දු දෙවිවරුන් ගැන මෙසේ කියයි: "සාන්තවරයන් දහස් ගණනක් විශුද්ධ කිරීමෙන් ක්රිස්තියානි දේවස්ථානය කරන ආකාරයටම මෙම දෙවිවරුන් දහස් ගණනක් මගින් ද කටයුතු සිදු වේ. අනන්ත සංඛ්යාවක් ඇති මේ දෙවිවරුන්ට ඉහළින් උත්තරීතර පරමාධිපත්යය ඇති බව හින්දු බැතිමතා මොහොතකටවත් සිතන්නේ නැත."(2)

බ්රිතාන්ය විසින් ඉන්දියාව ආක්රමණය කළ සමයේ ඉන්දියාවේ බ්රිතාන්ය රජය වෙත ඉදිරිපත් කරන ලද වාතර්ාවේ මෙසේ සඳහන් විය: "පයෙර්ෂණවලදී කමිටුව විසින් එළඹූ සාමාන්ය නිගමනය වන්නේ, ඉන්දියානුවන්ගෙන් අතිමහත් බහුතරයක්, එක් උත්තරීතර දෙවියෙකු කෙරෙහි දැඩි විශ්වාසයක් තබා ඇති බවයි."(3)

පෘථිවියේ පවතින සියලුම ආගම් තුළ දෙවිඳුන් එක් අයෙකි. "තවද අපගේ දෙවියන් හා නුඹලාගේ දෙවියන් එකමය." 29:46. සූරා අල්-අන්කබූත්.

පිළිම සහ මිනිස් දෙවිවරුන්, සැබෑ දෙවිඳුන්ට සමීපවීමේ මැදිහත්කරුවන් මිස අන් කිසිවක් නොවේ. "තවද ඔහු හැර වෙනත් අය ආරක්ෂකයින් ලෙස ගත් අය 'අල්ලාහ් වෙත අප සමීප කරවීමට මිස අපි ඔවුනට නැමදුම් නොකළෙමු (යැයි පවසති)." 39:3. සූරා අස්-සුමර්.

(1) මජ්මූඃ අල්-ෆතාවා වෙළුම 1 පිටුව 359.
(2) ශිෂ්ටාචාරයේ කතාව, Will Durant, Vol. 3, p. 209.
(3) පෙර මූලාශ්රය.

## 20- කෙනෙක් අනවශ්‍ය දෙයක් කරනවා නම්, එය විකාරයක්! දෙවියන් වහන්සේට අපව අවශ්‍ය නැත, එසේනම් ඔහු අපව මැව්වේ ඇයි?

**පි:** අවශ්‍යතාවය, විකාරය සමග ගැලපීම අඥාන අදහසකි.

ඇත්ත වශයෙන්, අවශ්‍යතාවය ගැලපෙන්නේ ප්‍රඥාවෙන් මිස විකාරයෙන් නොවේ.

කීතරීයක් ඇති ධනවත් වෛද්‍යවරයකු, මිනිසුන්ගෙන් කිසිදු බලාපොරොත්තු නොමැතිව, ඔවුනට ප්‍රතිකාර කළ හැකිය. නමුත් ඔහු එසේ ඔවුනට ප්‍රතිකාර කරනුයේ ඔවුන්ගේම ප්‍රයෝජනය සඳහාය. මෙහි අපි ඔහුගේ ක්‍රියාව නිෂ්ඵල දෙයක් ලෙස විස්තර නොකරමු!

ප්‍රඥාව සහ ක්‍රියාව පිටුපස ඇති ඉමහත් අරමුණ, අවශ්‍යතා/විකාර යන චක්‍රය වටා කැරකෙන්නේ නැත!

පිහිනන්නෙකුට දයාවෙන් දරුවෙකු බේරා ගත හැකි අතර, පසුව දරුවාගේ භාරකරුවන්ගෙන් කිසිදු ප්‍රශංසාවක් බලා පොරොත්තු නොවී ඔහු අතහැර දමා යයි. මෙහි ඔහුගේ ක්‍රියාව අවශ්‍යතාවයක් හෝ විකාරයක් ලෙස වර්ගීකරණය කර නැත, නමුත් මෙය ත්‍යාගශීලී ක්‍රියාවකි, උදාර අරමුණකි. යහපත් චරිතයකි!

එහෙයින් අවශ්‍යතාව සහ විකාරය අතර සහන්ධනයක් නොමැත![1]

සහීහ් මුස්ලිම් වාතර්ා කළ හදීස් අල් කුද්සි නම් දිව්‍ය ප්‍රකාශ සහිත නබි වදනක උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: **මාගේ ගැත්තනි! නුඹලාගේ පළමුවැන්නා හා නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා, කිසියම් මිනිසෙකුගේ ධාමර්ික හදවත තරම් වඩාත් බැතිමත් වුවද, එය කිසිසේත් මාගේ ආධිපත්‍යය වැඩි නොකරනු ඇත. එමෙන්ම මාගේ ගැත්තනි!නුඹලාගේ පළමුවැන්නා සහ නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා**

(1) 'නූතන දශර්නය තුළ ආගම විවේචනය කිරීමේ සංසිද්ධිය." ආචාර්. Sultan Al-Amiri, Ph.D. නිබන්ධනය.

**කිසියම් මිනිසෙකුගේ අතිදුෂ්ට හදවත තරම් දුෂ්ට වුවද, එය කිසිම දෙයකින් මාගේ ආධිපත්‍යයෙන් කිසිවක් අඩු නොකරනු ඇත. මාගේ ගැත්තනි! සැබැවින්ම නුඹලාගේ ක්‍රියාවන් වූ කල්හි, ඒවා මම නුඹලා වෙනුවෙන් සටහන් කර තබා ඇත්තෙමි. පසුව නුඹලාට මා ගෙවනුයේ ඒවාට පමණි. එබැවින් කවරෙකු යහපත සොයා ගත්තේ ද ඔහු අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි. ඒ හැර වෙනත් දෙයක් ලැබුණේ ද ඔහු ඔහුටම මිස (අල්ලාහ්ට) දොස් නොපැවරිය යුතුයි.(15)**

අල්ලාහ් සකල ලෝකයන්හි අවශ්‍යතාවන්ගෙන් තොරය.

අපගේ උත්සාහය, කැපවීම හා අපගේ ශ්‍රමය අප වෙනුවෙන් පමණය. "තවද කවරෙකු ( අල්ලාහ්ගේ මාගර්යෙහි) වෙහෙස වන්නේ ද එසේ ඔහු වෙහෙස වනුයේ ඔහු වෙනුවෙනි. නියත වශයෙන්ම අල්ලාහ් ලෝවැසියන්ගෙන් (පිහිට) අවශ්‍ය නැත්තෙකි." 29:6. සූරා අල්-අන්කබූත්.

අපට නිසි අවබෝධයක් නැතත්, දෙවිඳුන්ගේ සෑම මැවීමක් තුළම ප්‍රඥාවක් ඇති බව අපි දනිමු, රෝගියා වෛද්‍යවරයාගේ ප්‍රඥාව ගැන නොදැන සිටීමෙන් වෛද්‍යවරයාගේ තීරණ විකාර සහගත බව අදහස් වන්නේ නැත.

දිව්‍යමය ප්‍රඥාව පිළිබඳ දැනුම ඔහුට ප්‍රඥාවේ සියලු මානයන් තේරුම් ගැනීමට අවශ්‍ය නොවේ, නමුත් ඒවායින් සමහරක් තේරුම් ගැනීමට ප්‍රමාණවත් වේ!

දෙවිඳුන්ට නමස්කාර කිරීම අපට පවරා ඇති බව (නියම කර ඇති බව) දැන ගැනීම සහ දිව්‍ය ප්‍රඥාවේ පැවැත්ම බව දැන ගැනීම ප්‍රමාණවත්ය. මෙය අපට ප්‍රමාණවත් වේ. එසේ නොවුවහොත් අපට පැහැදිලි නොවන සියලු දෑ ප්‍රතික්ෂේප කරන්නෙකු මෙන් අප ද වන්නෙමු. "ඔහුගේ දැනුමෙන් ඔවුන් ග්‍රහණය නොකළ දෑ ඔවුහු බොරු කළෝය. එහි අර්ථ නිරූපණයන් ඔවුන් වෙත පැමිණියේ නැත."10:39 සූරා යූනුස්.

දෙවිඳුන් මහා ප්‍රඥාවන්ත වන අතර යම් ප්‍රඥාවක් වෙනුවෙන් ඔහු අප මවා ඇත. ඔහු සුවිශුද්ධය.

නැමදුම් ලබන්නට සුදුස්සා දෙවිඳුන් අල්ලාහ් පමණය.

දෙවිඳුන් අල්ලාහ් හැර නැමදුම් ලබන්නට වෙනත් කිසිවකු සුදුසුකම් ලබන්නේ නැත. ඔහු ශූන්‍යතාවයෙන් අප බිහි කළ මැවුම්කරුය. සුවිශුද්ධ දෙවිඳුන් මෙසේ පවසයි: "අහෝ ජනයිනි! නුඹලා හා නුඹලාට පෙර සිටි අය මැව්වා වූ නුඹලාගේ පරමාධිපතිට නමදිනු. නුඹලා බිය බැතිමත් විය හැකි වනු පිණිස." 2:21. සූරා අල් බකරා.

තවද අපට මඟ පෙන්වූයේ ඔහුය, එමෙන්ම නීති පනවා, සැළසුම් කොට, නියෝග හා තහනම් නියෝග පැනෙව්වේ ද ඔහුය. "මැවීම හා නියෝගය ඔහු සතුය." 7:54. සූරා අල්-අඃරාෆ්.

දෙවිඳුන්ට මැවිල්ල පමණක් නොව, සියලු කරුණු හා නියෝග ඔහු සතු වන්නේය. ඔහුගේ ආඥාවට අපි අවනත වෙමු.

නැමදුම් කිරීම, අල්ලාහ් තම ගැත්තන් මත නියම කළ වගකීමය. අප අතරින් ධර්මිෂ්ඨ දෑ වඩාත් හොඳින් සිදු කරන්නේ කවුරුන්දැයි අප පරීක්ෂා කරනු පිණිස ඔහු අප මවා; අප ජීවත් කරවා; අපට පෝෂණ සම්පත් ලබා දී; අපට මඟ පෙන්වූයේය. ඔහු සුවිශුද්ධය. එමෙන්ම ඔහු අප වෙත ඔහුගේ දූතවරුන් එව්වේය. නැමදුම් කිරීම අල්ලාහ් අප වෙත පැවරූ අපගේ වගකීමය. "ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. (මන්ද) නුඹලා අතුරින් කවරෙකු ක්‍රියාවෙන් වඩාත් දැහැමි දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය. තවද ඔහු සර්ව බලධාරීය. අතික්ෂමාශීලීය." 67:2 සූරා අල් මුල්ක්.

නැමදුමෙන් තොරව අපගේ මෙලොව ජීවිතය මෙන්ම මතුලොව ජීවිතය නිවැරදිව හැඩ ගැසෙන්නේ නැත. එයින් තොරව අපගේ සදාචාර ගති පැවතුම් නිවැරදි වන්නේ ද නැත. අශීලාචාර හා පිළිකුල් සහගත දැයින් නැමදුම අප වළකාලන්නේය. මිනිස් ලොව එමගින් හැඩ ගැසෙයි. උත්තරීතරයාණන් අපට මෙසේ පවසයි: "තවද සලාතය විධිමත් ව ඉටු කරනු. නියත වශයෙන්ම සලාතය අශික්ෂිත දැයින් හා පිළිකුල් සහගත දැයින් වළක්වයි." 29:45. සූරා අල්-අන්කබූත්.

නැමදුම් කිරීමෙන් තොරව ස්වගර්ය දිනන්නේ නැත. ස්වගර්යේ ජය හා මෙලොවෙහි සුගතිය එයයි.

නැමදුම අප වෙනුවෙන් සහ අපගේ යහපත වෙනුවෙනි. එය සර්වබලධාරී දෙවිඳුන් දෙසින් අප වෙත අනිවාර්ය කළ කරුණකි. එය, ඔහු අපගේ මැවුම්කරු වන බැවිනි. එහි ප්‍රතිලාභය අප වෙතම නැවත හැරී එන අතර එහි සිදු කරන දෝෂ අපටම එරෙහිව පැමිණෙන ඇත.

ස්වගර්ය අනසර්ය. කවරෙකු ස්වගර්ය අපේක්ෂා කරන්නේ ද ඔහු ඒ සඳහා ක්රියා කළ යුතුයි. අපි සුවිශුද්ධයාණන්ගේ අවශ්යතාව ඇත්තො වෙමු. ඔහුට නැමදුම් කිරීමේ අවශ්යතාවද ඇත්තෝ වෙමු. අපගෙන් මෙන්ම ඔහුගේ සියලු මැවීම්වලින් තොර, ඔහු පොහොසත්ය.

## 21- අපි අල්ලාහ් හඳුනා ගන්නේ කෙසේද?

**පිළිතුර:** බොහෝ මාගර්යන් ඔස්සේ අපි අල්ලාහුව හඳුනා ගනිමු. නමුත් මෙහි අපි මාගර් හතරක් සඳහන් කරන්නෙමු.

පළමු මඟ: සහජ බුද්ධිය / ස්වභාවික ධමර්තාව ඔස්සේ අල්ලාහ් හඳුනා ගනිමු.

මිනිසා සහජයෙන්ම තමන්ට මැවුම් කරුවකු සිටින බව හඳුනයි. එහෙයින් ඔබත් සහජ බුද්ධියෙන් ඔබේ මේ ස්වරූපයෙන් මේ අවයන්ගෙන් හා මේ හැඩරුවෙන් ඔබව මැවූ මැවුම්කරුවකු සිටින බව හඳුනන්නෙහිය. මෙය විශ්මිත පරිපූණර් නිමැවුමකි.

තවද, මිනිසා තම සහජ බුද්ධියෙන් තම මැවුම්කරුට නමස්කාර කිරීමට අවශ්ය බව දනී, එමෙන්ම තමාට සියළු මහිමය හිමි තම මැවුම්කරුගේ අවශ්යතාවය උවමනා බවත්, සෑම මොහොතකම ඔහුගේ අවශ්යතාවෙන් පෙළෙන බවත්, ඔහුගේ සහජ බුද්ධියෙන් ඔහු දනී. දුෂ්කර අවස්ථාවන් වලදී දෙවිඳුන්ගේ අවශ්යතාවේ මෙම හැඟීම අධික වනු ඇත.

දෙවිඳුන් පිළිබඳ දැනුමේ ස්වභාවය සියලු මිනිසුන්ට සහජයෙන්ම පිහිටා ඇති බව සවර්බලධාරී අල්ලාහ් මෙසේ පවසා ඇත. "එහෙයින් ඔබ ඔබේ මුහුණ දහම වෙත අවංක ව ස්ථාපිත කරනු. (එය) මිනිසා ඒ මත මැවූ අල්ලාහ්ගේ ස්වභාව ධමර්යයි. අල්ලාහ්ගේ නිමර්ාණයේ කිසිදු වෙනස් කිරීමක් නොමැත. එය ඍජු ධමර්යයි. නමුත් ජනයාගෙන් බහුතරයක් දෙනා එය නොදනිති." 30:30 සූරා අර්-රූම්

තවදුරටත් සුවිශුද්ධ අල්ලාහ් මෙසේ පවසයි: "තවද නුඹගේ පරමාධිපති ආදම්ගේ දරුවන්ගෙන් ඔවුන්ගේ කොදුවලින් ඔවුන්ගේ පරපුර ගෙන, ඔවුනට එරෙහි ව ඔවුන්ම සාක්ෂි දැරීමට පත් කොට, නුඹලාගේ පරමාධිපති මා නොවේ දැ?යි (ඔහු විමසුවේය.) එසේය අපි සාක්ෂි දරමු යැයි ඔවුහු පැවසුවෝය. (එසේ ප්රතිඥාවක් ගනු ලැබුවේ) මළවුන් කෙරෙන්

නැගිටුවනු ලබන දිනයේ 'නියත වශයෙන්ම අපි මේ ගැන අනවධානීන් ව සිටියෙමු යැයි නුඹලා නොපවසනු පිණිසය." 30:172. සූරා අල්-අඃරාෆ්.

අප මැවීමට පෙර, දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම අප තුළ සහජයෙන්ම පිහිටා තිබුණු අතර උන් වහන්සේට නැමදුම් කිරීමේ ස්වභාවය ද අප තුළ සහජයෙන්ම පිහිටා තිබුණි. ඔහු සුවිශුද්ධය. "ඔවුන්ම සාක්ෂි දැරීමට පත් කොට නුඹලාගේ පරමාධිපති මා නොවේ දැයි (ඔහු විමසුවේය.) එසේය අපි සාක්ෂි දරමු යැයි ඔවුහු පැවසුවෝය." සූරා අල් ආරාෆ් 7:172.

බුහාරි හා මුස්ලිම්හි සඳහන් පූවර් සාධක සහිත හදීසයක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ ප්‍රකාශ කළ බව සඳහන් වේ. **"උපදින කිසිවකු හෝ වේවා ඔහු උපදිනුයේ සහජ ස්වභාවය මතමය."(16)**

අප සියලු දෙනා උපත ලැබ ඇත්තේ මෙම සහජ ස්වභාවය මතය. මෙම සහජ ස්වභාවය සත්‍ය වටහා ගන්නට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුටම සත්‍ය සඳහා සාධක ලැබීමටත්, තමන්ට සත්‍යය පැහැදිළි වූ විට එයට යටත් වීමටත් ප්‍රමාණවත් වන්නේය.

තවද මෙම සහජ බුද්ධිය අවිශ්වාසයෙන් සිටින දරුණුතම පුද්ගලයින්ට පවා, විශේෂයෙන් දුෂ්කර කාලවලදී ප්‍රතික්ෂේප කළ නොහැක. සියලු මිනිසුන් දුෂ්කර කාලවලදී දෙවිඳුන්ට තබන සමානයන් අමතක කර දමා, ඔහු වෙතට නැඹුරු වෙති. "නුඹලාට මුහුදෙහි පීඩාවක් ඇති වූ කල්හි ඔහු හැර නුඹලා ඇරයුම් කරන අය මුළා වී යනු ඇත. ඔහු නුඹලා ව මුදවා ගොඩබිම වෙත ගෙන ආ විට නුඹලා පිටුපාන්නෙහුය. තවද මිනිසා මහා ගුණමකුවකු විය." 17:67. සූරා අල්-ඉස්රා.

යම් පුද්ගලයෙක් මහත් පීඩාවකට පත් වී විනාශය අත්විඳින්නේ නම්, එවිට ඔහු දෙවියන් වහන්සේට පමණක් අයැද සිටින අතර, ඔහු තම බහුදේවවාදය අමතක කරනු ඇත. අසීරු කාලවලදී දෙවිඳුන්ට කන්නලව් කිරීමේ මෙම භක්තිය, සෑම මිනිසෙකු තුළම පවතින සාමාන්‍ය බුද්ධියෙන් උද්දීපනය වන්නකි.

ඇමරිකානු ජනාධිපතවරයෙක් වන අයිසන්හවර් දෙවන ලෝක යුද්ධයේ ඇමරිකානු හමුදාවේ හමුදාපති විය. විශාල අනතුරකදී හමුදාව සහජ

බුද්ධියට නැවත පැමිණෙන ආකාරය දැකීමෙන් පසු මෙසේ පවසයි: "යුද අගලෙහි අදේවවාදීන් කිසිවෙක් දකින්නට නැත."[1]

යුද්ධය පවතින අවස්ථාවේ අගල තුළ දෙවියන් ප්‍රතික්ෂේප කරන කිසිවකු දකින්නට නොලැබේ. ඔවුන් සියලු දෙනාම දෙවිඳුන් වෙත නැඹුරු වෙති. මෙය දරුණු අවස්ථාවලදී සෑම මිනිසෙකුම පිළිගන්නා සහජ භාවයේ යථාර්ථයයි.

දෙවියන් දැන ගැනීමේ දෙවන මාගර්ය බුද්ධියයි: අපි දෙවියන් බුද්ධිය තුළින් වටහා ගනිමු.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "කිසිවක් නොමැතිව ඔවුහු මවනු ලැබුවෝ ද එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?" 52:35. (සූරා අත්-තූර්

බුද්ධිමය වශයෙන් මෙහි කරුණු තුනක් උසුලා ඇත. එයට සිව් වැනි කරුණක් නැත:

**පළමුවැන්න: මැවුම්කරුවකුගෙන් තොරව අප මවනු ලැබීම -** (කිසිවක් නොමැතිව ඔවුහු මවනු ලැබුවෝ ද?) එය විය නොහැක්කකි. එසේ නම්, මැවුම්කරුවකු නොමැතිව අප මවනු ලබන්නේ කෙසේද?

**දෙවැන්න: අප විසින් අපව මවා ගැනීමයි.** (එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?) මෙයද සිදුවිය නොහැකි කරුණකි. එසේ නම් මා මවනු ලබන්නට පෙර මා විසින් මා මැවිය හැක්කේ කෙසේද?

එවිට බුද්ධය උසුලන තුන් වැනි කරුණ පවතී. මෙම ශුද්ධ වූ වැකිය ඒ ගැන නිහඬය. එය ප්‍රත්‍යක්ෂයයි. එනම්, සැබැවින්ම අප මැවූ මැවුම් කරුවකු අපට සිටින වගයි.

කීතරීමත් සවර්බලධාරී අල්ලාහ් පිළිබඳව බුද්ධිමය වශයෙන් අපි හඳුනා ගනිමු.

**දෙවියන් ගැන දැන ගැනීමේ තුන්වන මාගර්ය, දෙවියන්ගේ මැවීම් දෙස අවධානය යොමු කර බැලීමයි.**

(1) https://en.wikipedia.org/wiki/There_are_no_atheists_in_ trenches

දෙවියන්ගේ මැවීම් දෙස අවධානය යොමු කර බැලීම සවර්බලධාරී තේජාන්විත දෙවිඳුන්ගේ බලමහිමය ඉදිරියේ අප තබනු ඇත. "පවසනු! අහස්හි හා මහපොළොවේ කුමක් ඇත්තේ දැයි නුඹලා සිතා බලනු. 10:101. සූරා යූනුස්.

දෙවියන්ගේ මැවීම්වල පවතින සියුම් භාවය හා විශ්මිත පරිපූණර්ත්වය දෙස අපි අවධානයෙන් බලන සෑම මොහොතකම, අල්ලාහ් පිළිබඳ දැනුම අපට වධර්නය වනු ඇත.

පැවැත්ම ගැන පෙන්වා දීමේ හා ආරක්ෂාව හා පරිපූණර්ත්වය ගැන පෙන්වා දීමේ දී අප පෙර සඳහන් කර සිටියේ මෙයයි.

## දෙවියන් හඳුනා ගැනීමේ සිව්වන මාගර්ය දහම් දූතයින් හරහා ලබන දැනුමයි.

සවර්බලධාරී තේජාන්විත දෙවිඳුන් අල්ලාහ් පිළබඳ දැන ගැනීමට ඇති වඩාත් ප්රබලම මාගර්ය මෙයයි. එනම්, දහම් දූතවරුන් හා වක්තෘවරුන් හරහා අල්ලාහ් ගැන දැන ගැනීමයි. දහම් දූතවරු අල්ලාහ් පිළිබඳ තොරතුරු දන්වා සිටියහ. එමෙන්ම ඔහුගේ ගුණාංග පිළිබඳ තොරතුරු ද දන්වා සිටියහ. සුවිශුද්ධයාණන් වන ඔහුගේ ස්වභාවය ගැන තොරතුරු ද දන්වා සිටියහ. මෙම නබිවරුන් හරහා දෙවිඳුන් අල්ලාහ්ගේ නාමයන් හා ඔහුගේ ගුණාංග තුළින් අපි ඔහුව හඳුනා ගත්තෙමු. අල්ලාහ්ට අප නැමදුම් කළ යුත්තේ කෙසේ ද? ඔහු වෙත සමීප විය යුත්තේ කෙසේදැ?යි යන්න ද දැන ගත්තෙමු. විනිශ්චය දිනය අල්ලාහ්ගේ දඬුවමින් අපි මිදෙන්නේ කෙසේද? යන්නත් අපි දැන ගත්තෙමු. දහම් දූතවරු අල්ලාහ් නැමදීම සඳහා ජනයාට ඇරයුම් කළහ. වෙනත් වචනයෙන් කියන්නේ නම්, මිනිසා කවර සහජ බුද්ධියක් මත මවා ඇත්තේ ද ඔවුන්ගේ එම සහජ බුද්ධිය වෙත නැවත යොමු වීමටත්, දෙවියන් නියෝග කළ පරිදි ඔහුට නැමදුම් කිරීමටත් ඔවුහු ඇරයුම් කළහ.

එබැවින්, දූතවරු සත්යයේ හා සාථර්කත්වයේ මාගර්ය වෙත ජනයාට මඟ පෙන්වූහ. "එම රසූල් වරුන්ට පසුව කිසිදු සාධකයක් අල්ලාහ්ට එරෙහි ව ජනයාට නොවනු පිණිස, රසූල්වරුන් ශුභාරංචි දන්වන්නන් හා අවවාද කරන්නන් ලෙස එවනු ලැබූහ. තවද අල්ලාහ් සවර් බලධාරීය; සවර් ප්රඥාවන්ත ය." 4:165. සූරා අන්-නිසා.

දහම් දූතවරුන් හා නබිවරුන් අල්ලාහ් පිළිබඳ තොරතුරු දන්වා සිටීම, හා ප්‍රාතිහාර්යයන් මගින් අල්ලාහ් ඔවුන් ශක්තිමත් කර තිබීම, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ්ට එරෙහිව තකර් කිරීම සඳහා කිසිවකුට ඉඩ සලසා දෙන්නේ නැත.

ඔබේ මැවුම්කරුව ඔබ හඳුනා ගත හැකි පරිදි සවර්බලධාරී දෙවිඳුන් ඔබට සහජ බුද්ධිය පිරිනමා ඇත, ඔබට බුද්ධිය පිරිනමා ඇත. ඔහුගේ මැවීම් දෙස බලන්නට දශර්ණය පිරිනමා ඇත. ඔබ වෙනුවෙන් දූතවරු එවා ඇත. එහෙයින් අල්ලාහ් අබියස තකර් කරන්නට ඔබට කිසිවක් ඉතිරිව නැත.

## 22- ආගම් බොහෝමයක් තිබේ. එසේ නම් ඉස්ලාම් කුමක් සඳහාද?

ඉස්ලාමය ආගම් අතර පවතින (ඒවා හා සමාන) ආගම පමණක් නොවේ.

ඉස්ලාමය, එහි ප්‍රතිපත්තිය, පුරාණ යුගයේ සියලු නබිවරුන්ගේ ප්‍රතිපත්තිවලට එකඟ වන්නකි.

ඉස්ලාම් යනු අපගමනය වූ ආගම්වල මාගර්ය නිවැරදි කිරීම සහ පුරාණ කාලයේ විසූ වක්තෘවරුන්ගේ ඒකදේවවාදී විශ්වාසය නැවත ස්ථාපිත කිරීමකි.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "කවර දෙයක් පිළිබඳ ව ඔහු නූහ්ට උපදෙස් දුන්නේ ද, එය නුඹලාට ඔහු දහම්ගත කළේය. ඔබ වෙත දන්වා සිටි දෑ ද, ඉබ්රාහීම් වෙත ද, මූසා වෙත ද, ඊසා වෙත ද අපි කවර දෙයක් උපදෙස් දුන්නේ ද එය ද දහම්ගත කළෙමු. මන්ද නුඹලා දහම ඍජු ලෙස ස්ථාපිත කොට, එහි නුඹලා වෙන් ව නොයෑම සඳහාය. ඔබ කවර දෙයක් වෙත ඔවුන්ට ඇරයුම් කරන්නේ ද එය ආදේශකයින්ට බැරෑරුම් විය. තමන් අභිමත කරන අය අල්ලාහ් ඔහු වෙත තෝරා ගනී. තවද (පසුතැවිලි වී) හැරෙන අයට ඔහු වෙතට ඔහු මග පෙන්වයි." 42:13 සූරා අෂ්-ෂූරා.

නියත වශයෙන්ම, ඉස්ලාම් යනු අනෙකුත් ආගම් මෙන් ආගමක් නොවන නමුත් සියලු ආගම්වල මූලාරම්භය එයයි.

## 23- ඉස්ලාම් යනු කුමක් ද?

**පිළිතුර:** උත්තරීතර දෙවිඳුන් අල්ලාහ්ට යටත් වීම, කීකරු වීම හා අවනත වීම ඉස්ලාම් ය.

තේජාන්විත දෙවිඳුන් මෙසේ ප්‍රකාශ කළේය: "දැහැමියකුව සිට තම මුහුණ අල්ලාහ් වෙතට අවනත කරවා ඉබ්රාහීම්ගේ පිළිවෙත අවංක ව පිළිපදින්නෙකුට වඩා දහමින් ඉතා අලංකාර වන්නේ කවරෙකු ද? අල්ලාහ් ඉබ්රාහීම් ව මිතුරෙකු බවට ගත්තේය." 4:125 සූරා අන්-නිසා.

"තම මුහුණ අල්ලාහ් වෙතට අවනත කරවා" යන්නෙහි තේරුම අල්ලාහ්ට යටහත් පහත් භාවය පෙන්වා, උත්තරීතරයාණන්ට අවනත වීමය. අපගේ පරමාධිපතියාණන් අති පාරිශුද්ධය. දහමින් වඩාත් යහපත්ම ජනයා එවැන්නෝ වෙති.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "එහෙයින් නුඹලාගේ දෙවිඳුන් එකම දෙවිඳුන්ය. එහෙයින් නුඹලා ඔහුට අවනත වනු. තවද යටහත් පහත්වූවනට (නබිවරය) නුඹ ශුභාරංචි දන්වනු." (22:34) සූරා අල්-හජ්.

"එහෙයින් නුඹලා ඔහුට අවනත වනු" යන්නෙහි තේරුම: ඔහුගේ නීතියට කීකරු වනු යන්නයි.

මෙම පාඨ පෙන්වා දෙනුයේ: ඉස්ලාමය යන්නෙහි අර්ථය පොදුවේ උත්තරීතර අල්ලාහ්ට යටහත් වීම හා තේජාන්විත ඔහුට කීකරු වීමය. එමෙන්ම ඔහුගේ නීතිය හා පිළිවෙත පිළිගනිමින්, ඒවා ගැන තෘප්තිමත් වෙමින්, ඒවා අනුගමනය කිරීමය. ඉස්ලාමයේ සාරය හා එහි යථාර්ථය මෙයයි.

## ඉස්ලාමය යනු දෙවිඳුන්ගේ තීන්දුවෙහි හා ඔහුගේ පිළිවෙතෙහි ඔහුට යටහත් පහත්භාවය දැක්වීමයි.

ඉස්ලාමය යනු සමස්ත මිනිස් සංහතිය සඳහා වූ අල්ලාහ්ගේ දහමයි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "සැබැවින්ම අල්ලාහ් අබියස වන දහම ඉස්ලාමයයි." 3:19. සූරා ආලු ඉම්රාන්

ඉස්ලාමය යනු, එය හැර වෙනත් කිසිදු දහමක් දෙවිඳුන් විසින් පිළිගනු ලබන්නේ නැති දහමයි. "කවරෙකු ඉස්ලාමය හැර වෙනත් දහමක් සොයන්නේ ද, එවිට ඔහුගෙන් කිසිවක් පිළිගනු නොලබන්නේ ම ය. තවද ඔහු මතු ලොවෙහි අලාභ වන්තයින් අතුරින් කෙනෙකි." 3:85 සූරා ආලු ඉම්රාන්

ඉස්ලාමය යනු : සියලුම වක්තෘවරුන් හා දූතවරුන් කවර දහමක් සමග අල්ලාහ් එව්වේ ද එම දහමමය. එහෙයින් වක්තෘවරුන්ගේ දහම එකයි. එය ඉස්ලාමයයි. සියලුම වක්තෘවරුන් පැමිණියේ, ඔවුනොවුන්ගේ පිළිවෙත් වෙනස් වුවද, ඒකදේවවාදී ප්‍රතිපත්තිය සමගය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "නියත වශයෙන්ම මා හැර වෙනත් දෙවියකු නොමැත. එහෙයින් නුඹලා මටම වන්දනාමානය කරනු' යැයි ඔහු වෙත දේව පණිවිඩ දන්වා සිටීමෙන් මිස නුඹට පෙර කිසිදු ධර්ම දූතයකු අපි නොඑව්වෙමු." 21:25 සූරා අල්-අන්බියා.

මෙම ඒකදේවවාදය මත ඉස්ලාම් හැර වෙනත් ආගමක් ඉතිරිව නැත.

අද මිහිතලය මත ඇති එකම ඒකදේවවාදී දහම ඉස්ලාම් දහමයි.

අනෙකුත් ආගමික නීතිවලට බැඳී සිටින සියලුම බැතිමතුන් අඩු වැඩි වශයෙන් දේවත්වයට ආදේශ කිරීමේ යම් කොටසක් ලබා ඇත. නබිවරුන්ගේ මරණයෙන් පසු ජනයා ඒකීයවාදය මත ඔවුන් අත්හැර ගිය ද, කාලයාගේ ඇවෑමෙන් දෙවියන්ට ආදේශිත ඇදහිලි පිළිපදින්නට ගත්තෝය. වතර්මානයේ ඉස්ලාමය හැර, නබිවරුන් ගෙන ආ, එම පිරිසිදු ඒකදේවවාදය මත පදනම් වූ වෙනත් කිසිදු දහමක් ඉතිරිව නැත.

## 24- පිළිතුරු දීමේදී මනස ව්‍යාකූල කරන ප්‍රශ්නවලට ඉස්ලාමයේ පිළිතුරු තිබේද? එනම්: අප පැමිණියේ කොහෙන්ද? ඇයි අපි මේ ලෝකේ ඉන්නේ? සහ අවසන් ගමන කොතැනට ද?

**පිළිතුර:** ඉස්ලාම් මේ සියලු ප්‍රශ්න වලට උත්තර දුන්නේ උතුම් අල් කුආර්නයේ එක් වාක්‍යයකින්, අපගේ ශුද්ධොත්තම පරමාධිපතියාණන් මෙසේ පවසයි: "මා මැවූ ඔහුට මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද? තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය." 36:22. සූරා යාසීන්.

ඔබ කොතැනක සිට පැමිණියෙහි ද? අල්ලාහ් මා මැව්වේය. (ඔහු මා බිහි කළේය.)

මා යන්නේ කොයිබට ද? මාගේ ක්රියාවන් සඳහා මා විභාග කරනු ලබන පිණිස, මම අල්ලාහ් වෙත යමි "නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය."

මෙලොවට ඔබ පැමිණියේ ඇයි? අල්ලාහ්ට නැමදුම් කිරීම සඳහා හා පරීක්ෂාවට ලක් කරනු ලැබීම සඳහාය.

මම අල්ලාහ්ව නැමදිය යුත්තේ ඇයි? මා මැවූ දෙවිඳුන් අල්ලාහ්ට මා නැමදුම් කිරීම සහජ ධමර්තාවකි. මෙම සහජ ධමර්තාව ගැත්තා හා ඔහුගේ දෙවිඳුන් අතර පවතින සම්බන්ධතාවයයි. එනම් ගැත්තා ඔහුගේ පරමාධිපතිට - ඔහුගේ මැවුම්කරුට ඔහු නැමදුම් කිරීමය.

“මා මැවූ ඔහුට මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද?" මිනිසා ප්රහේලිකාවක් බවට පත් කරගෙන ඇති මෙම අතිවැදගත් ප්රශ්ණ තුනට, පිළිතුරු එකට ගොනු කර එකම පාඨයකින් ඉදිරිපත් කර ඇත. “මා මැවූ ඔහුට, මා ගැතිකම් නොකර සිටීමට මට කුමක්වීද? තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය.” 36:22. සූරා යාසීන්.

## 25- මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් දෙවිඳුන් අල්ලාහ්ගේ සංදේශකරුවෙකු බව ඔබ දැනගත්තේ කෙසේද?

**පිළිතුර:** ප්රාතිහායර්යන් පෙන්නුම් කරන සාක්ෂි බහුල වීමෙන් සදාචාරාත්මක අඛණ්ඩතාවය සහ පූර්ණ නිශ්චිතභාවය පෙන්නුම් කරයි.

ඇරිස්ටෝටල් දාශර්නිකයෙකු වන්නේ ඔහුගේ කෘතිවල එකතුවෙන් මිස ඔහු පැවසූ වාක්යයකින් හෝ ඔහු කළ දාශර්නික විශ්ලේෂණයකින් නොවේ.

හිපොක්රටීස් වෛද්යවරයකු වන්නේ ඔහුගේ වෛද්ය ව්යාපෘතිවල එකතුවෙන් මිස ඔහු කළ සැත්කමකින් නොවේ.

එලෙසම, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙතින් සම්ප්රේෂණය වූ ප්රාතිහායර්යන්වල සාක්ෂි රාශියකින් පෙන්නුම් කරන්නේ සදාචාරාත්මක අඛණ්ඩතාව සහ ඔහු අනාගත වක්තෘවරයෙකු බවට වූ පූර්ණ සහතිකයයි.

ඔබ ඔහුගේ චරිතාපදානය දෙස බැලුවහොත්, (ඔහු කෙරෙහි දෙවියන්ගේ ආශිවර්ාදය හා සාමය ලැබේවා) ඔහු සත්යවාදී බව ඔබට පෙනී යනු ඇත. ඔහුගේ වඩාත්ම සතුරු මිනිසුන්ගේ පිළිගැනීමෙන් ඔහු සත්යවාදී යැයි ප්රසිද්ධ විය. බොරු කාරයකු ලෙස හෝ දූෂ්ඨයකු ලෙස හෝ චෝදනා කරනු නොලැබීය. ඔහු අදෘශ්යමාන දේ ගැන දන්වා එය එලෙසම සිදු වේ. ඔහුගේ පැමිණීම ගැන, ඔහු පැමිණීමට වසර සිය ගණනකට පෙර වක්තෘවරුන් ශුභාරංචි දන්වා සිටි තැනැත්තෙකි. මේ සියල්ල පෙන්නුම් කරනුයේ සදාචාරාත්මක අඛණ්ඩතාව හා දිව්ය පණිවිඩයේ නිරවද්යතාව පූර්ණ ලෙස සහතික කිරීමය.

ඔහු ගෙනා ආ උතුම් ප්රතාහායර්ය, එනම් ශුද්ධ අල්-කුආර්නය ගැන කවර කතාද?

අල් කුආර්නය සමබන්ධයෙන්, ඒ හා සමානයක් හෝ ඉන් එක් පරිච්ඡෙදයක් හෝ ගෙන එන මෙන් අල්ලාහ් ශාස්ත්රවේදීන්ට අභියෝග කළේය. නමුත් ඔවුහු එය සිදු කළේ නැත.

තේජාන්විත සවර්බලධාරී දෙවිඳුන් අල්ලාහ් මෙසේ පැවසීය. "නමුත් නුඹලා (එසේ) නොකළෙහු නම්, නුඹලා විසින් (මෙය) කිසිසේත් ම කළ නොහැකිය." 2:24. සූරා අල් බකරා

ඔවුහු එය නොකළෝය. එමෙන්ම ඒ සඳහා ඔවුනට හැකියාවක් නොවීය.

උතුම් අල් කුආර්නය, බහුදේවවාදීන්ගේ සහ චතුර කථිකයින්ගේ වාචාලකමට දිගින් දිගටම අභියෝග කළේය. මේ සෑම අවස්ථාවකම එයට විරුද්ධ වීමට ඔවුහු මැලි වූ අතර, ඒ හා සමාන දෙයක් ගෙන ඒමට ඔවුහු පැකිළුණෝය. (අභියෝගය හකුලුවාගත්තෝය.)

ආචාර්ය අබ්දුල්ලා ඩිරාස්, (දෙවිඳුන් ඔහුට අනුකම්පා කරත්වා) මෙසේ පවසයි: "මෙම අභියෝගය ඔවුන්ගේ සාහිත්‍යයම උද්යෝගය අවුස්සනු ඇතැයි රසූල්වරයා (සල්ලල්ලාහු අලෛයිහි සල්ලම්) බිය නොවූයේද?

ඔවුන් ඔහු සමග තරඟ කිරීමට සැරසෙති. නමුත්, ඔවුන් සියලු දෙනාම එයින් වැළකී සිටියෝය. ඔවුන්ගේ වාග්චාතුර්‍ය ඇති පිරිසක් එයට සමාන හෝ ඉන් එක් කොටසක් වුව ද ප්‍රකාශනයක් නිකුත් කිරීමට ගිවිස ගත්තේ නම් කුමක් සිදු වන්නට ඇත් ද?

එවිට ඔහුගේ සිත ඔහුගේ කාලයේ මිනිසුන්ට මෙම තීන්දුව නිකුත් කිරීමට ඔහුට බල කර තිබුණේ නම්, ඔහු එය අනාගත පරම්පරාවට ලබා දෙන්නේ කෙසේද?

තීන්දු කටයුතු හා ඉරනම පිළිබඳ හොඳින් දන්නා අය හැර තමන්ගේ ප්‍රමාණය පිළිබඳ දන්නා වෙනත් කිසිවකු ඒ සඳහා ඉදිරියට නොඑන ක්‍රමයකි එය. එබැවින් ඔහු එය ලෝකයා අතරට හෙළීය. එය අවසාන විනිශ්චය විය. යුග ගණනාවක් පුරාවට ඊට විරුද්ධ වූ සියල්ලෝම පැහැදිලිවම අසරණ භාවයට සහ දරුණු අසාර්ථකත්වයට පත් වූවෝය."(1)

අල්ලාහ්ගේ දූතයාණන්ට එරෙහිව සටන් කිරීම සඳහා හමුදාවන් එක්රැස් කිරීම සහ කණ්ඩායම් එක්රැස් කිරීම අල්-කුආර්නයට විරුද්ධ වීමට සහ අභියෝගය භාර ගැනීමට වඩා පහසු සහ ලෙහෙසි කාය‍ර්යක් බව මෙම බහුදේවවාදීහු දුටුවෝය. "මෙම කුආර්නයට සවන් නොදෙනු. (එය පාරායනය කරනු ලබන විට ශබ්ද නගා කෑ කෝ ගසමින්) එහි කුකුසක් ඇති

(1) අබ්දුල්ලාහ් දිරාස්ගේ 'අන්-නබඋල් අළීම්' පිටු 44,45.

කරනු. (එවිට) නුඹලා අබිබවා යා හැකිය" යැයි ප්‍රතික්ෂේප කළවුන් පැවසීය." 41:26. සූරා ෆුස්සිලත්.

සමස්ත අරාබිවරුන් හෝ අභියෝගය දැනුම් දෙනු ලැබූ වෙනත් සමූහයන් හෝ, අදේවවාදීන්ට පහසු වන අයුරින් සෙස්සන් සතුටු වන අයුරින් කිසිවක් ගෙන ආවේ නැත.

අල්-ආලූසි (අල්ලාහ් ඔහුට ආශිර්වාද කරත්වා) තුමා මෙසේ පවසයි: "ඔවුන්ගෙන් කිසිවෙකු හෝ අද දක්වා විස්තරයක් ගැන හෝ ගුණාංගයක් ගැන හෝ ඒ ගැන කතා කර හෝ ප්‍රකාශ කර හෝ නැත."

තවම ඉස්ලාමය පිළිනොගත් ජුබයිර් ඉබ්නු මුත්ඉම් මෙසේ පැවසීය: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මග්රිබ් සලාතයේ සූරා තූර් පාරායනය කරනු මට ඇසුණි. එතුමා මෙම වැකිය පාරායනා කළහ. "නැත්නම් කිසිවක් නොමැති ව ඔවුන් මවනු ලැබුවෝ ද? එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?" 52:35 "නැත්නම් ඔවුහු අහස් හා මහපොළොව මැව්වෝද? එසේ නොවේ, ඔවුහු විශ්වාස නොකරති." 52:36 "එසේ නැත්නම් ඔවුන් අබියස නුඹගේ පරමාධිපතිගේ නිදානයන් තිබේ ද? එසේ නැත්නම් (ඒ මත) ආධිපත්‍යය දරන්නෝ ඔවුහු ද?" 52:37 සූරා අත්-තූර්.

(ජුබෙයිර්)මෙසේ පැවසීය: (මෙය සවන්ග දුන් විගස) "මාගේ සිත පියාසර කරන්නට විය"(19)

අල්-කුආර්නයේ මිනිස් ආත්මයට ළඟා වන විශ්මයජනක රහස් තිබේ.

අබූ බකර් තුමා අල්-කුආර්නය පාරායනය කරන විට එය බහුදේවවාද කාන්තාවන් තුළ ඇති කළ ආකශර්ණය හා බලපෑම හේතුවෙන් එම කාන්තාවන් එතුමාගේ නිවස වටා රොක් වූ ආකාරය ගැන සිතා බලන්න. එය කුරෙයිෂි පිරිමින් බියට පත්වන තරමටම විය.(20)

එබැවින් "අල් කුආර්නයට සවන් නොදිය යුතුය, ඔවුන්ගේ පවුල්වලට එය ඇහුම්කන් දෙන්නට ඉඩ නොතැතබිය යුතුය" යන්නට අරාබි කාෆිර් නියෝජිතයින් එකඟ වූවෝය. එය ප්‍රතික්ෂේපයේ රැඳී සිටීමට ඇති එකම මාගර් විය.

විවිධ කාලවලදී අල් කුආර්නයේ පාඨ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ආචායර්. අබ්දුල්ලා දිරාස් පැවසූ කරුණු ද උතුම් අල් කුආර්නයේ

ආශ්චර්යයන් සහ අවසන් නොවන අරුමපුදුම දෑ අතරට ඇතුළත් වේ. නබිතුමාණන්, අල් කුර්ආනයේ ඇතැම් පාඨ පරිච්ඡේදයන් අතර නිශ්චිත ස්ථානවල ස්ථානගත කිරීම හා තවත් පාඨ වෙනත් පරිච්ඡේදයන් අතර ස්ථාන ගත කිරීම ගැනත්, පසුව අවසානයේ සෑම සූරතයක්ම ස්වාධීන ව්‍යුහයක් ලෙස දිස් වීම ගැනත් පෙන්වා දෙයි. ඔහු පවසන්නේ "අල්-කුර්ආනය පහළ වන අවස්ථාවේදී අල්-කුර්ආනයේ ඇතැම් මාතෘකා වෙනත් මාතෘකා වලින් හුදකලා වෙමින්, වැඩිවෙමින් පැවතුණු අතර ශුද්ධාත්මය වන ජිබ්රීල් නබි තුමාණන්ව හමු වූ අවස්ථාවේ එතුමාණන්ගේ නියෝගයට අනුව පහළ වූ පාඨවලින් පසුව වෙනත් පාඨ පහළ වීමෙන් අනතුරුව, පිළිවෙලින් ස්වාධීන ඒකකයක් ලෙස ඒවා පිහිටිය. ඒවායින් සමහරක් අදාළ සූරාවට එකතු කර ඇති අතර තවත් ඒවා වෙනත් සූරාවන්ට ඇතුළත් කර ඇති බවයි.

ගණන් කළ නොහැකි දිනයන් - උතුම් අල් කුර්ආනයේ වාක්‍ය පහළ වූ දිනයන් - අපි සැලකිල්ලට ගන්නේ නම්, සහ මෙම හෙළිදරව්ව විශේෂ අවස්ථා සහ කරුණු සමග බැඳුණු පොදු ක්‍රමයකින් පිහිටා ඇති බව දකින්නේ නම්, සෑම සූරතයක්ම ස්වාධීන ඒකකයක් ලෙස පෙළ ගැස්වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ කාලය පිළිබඳ ප්‍රශ්ණ කිරීමට එය අප ඇරයුම් කරනු ඇත.

අල්-කුර්ආනය පුරාණ ගොඩනැඟිල්ලක කැබලි විසිරී ගොස් අංකනය කර ඇති ආකාරයටම, එය පෙර තිබූ ආකාරයටම වෙනත් තැනක නැවත ගොඩ නැගීමට අදහස් කරන ලදී; එසේ නොමැති නම්, සූරාවන් බොහෝමයක් හා බැඳුණු මෙම ක්‍රමානුකූල හා ක්ෂණික වැඩපිළිවෙළ, එකවරම පැහැදිලි කළ හැක්කේ කෙසේද?

නමුත් අනාගත සිදුවීම්, ඒවායේ ව්‍යවස්ථාදායක අවශ්‍යතා සහ ඒවාට අවශ්‍ය විසඳුම් මෙන්ම මෙම විසඳුම් ඉදිරිපත් කළ යුතු භාෂාමය ස්වරූපය සහ ඒ වෙනුවට මෙම සූරතය සමඟ ඒවායේ ශෛලීය අනුකූලතාව සම්බන්ධයෙන් එවැනි සැලැස්මක් සකස් කිරීමේදී, පුද්ගලයෙකුට ලබා ගත හැකි ඓතිහාසික සහතිකය කුමක්ද?

මෙම සැලැස්ම සම්පූර්ණ කිරීම සහ එය අපේක්ෂිත ආකාරයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා, මෙම අපේක්ෂිත සම්බන්ධීකරණය ස්ථාපිත

කිරීමට හැකියාව ඇති ශ්‍රේෂ්ඨ නිමර්‍ාණකරුවෙකුගේ මැදිහත්වීම අවශ්‍ය බව අපි නිගමනය කළ යුතු නොවේද?"(1)

නියත වශයෙන්ම, මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ වක්තෘත්වයේ නිරවද්‍යතාව පෙන්වා දෙන ස්වාධීන වූ ආශ්චයර්යකි අල්-කුආර්නය.

තවද, එතුමා(සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්)ගේ අතින් සිදු වූ ප්‍රාතිහායර්යන් බොහෝය. දහසකට වඩා අධිකය. ඒවා සිදුවී වැඩි කාලයක් පසුවුයේ නැත. ඒවා වාතර්ා කළ අය මැවීම් අතරින් වාඩාත් සත්‍ය හා වඩාත් ධමර්ිෂ්ඨ අය වේ.

තවද සිදුවුණු දෑ සම්බන්ධයෙන්, මෙම ප්‍රාතිහායර්යන් අප වෙත සම්ප්‍රේෂණය කළ මෙම වාතර්ාකරුවන්ට බොරු කීමට අවසර නොතිබුණි, ඔවුන් ඒ ගැන බොරු කිව හැක්කේ කෙසේද? නබි තුමාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) අවවාද කර ඇති පරිදි එතුමා ගැන කවුරුන් හෝ හිතාමතාම බොරු කීවේ නම්, හෙතෙම නිරා ගින්නෙහි තැනක් ලබා ගනු ඇත යන වග ඔවුහු දනිති.

වක්තෘවරයා (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමා)ගේ සමහර ප්‍රාතිහායර්යන්, අනුගාමිකයින් දහස් ගණනක් දෙනා දැක ඇති අතර, සමහර ඒවා දස දෙනෙකුගෙන් සමන්විත වාතර්ා පෙළ විසින් වාතර්ා කරන ඇත. එසේ නම් මේ සියලු කරුණුවලදී ඔවුන් බොරු කීමට එකඟ වන්නේ කෙසේද?

විශාල පිරිසක් සහභාගී වූ, එතුමාගේ ප්‍රාතිහායර්යන් පිළිබඳ උදාහරණයක් මෙසේය: 'ලී කඳ දුක්වීම' ගැන හදීසය, එය ප්‍රසිද්ධ සහ මුතවාතිර් සනයේ හදීසයකි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ලී කඳක් මතට වී දේශනා කරන්නෙකු වූහ. පසුව එතුමා වෙනුවෙන් 'මින්බර්' හෙවත් ධමර්ාසනය සාදා, ඒ මතට වී එතුමා දේශනා කළ විට කඳ වැළපෙන්නට විය. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් එය වැළඳ ගන්නා තෙක්ම දරුවකු කෙඳිරිගාන්නාක් මෙන් එය දිගටම විලාප දෙන්නට විය. පසුව නිහඬ විය.

(1) ශුද්ධ අල් කුආර්න්ට පිවිසුමක් නම් කෘතිය. ආචායර් අබ්දුල්ලා දිරාස්.

මෙම හදීසය සහාබාවරුන් කිහිප දෙනෙකු විසින්ම වාතර්ා කර ඇත: අනස් ඉබ්නු මාලික්, ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ්, අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස්, අබ්දුල්ලාහ් ඉබ්නු උමර්, උබෙයි ඉබ්නු කඃබ්, අබූ සර්ද්, සහ්ල් ඉබ්නු සඃද්, ආඉෂා බින්ත් අබී බක්ර් සහ උම්මු සලමා. (රළියල්ලාහු අන්හුමා)

එවැනි සහගාමීන් පිරිසක් මෙවැනි ප්රවෘත්ති ප්රකාශ කිරීමේදී බොරුව මත ඒකමතිකව කටයුතු කර තිබේද?

සහබාවරුන් දහසක් දෙනා දුටු එතුමාගේ ඇතැම් ප්රාතිහායර්යන් අතරින් එතුමාගේ ගෞරවනීය ඇඟිලි තුඩු අතරින් ජලය ඒම. එය මගින් සහගාමීන් එක්දහස් පන්සීයක් පමණ දෙනා වුළු ධෝවනය කර, පානය කරන තරමටම විය. මෙය මුතවාතිර් හදීස් ගණයට අයත් අතර බුහාරි හා මුස්ලිම් විසින් එය වාතර්ා කොට ඇත.

විශාල සේනාවන් අනුභව කළ හැකි තරමට සුළු ආහාර ප්රමාණයක් අධික ලෙස වධර්නය වීම; මෙය සහාබවාරුන් විසින් මුතවාතිර් ක්රමයට දැනුම් දෙනු ලැබූ හදීසයකි. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ අතින්, ආහාර අභිවෘද්ධියට පත් වීමේ ප්රාතිහායර්ය බුහාරි තුමා පමණක් එතුමාගේ සහීහ් ග්රන්ථයේ ස්ථාන පහක සඳහන් කර ඇත.(1)

සත්යවාදී බව පිළිබඳ සාක්ෂි ස්ථිර නම් සහ එතුමාගේ වක්තෘත්වය සම්බන්ධයෙන් ඇති ප්රාතිහායර්යන් බහුලව තිබේ නම්, සිහිබුද්ධිය ඇති පුද්ගලයෙකු මේ සියල්ල ප්රතික්ෂේප කරනුයේ කෙසේද?

එතුමා (සල්ලලාහු අලෙයිහි වසල්ලම්)ගේ ආශ්වයර්යන් පිළිබඳ තවත් උදාහරණ කිහිපයක් මෙසේය.

එක් රාත්රියක තද සුළඟක් හමන බවට එතුමාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පැවසූ අතර, මිනිසුන්ට නැගිටීම එතුමා තහනම් කළහ. නමුත් එක් මිනිසෙක් නැගිට සිටි අතර සුළඟ ඔහුව රැගෙන ගොස් ඔහු සිටි ස්ථානයෙන් දුර ස්ථානයකට විසි කළේය.(2)

(1) බුහාරි: 1217, බුහාරි: 2618, බුහාරි: 3578, බුහාරි:4101, බුහාරි :6452. මේ සියල්ල විවිධ අවස්ථාවල සිදු වූ සිදුවීම් හා කරුණුය. මෙය බුහාරියේ පමණක් සඳහන් වූ දැය.
(2) සහීහ් මුස්ලිම්, හදීස් අංක: 3319

නජ්ජාසි රජු (අප්රිකාවේ) මිය ගිය දවසේම ඔහුගේ මරණය පිළිබඳ සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ දන්වා, ඔහු වෙනුවෙන් (ජනාසා සලාතයේ) තක්බීර් හතරක් ද පැවසූහ.(1)

උමර්, උස්මාන්, අලී, තල්හා සහ අස් සුබෙයිර් (රළියල්ලාහු අනහුමා) යන සහාබාවරුන් දිවි පුදන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඒ අයුරින්ම සාමාන්ය මිනිසුන් මිය යන්නාක් මෙන් මොවුන් තම ඇඳන් මත මිය යන්නේ නැති බව ද පැවසූහ.

දිනක් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා කන්දකට නැග්ගේය. එතුමා සමග අබූ බක්ර්, උමර්, උස්මාන්, අලී, තල්හා සහ සුබෙයිර් එහි සිටියදී ගල් පවර්තය කම්පනය වන්නට ගත්තේය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ එම කන්දට "ඔබ සන්සුන් වන්න. ඔබ මත සිටින්නේ නබිවරයකු හෝ මිතුරෙකු හෝ දිවි පුදන්නෙකු පමණි." යැයි පැවසූහ.(2)

මෙහි ප්රඥාව වූයේ එතුමාගේ නබිත්වය, අබූ බක්ර් සිද්දීක්ගේ මිතුදම හා සෙසු අයගේ ජීවිත පරිත්යාගයයි. එනම් ඔවුන් දිවි පුදන බවයි. එතුමාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) දන්වා සිටි පරිද්දෙන්ම සිදු විය.

ඇතැමුන් සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම පරමාධිපතිට ප්රාථර්නා කොට මිනිසුන් බලා සිටියදීම එම තත්ත්වයේම ඔවුනට ප්රතිචාර ලැබූ පිරිස් සම්බන්ධයෙන් සඳහන් හදීස් 150කට වඩා අධිකව මෙහි සඳහන්ව ඇත.(3)

මක්කා වාසීහු අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් ඔවුනට සලකුණක් පෙන්වන මෙන් ඉල්ලා සිටි අවස්ථාවේ එතුමාණෝ ඔවුනට සඳ දෙපළු වී ඒ දෙක අතර හිඩැස ඔවුන් දකින තෙක්ම එය පෙන්වූහ. මෙම හදීසය මුතවාතිර් ගණයට අයත් හදීසයකි. එනම් එය නිරවද්යතාවයේ ඉහලම මට්ටමේ පිහිටුනු හදීසයකි.

(1) සහීහ් අල් බුහාරි, හදීස් අංක: 1333.
(2) සහීහ් මුස්ලිම්, හදීස් අංක: 2417.
(3) මෙම හදීස් එකතුව සර්ද් ඉබ්නු අබ්දුල් කාදිර් බාෂන්ෆර්, 'දලාඉල් අන් - නුබුව්වා' නම් ඔහුගේ කෘතියෙහි ගොනු කර ඇත. මෙම කෘතිය 'දාර් ඉබ්නු හසම්' ප්රකාශනවලින් එකකි.

ජුමුආ හා අවුරුදු සලාතය සඳහා රැස්වෙන අවස්ථාවන් මෙන් විශාල වශයෙන් ජනයා රැස්වන අවස්ථාවන්හි සඳුගේ පැළීම සම්බන්ධයෙන් වන ප්‍රාතිහාර්යය ඇතුළත් 'අල්-කමර්' පරිච්ඡේදය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පාරායනය කළහ. එය එහි සඳහන්ව ඇති එතුමාගේ ප්‍රතිහාර්යය ජනතාවට ඇසෙන්නට සළස්වනු පිණිසය. එය එතුමාගේ නබිත්වයේ නිරවද්‍යතාව සහතික කරන සාධකයක් විය.

ජීවීන් අතරින් මවන ලද අවසාන ජීවයා ආදම් (අලයිහිස් සලාම්) බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. "ජුමුආ දිනයේ අසර් වේලාවෙන් පසු ආදම්ව මැව්වේය. ඔහු මැවීම්හි අවසානය විය."(1)

මෙම විද්‍යාත්මක සත්‍යය දැන් තහවුරු වී ඇත. ඇත්තෙන්ම ගහ කොළ පැලෑටි හා සතුන්ගේ බිහිවීමෙන් පසු මහපොළොවේ බිහිවුණු මැවීම් අතරින් අවසාන මැවීම ආදම් වේ යන්න නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා දැන සිටියේ කෙසේද?

සවර්බලධාරී තේජාන්විත අල්ලාහ්ගේ ප්‍රකාශ දෙස අවධානය යොමු කර බලන්න. "රාත්‍රිය හා දහවල සංඥාවන් දෙකක් බවට අපි පත් කළෙමු. එවිට අපි රාත්‍රියේ සංඥාව මකා දමා දහවලේ සංඥාව පෙනෙන්නක් බවට පත් කළෙමු." 17:12 සූරා අල්-ඉස්රා.

"රාත්‍රියේ සංඥාව මකා දැමුවෙමු." එනම්: සැබැවින්ම එය සඳුය. බැබලෙමින් පවතින එය රාත්‍රියේ සලකුණයි. පසුව එහි ආලෝකය මැකී යන්නේය.

මෙම ශුද්ධ වූ පාඨය සහාබාවරුන් විස්තර කළේ මේ අයුරිනි. ඉමාම් ඉබ්නු කසීර් සඳහන් කළ අල් කුආර්න් විග්‍රහයෙහි, සැබැවින්ම අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) මෙසේ පවසා සිටියහ: "හිරු බබලනවාක් මෙන් සඳු ද බැබලෙමින් පැවතුනි. එය රාත්‍රියේ සළකුණයි. එය (එහි ආලෝකය) මකා දමන ලදී."

පුදුමයට කාරණාව නම්, අද විද්‍යාව නිගමනය කර ඇත්තේ මෙම මතයයි. නාසා ආයතනය සිය නිල වෙබ් අඩවියේ සහ නිල නාලිකාවේ

(1) සහීහ් අල්-ජාමිඃ, 8188.

ප්‍රකාශයට පත් කර ඇත්තේ: චන්ද්‍රයාගේ ජීවයේ පළමු අවධිය, එය දීප්තිමත්ව බැබළෙමෙන් පැවති අවදියක් විය.[1]

මෙම උදාර මිනිසාගේ අතින් අසංඛ්‍යාත වූ ප්‍රාතිහාර්යයන් සිදුවී තිබීම, පෘථිවියේ හා අහස්හි පවතින සියුම් රහස් හා ගුප්ත දෑ පිළිබඳ තොරතුරු දන්වා සිටීම, ඔහු වෙත අල් කුආර්නය පහළ වීම, ඔහුට පෙර පැමිණි වක්තෘවරුන් ඔහු ගැන කරුණු ඉදිරිපත් කර තිබීම යනාදිය 'තවාතුරු' හෙවත් බලවත් වාතර්‍ා කරණයන් තුළින් සනාථ වී ඇත. ඔහු දෙවිඳුන්ගෙන් සහතිකයක් ලබා ගත් අයකු වන අතර, ෂරියා පිළිවෙත සම්පූර්ණ කර අවසන් වන තුරු මිය ගියේ නැත.

එසේ අවසන් වූයේ, සැබැවින්ම එතුමා නබිරයාණන් වූ බැවින් හා බුද්ධියට මගපෙන්වන්නා ද එතුමා බැවිණි.

සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ සැඟවුණු ප්‍රාතිහාර්යයන් දහසකට වඩා අධිකය.

එම ප්‍රාතිහාර්යයන් වාතර්‍ා කළේ එතුමාණන්ගේ සහගාමීන් අතරින් එතුමාගෙන් පසු වඩාත් ධාමරීක හා වඩාත් සත්‍යවාදී සහගාමීහුය.

පුදුමයට කරුණ නම්, ඇතැම් ප්‍රධාන සහාබාවරු එම ප්‍රාතිහාර්යයන් දැකීමට පෙර ඉස්ලාමය වැළඳ ගැනීමය. එසේ ඔවුහු ඉස්ලාමය වැළඳ ගත්තේ සැබැවින්ම නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සත්‍යවාදියෙකු මෙන්ම එතුමාණන් කිසි විටෙක බොරු පවසා නොමැති බව දැන සිටි නිසාය.

ප්‍රධාන පෙළේ සහාබාවරුන්ගේ මෙම ස්ථාවරය ප්‍රඥාවන්ත, බුද්ධිමය ස්ථාවරයක් විය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සත්‍යභාවය නබිත්වයේ නිරවද්‍යතාව ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් ස්වාධීන සාධකයකි. නබිත්වය ගැන ප්‍රකාශ කරන පුද්ගලයා, ජනයා අතර වඩාත් සත්‍යවාදියෙකු විය යුතුය. හේතුව ඔහු නබිවරයකු වන බැවිනි. සැබැවින්ම නබිවරයෙක් ජනයා අතර වඩාත් සත්‍යවාදියකු වේ.

(1) http://www.nasa.gov/mission_pages/LRO/news/vid-tour.html https: // www.youtube.com/watch?v=UIKmSQqp8wY

එසේ නැතහොත්, ඔහු ජනයා අතර මහත් බොරුකාරයකු විය යුතුය. මක්නිසාද යත් ඔහු වැදගත්ම කරුණු කාරණා සම්බන්ධයෙන් බොරු ගොතා පවසන බැවිනි.

ජනයා අතර සිටින මහත් මෝඩයකු හැර, වෙනත් කිසිවකු ජනයා අතර සිටින මහත් සත්‍යවාදියා සහ ජනයා අතර සිටින මහා බොරුකාරයා සමඟ අවුල් කර ගන්නේ නැත.(1)

ප්‍රඥාවන්තයෙකුට සැබෑ සත්‍යවාදී මිනිසුන් සහ මහත් වංචාකාර මිනිසුන් අතර වෙනස හඳුනා ගැනීම කෙතරම් පහසුද?

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්)තුමාණගේ දූත මෙහෙවරේ ප්‍රථම දිනයේම, සැබැවින්ම එතුමා කිසිවිටෙක බොරු නොකියූ බව බහුදේවවාදීහු පිළිගෙන සිටියෝය. ඔවුහු එතුමාට මෙසේ පැවසුවෝය. "අපි ඔබෙන් කිසිම බොරුවක් අත්විඳ නැත."(2)

අබූ සුෆ්යාන් ඉස්ලාමයට පිවිසීමට පෙර, හෙරක්ලියස් රජු ඔහුගෙන් "ඔහු කියූ දෑ කීමට පෙර බොරු කීවා යැයි නුඹලා ඔහුට චෝදනා නැගුවෝයි? විමසුවේය.

අබූ සුෆ්යාන්: "නැත" යැයි පිළිතුරු දුන්නේය.

එවිට හෙරක්ලියස්: "මිනිසුන්ට බොරු නොකියන කෙනෙක්, දෙවිඳුන් ගැන බොරු කියන්නට ඉඩ දෙන්නේ නැත." යැයි පැවසුවේය.

පසුව හෙරක්ලියස් රජු ඔහුගේ ප්‍රරසිද්ධ කතාවෙහි, "මම එතුමා අසළ වී නම් එතුමාගේ දෙපා සෝදා හරිමි" යැයි තව දුරටත් පැවසුවේය.(3)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ ජීවිත කාලය පුරාවට එකඳු බොරුවක් හෝ ගෙනහැර පෑමට දේව ප්‍රතික්ෂේපකයින් සමත් වූයේ නැත. එතුමාව නබිවරයකු ලෙස එවීමට පෙරම එතුමාගේ තත්ත්වය ගැන ඔවුන් මැනවින් දැන සිටියදී ඔවුන් එතුමාව ප්‍රතික්ෂේප කළෝය. ඔවුනට එරෙහිව අල් කුආර්නය මෙසේ සඳහන් කළේ එබැවිනි. අපගේ පරමාධිපති

(1) 'සුබූතුන් නුබුව්වාත් අක්ලන් වනක්ලා" (තාකරීකව හා වාතර්ාමය වශයෙන් වක්තෘත්වය සහතික කිරීම) දාර් ඉබ්නු අල් ජව්සී ප්‍රකාශනය පිටු අංක 573." එහි අතර්ය එම මූලාශ්‍රයේම පිටු අංක 318 හි සඳහන්ව ඇත.
(2) සහීහ් අල් බුහාරි, හදීස් අංක: 4971.
(3) සහීහ් අල් බුහාරි, හදීස් අංක: 7.

සුවිශුද්ධයාණන් මෙසේ පවසයි. "එසේ නැතහොත් ඔවුන්ගේ ධර්ම දූතයාණන් ගැන ඔවුහු නොදැන, එහෙයින් ඔවුහු ඔහු ප්‍රතික්ෂේප කරන්නෝ ද?" 23:69. සූරා අල්-මුඃමිනූන්.

නබි තුමාණන්ගේ පසුබිම හා එතුමාගේ චරිතාපදානය වනාහි සැබැවින්ම එය එතුමා නබිවරයකු බවට වූ ස්වාධීන සාධකයකි.

(අල්ලාහ් එතුමාණන් කෙරෙහි ශාන්තිය හා සමාදානය උදා කරත්වා!)

අවංකකම සඳහා හේතු, පොදුවේ එතුමාගේ වක්තෘභාවයට අන්‍යෝන්‍ය වශයෙන් සහය පළ කරන්නේ නම්, සිහිබුද්ධිය ඇති පුද්ගලයෙකු මේ සියල්ල ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද?

## 26- සැබැවින්ම, මම දෙවියන් වහන්සේව විශ්වාස කළ යුතු බව මා දැන ගන්නේ කෙසේද?

**පිළිතුර:** ඔබ දෙසම බලන්න, ඔබ පරීක්ෂාවට ලක්ව ඇති බව ඔබට වැටහෙනු ඇත, හරි දේ කිරීමට සහ වැරදි දේ නොකිරීමට ඔබ තුළ හැඟීමක් නැද්ද?

ඔබ ඉදිරියෙහි මුදල් තිබී, එහි හිමිකරු ද ඒ ගැන සැළකිලිමත් නොවන්නෙකු නම්, එවිට ඔබට මෙම මුදල් අරගෙන එයින් ප්‍රයෝජනයක් ලබා ගැනීමේ හැඟීමක් ඇති වන අතර, "එසේ නොකරන්න, එය තහනම්ය; අපරාධයකි" යැයි ඔබට පවසන හැඟීමක් ද ඇති වේ.

ඔබේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම ඔබ පරීක්ෂාවට ලක් වේ.

මේ හැඟීම - 'කරන්න; නොකරන්න' යන හැඟීම - ඔබ තුළ පවතින්නේ ඔබ දැනටමත් පරීක්ෂාවට ලක් වී ඇති නිසාත්, ඔබව නොසලකා හැර නැති නිසාත්ය... ඔබ මෙවගේ වටිනාකමක් නොමැති යමක් නොවේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ පැවසීය. "එම මාගර්ය වෙත නියත වශයෙන්ම අපි ඔහුට මග පෙන්වූයෙමු. ඔහු කෘතවේදියෙකු ලෙස හෝ ගුණමකුවෙකු ලෙස හෝ සිටිය හැක." 76:3 සූරා අල්-ඉන්සාන්.

'කරන්න' සහ 'නො කරන්න' යන හැඟීම තමන් තුළ පවතින මිනිසකු: ඔහු ඔහුගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම එක්කො ස්තුතිවන්ත විය හැක; නැති නැම් අකෘතඥ හෝ විය හැක.

එසේ, මනුෂ්‍ය ජීවිතයේ සෑම පියවරකදීම, පුද්ගලයෙකුට යහපත කිරීමට හෝ අයහපත කිරීමට හෝ හැකිය. එනම්, ඔහු දේවස්ථානයට ගිය හැක; නැතහොත් විනෝදවීමට ගිය හැක.

මේ හේතුවෙන්, සවර්බලධාරීත් තේජාන්විත අල්ලාහ් මෙසේ පැවසීය. "ජින් වගර්යා හා මිනිස් වගර්යා මා නැමදීමට මිස මම ඔවුන් නොමැව්වෙමි." 51:56. සූරා අද්-දාරියාත්.

සෑම පියවරකදීම ඔබ සියළු මහිමය හිමි දෙවියන් වහන්සේට නමස්කාර කිරීමේ ආකාරයක් හෝ උන් වහන්සේට අකීකරු වීමක් සොයා ගනු ඇත.

එබැවින්, දෙවියන් වහන්සේ අණ කළ දේ කිරීමට මඟ පෙන්වනු ලැබූ තැනැත්තා ජය ලැබීය. දෙවියන් වහන්සේ ඔහුට අණ කළ දේ කිරීමට අකීකරු වූ තැනැත්තා වැරදි සිදු කළේය.

මෙම තෝරා ගැනීමේ හැකියාව මත මිනිසා කළ සෑම දෙයක් සඳහාම ඔහුගේ විනිශ්චය පෙළගැසෙනු ඇත.

අපගේ මැවීමේ අරමුණ පරීක්ෂා කරනු ලැබීම හා විභාග කරනු ලැබීම වන අතර උත්තරීතර දෙවිඳුන් තම පණිවිඩකරුවන් යවා දිව්‍ය හෙළිදරව්වන් හෙළි කළේ මෙම අරමුණ උදෙසාය. "නුඹලා අල්ලාහ්ට ගැතිකම් කරනු. නපුරු බලවේග වලින් වැළකෙනු යැයි (ජනයාට අණ කරනු පිණිස) සැබැවින්ම අපි සෑම සමූහයකටම රසූල්වරයකු එව්වෙමු." 16:36. සූරා අන්-නහ්ල්.

මිය යෑමෙන් පරීක්ෂණය අවසන් වූ පසු අපි දෙවිඳුන් වෙතට නැවත යෝමු වන්නෙමු. "නුඹලා යොමු කරනු ලබනුයේ ඔහු වෙතටමය" 36:22 සූරා යාසීන්.

"තවද නියත වශයෙන්ම, අවසානයේදී (සියලු දෙනාගේ) නැවත හැරීයාම, නුඹගේ පරමාධිපති වෙතයි." 53:42 සූරා අන්-නජ්ම්.

"නියත වශයෙන්ම නැවත හැරී යනුයේ නුඹගේ පරමාධිපති වෙතය." 96:8 සූරා අල්-අලක්.

අප ඉදිරිපත් කළ දෑ සම්බන්ධයෙන් විනිශ්චය කරනු ලබන පිණිස අල්ලාහ් වෙත අපි නැවත හැරී යන්නෙමු. "තවද නියත වශයෙන්ම ඔහුගේ උත්සාහය මතු පෙන්වනු ලැබේ." (40) "පසු ව පූණර්වත් ප්‍රතිඵල ඔහුට පිරිනමනු ලබන්නේය." 53:41. සූරා අන්-නජ්ම්.

ඔබ ඉදිරිපත් කළ ක්රියාවන් පෙන්වනු ලැබේ. ඒ සම්බන්ධයෙන් ඔබ විමසනු ලබනු ඇත. "එහෙයින් කවරෙක් අණුවක් තරම් ප්රමාණයකින් යහපතක් කර ඇත්තේ ද ඔහු එය දැක ගනී." 99:7 "කවරෙක් අණුවක් තරම් ප්රමාණයකින් අයහපතක් කර ඇත්තේද ඔහු එය දැක ගනී." 99:8 සූරා අල්-සල්සලා.

## 27- වක්තෘවරුන් ප්රතික්ෂේප කරමින් අල්ලාහ්ව පමණක් විශ්වාස කිරීම ප්රමාණවත් ද?

**පිළිතුර:** නැත.

නබිවරුන් -වක්තෘවරුන්- පිළිබඳ විශ්වාස කිරීමෙන් තොරව අල්ලාහ්ගේ පැවැත්ම පමණක් විශ්වාස කිරීම, පුද්ගලයකු අල්ලාහ්ට අවනත වන්නකු - මුස්ලිම්වරයකු- වීමට තරම් ප්රමාණවත් වන්නේ නැත. සැබැවින්ම ඔහු අල්ලාහ් මැවුම්කරු; පෝෂක; සැළසුම් කරු යනුවෙන් විශ්වාස කොට පසුව ඔහුගේ දිව්ය පණිවිඩ ප්රතික්ෂේප කොට ඔහුගේ දූතවරුන් හෙළා දැකීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

මෙය බරපතල මහත් ප්රතික්ෂේපයකි.

මෙහිදී අල්ලාහ්ගේ දිව්යමය පණිවිඩ ප්රතික්ෂේප කරන්නාට වඩා මහත් අපරාධකරුවකු වෙනත් නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කරයි: "සැබැවින්ම අල්ලාහ් හා ඔහුගේ රසූල්වරුන් ප්රතික්ෂේප කර, අල්ලාහ් හා ඔහුගේ රසූල්වරුන් අතර වෙනස්කම් කොට, 'ඇතැමුන් ව අපි විශ්වාස කරමු. එමෙන්ම ඇතැමුන් ව අපි ප්රතික්ෂේප කරමු' යැයි පවසා, මේ (විශ්වාසය හා ප්රතික්ෂේපය) අතර මගක් ගන්නට අපේක්ෂා කරන අය වනාහි." 4:150 "සැබෑ ලෙසින් ප්රතික්ෂේප කළවුන් මොවුහුමය. තවද අපි ප්රතික්ෂේපක යින්ට නින්දනීය දඬුවමක් සූදානම් කර ඇත්තෙමු." 4:151. සූරා අන්-නිසා.

යමෙකු අල්ලාහ් විශ්වාස කර, නබිවරුන් ප්රතික්ෂේප කරන්නේ නම් ඔහු සැබෑ ලෙසින්ම දේවත්වය ප්රතික්ෂේප කළ අයෙකි.

නබිවරුන්ගෙන් කිසියම් හෝ නබිවරයකු ප්රතික්ෂේප කළ අයෙක් වේවා ඔහු දෙවිඳුන්ගේ දිව්ය පණිවිඩ හෙළා දැක ඇති බැවින්, ඔහු දෙවිඳුන් ප්රතික්ෂේප කළ අයෙකි. ඒ අනුව ආගම් ලත් ජනයා මුහම්මද් ඉබ්නු අබ්දුල්ලාහ් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ වක්තෘභාවය හෙළා

දැක ඇති බැවින් ඔවුහු දේවත්වය ප්‍රතික්ෂේප කළෝය. "සැබැවින්ම පුස්තක ලත් ජනයා හා ආදේශ තබන්නන් අතුරින් වූ ප්‍රතික්ෂේප කළවුන් නිරා ගින්නෙහිය. ඔවුහු එහි සදාතනිකයෝ වෙති. ඔවුන්මය මැවීම් අතුරින් ඉතා අයහපත්ම මැවීම වනුයේ." 98:6. සූරා අල්-බය්යිනා.

ඔවුන් නිරයට පිවිසෙන බවට වූ අල්ලාහ්ගේ ප්‍රතිඥාව සැබෑය. "මාගේ ප්‍රතිඥාව (අවවාද) නියම විය." 50:14 සූරා කාෆ්.

'සැබැවින්ම අල්ලාහ් මැවුම්කරුය, පෝෂකය, ජීවය ලබා දෙන්නාය, මරණයට පත් කරන්නාය' යැයි මිනිසා පිළිගැනීම පමණක් ඉස්ලාමය හෝ ගැලවීම හෝ නොවේ. එනමුත් එයට අනුගත වෙමින් ඔහුගේ දූතවරුන් කෙරෙහි ද විශ්වාස තැබීම අත්‍යාවශ්‍ය වේ.

එසේ නම්, අල්ලාහ්ගේ පැවැත්ම පමණක් විශ්වාස කොට නබිවරුන් ප්‍රතික්ෂේප කිරීම ප්‍රමාණවත් වන්නේ නැත. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් අබියස එම ගැත්තාට එය කිසිදු ඵලක් හිමි කර දෙන්නේද නැත. එසේ නම්, ඔහු අල්ලාහ්ට නැමදුම් කළ යුතු අතරම, ඔහුගේ විශ්වාසය පූර්ණවත් වන්නේ අල්ලාහ්ගේ සෑම දූතවරයකු පිළිබඳවද විශ්වාස කිරීමෙනි.

අල්ලාහ්ගේ පැවැත්ම පමණක් විශ්වාස කළ යුතුව තිබුණේ නම්, අල්ලාහ් ඔහුගේ දූතවරුන් එවන්නට හෝ ඔහුගේ ධර්ම ග්‍රන්ථ පහළ කරන්නට හෝ නොතිබුණි. හේතුව සියලු මිනිසුන් සහජ ධර්මතාව තුළින් අල්ලාහ් පිළිබඳ හඳුනන බැවිනි.

ඔබව මැව්වේත්, ඔබට මඟ පෙන්වූයේත්, ඔබව පෝෂණය කළේත් අල්ලාහ්ය. ඔහුගේ දූතවරුන් හා ඔහුගේ නබිවරුන් හරහා ඔහු නීතිගත කළ පිළිවෙත් ප්‍රකාරව ඔහුට නැමදුම් කිරීමට ඔහු පමණක් සුදුසුකම් ලබන්නාය.

## 28- දේවත්වය ප්‍රතික්ෂේප කළ අයෙක් ඔහු සිදු කළ දැහැමි ක්‍රියාවන් සඳහා අල්ලාහ්ගෙන් ප්‍රතිඵල හිමි කර ගන්නේ ද?

**පිළිතුර:** දැහැමි ක්‍රියාවන් යනු අල්ලාහ් මිනිසුනට සහජයෙන්ම පිරිනමා ඇති ධර්මතාවයි. සෑම මිනිසෙකුම, ඔහු දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෙකු හෝ වේවා දෙවියන්ට ආදේශ කරන්නෙකු හෝ වේවා දැහැමි

ක්‍රියාවන් සිදු කරනු ඔබ දකින්නේ එබැවිනි. මොවුන් සියලු දෙනාම එවන් දැහැමි ක්‍රියාවන් සිදු කරනුයේ ඔවුන් සහජ ලෙස මවනු ලැබ ඇති ධර්මතාව හේතුවෙනි.

නමුත් එම දැහැමි ක්‍රියාවන් පිළිගැනීමේ කොන්දේසිය බවට පත්ව ඇත්තේ, අල්ලාහ්ගේ තෘප්තිය පමණක් අපේක්ෂා කරනු ලැබීමයි. එනම් එතුළින් අල්ලාහ්ගෙන් වූ කුසල් හිමි කර ගැනීමේ අපේක්ෂාවයි.

අල්ලාහ් සමග වෙනත් දෙවියකු හවුලේ තබා නමදින, අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන තැනැත්තාට අප කියනුයේ: "ඔබේ දැහැමි කයටුතුවලදී ඔබ අල්ලාහ්ට හවුලේ තැබූ තැනැත්තන් වෙත ගොස් ඔවුන්ගෙන් ඔබේ ප්‍රතිඵලය ලබා ගන්න. ඔබ කිසිවිටෙක අල්ලාහ්ගේ තෘප්තිය පමණක් බලා පොරොත්තුවෙන් ඔබේ මේ දැහැමි ක්‍රියාවන් සිදු කළේ නැත.

ඔබ මිනිසෙකු ගැන සිතන්න, ඔහුගේ පවුලේ අය ඔහුව ඇති දැඩි කර, ඔහු ශක්තිමත් තරුණයෙකු වන තෙක් ඔහු වෙනුවෙන් වියදම් කර, පසුව අන් අයට සේවය කිරීම සඳහා ඔවුන් වෙත ගිය පසු, ඔහු තම පවුලට ආපසු ගොස්, 'අන් අයට මා කළ සේවය කිරීම සඳහා මගේ වැටුප මට දෙන්න.' යැයි කීමට ඔහුට අයිතියක් තිබේද?

ඔහු කවුරුන් වෙනුවෙන් සේවය කරමින් සිටියේ ද ඔවුන් වෙත ඔහු යා යුතුය. ඔහුගේ කුලිය ඔවුන්ගෙන් ලබා ගත යුතුය.

දෙවිඳුන් අල්ලාහ් සතුව පරමාදශර්ය ඇත.

අල්ලාහ් ඔබව මැව්වේය. ඔබට පෝෂණ සම්පත් පිරිනැමුවේය. සියලුම ආකාරයේ ආශිවර්ාදයන් පිරිනැමුවේය. පසුව ඔබ ඔහුට නැමදුම් කිරීම අත්හැර දමා, ඔබේ ක්‍රියාව සඳහා කුසල් ඔබ ඔහුගෙන් ලබා ගැනීමට අපේක්ෂා කරයි. එය සිදුවිය හැක්කේ කෙසේද?

සවර්බලධාරීත් තේජාන්විත අල්ලාහ් මෙසේ පැවසුවේ එනිසාය. "ක්‍රියාවෙන් ඔවුන් සිදු කළ දෑ වෙතට අපි පැමිණියෙමු. පසු ව අපි එය විහිදුණු දූවිලි බවට පත් කරන්නෙමු." 25:23. සූරා අල්-ෆුකර්ාන්.

තවදුරටත් සුවිශුද්ධ අල්ලාහ් මෙසේ පවසයි: "දෙවියන් ප්‍රතික්ෂේප කළවුන් වනාහි, ඔවුන්ගේ ක්‍රියාවන් කාන්තාරයේ ඇති මිරිඟුවකට සමානය. පිපාසිතයා එය ජලය යැයි සිතයි. නමුත් ඔහු එහි පැමිණි විට ඔහු එය කිසිවක් ලෙස නොදකිනු ඇත." 24:39. සූරා අන්-නූර්.

දේවත්වය ප්‍රතික්ෂේප කරන්නන් ඔවුන්ගේ ක්‍රියාවන් දැහැමි වුව ද, ඒ සඳහා ත්‍යාගයක් ලැබීමට ඔවුන් සුදුස්සන් නොවෙති. එය ඔවුන් එම දැහැමි ක්‍රියාවන් මගින් ඔවුන්ගේ පරමාධිපතිගෙන් කුසල් ලබා ගැනීමට අදහස් නොකළ, එයින් ඔවුන්ගේ මැවුම්කරුගේ සතුට අපේක්ෂා නොකළ කාෆිවර්රුන් වන බැවිනි.

ප්‍රශ්නය හුදෙක් යහපත් ක්‍රියාව පමණක් නොවේ, මන්ද අප සියලු දෙනාම බොහෝ යහපත් ක්‍රියා කිරීමට සහජයෙන්ම බැඳී සිටින බැවින්, ප්‍රශ්නය වන්නේ ඔබ මෙම යහපත් ක්‍රියාව කරන්නේ ඇයි? සහ ඔබ එය කරන්නේ කා වෙනුවෙන්ද? ඔබ එය කරන්නේ ඔබේම ප්‍රයෝජනය සඳහාද? නැතහොත් ප්‍රදශර්නය කිරීම සඳහාද? නැතහොත් ඔබ එය කරන්නේ දෙවිඳුන් අල්ලාහ් හැර වෙනත් කෙනෙකු වෙනුවෙන්ද?

මේ සියල්ල සිදු කළේ අල්ලාහ්ගේ මාගර්යේ නොවේ. අල්ලාහ්ගෙන් අපේක්ෂා කරනු ලබන දැහැමි ක්‍රියාවන්හි ප්‍රතිඵල, ඔහුගෙන් බලාපොරොත්තු නොවන දෑය.

## 29- ඉස්ලාමය සත්‍යයේ ආගම නම්, දුමර්තය ඇත්තේ මන්ද?

**පිළිතුර:** දුමර්තය යනු, මුස්ලිම්වරයෙකුට ඔහුගේ දහම තුළ නොතේරෙන ගැටළුවක් වන අතර එයට පිළිතුරක් ඔහු සොයා ගන්නා තෙක් එය ඔහුට පැටලිලි සහගත විය හැකිය.

අසත්‍යයට කැමති අය තම ස්වාමියාට කීකරු වීමෙන් දුරස් විය හැකි පරිදි, ආගමේ සුළු ප්‍රශ්නවල සැක සහිත කරුණු ඇති බව සවර්බලධාරී දෙවියන් අභිමතය වී ඇත.

තේජාන්විත සවර්බලධාරී දෙවිඳුන් අල්ලාහ් මෙසේ පැවසීය. "ඔහු වනාහි නුඹ වෙත ධමර් ග්‍රන්ථය පහළ කළේය. එහි පැහැදිලි තීන්දු සහගත වැකි ඇත. ඒවා ධමර් ග්‍රන්ථයේ මූලය යි. තව ද අනෙක් ඒවා විවිධ වූ අථර්යන්ගෙන් සමන්විත වැකි ය. එබැවින් තම හදවත් තුළ වියාකූලත්වය ඇත්තන් වූ කලි ඔවුන් කලහකම් කිරීමේ අපේක්ෂාවෙන් ද, එහි අථර් විකෘති කිරීමේ අපේක්ෂාවෙන් ද, එයින් විවිධ වූ අථර්යන්ගෙන් සමන්විත දෑ අනුගමනය කරති. එහි යථාථර්ය අල්ලාහ් හා ගැඹුරු ඥානය ඇත්තවුන් හැර වෙන කිසිවෙකු නොදන්නේය. තවද අපි එය විශ්වාස කළෙමු. "'සියල්ල

අපගේ පරමාධිපති වෙතිනි" යැයි ඔවුහු පවසති. බුද්ධිමත් අය හැර වෙනත් කිසිවෙක් මෙනෙහි කරන්නේ නැත." 3:7. සූරා ආලු ඉම්රාන්

"එබැවින් තම හදවත් තුළ ව්‍යාකූලත්වය ඇත්තන් වූ කලි ඔවුහු එහි විවිධ වූ අර්ථයන්ගෙන් සමන්විත දෑ අනුගමනය කරති." එනම් කවර හදවතක ව්‍යාකූලත්වයක් ඇත්තේ ද ඔහු ගැටලු සොයමින් ද අල්ලාහ්ගෙන් දුරස්වීමේ අපේක්ෂාවෙන් ද සැක සහිත දෑ ඔහු අනුගමනය කරන්නට බලයි.

අල්ලාහ්, ඔහුගේ ප්‍රඥාව මත දේව විශ්වාසයත් දේව ප්‍රතික්ෂේපයත් එහි යොදා තිබීම ඔහුගේ අභිමතය විය. "තවද නුඹලා අතරින් ප්‍රතික්ෂේප කරන්නන් ද නුඹලා අතරින් විශ්වාස කරන්නන් ද සිටිති." 64:2. සූරා අත්-තඝාබුන්.

මෙම සැකයන් සමග බැඳී සිටින්නේ දේව ප්‍රතික්ෂේපය අපේක්ෂා කරන, ඔහුගේ දහමින්, ඔහුගේ යාඥාවෙන් හා ඔහුගේ විශ්වාසයෙන් දුරස්ව කටයුතු කරන්නන්ය.

දේවත්වය විශ්වාස කරන්නා, ස්ථිර තීන්දු සහිත සාධක හා "උම්මුල් කිතාබ්" නමැති දහමෙහි නිරවද්‍යතාව හා දේව පණිවිඩයේ නිරවද්‍යතාව පෙන්වා දෙන සාධක අනුගමනය කරති. තමන්ට වැටහීමක් නැති දෙයක් දුටුවේ නම් ඔහු ඒ ගැන විමසා දැන ගන්නා අතර, තම දහම හෝ තම යාඥාව පිළිබඳ තමන්ට අවබෝධයක් නොමැති දෑහි නිරත නොවෙති.

සිත්හි රෝග ඇත්තන් හැර, වෙනත් කිසිවෙකු තමන්ට අවබෝධයක් නොමැති දෑ පිළිපදමින්, දහමින් දුරස්ව ඒවායෙහි නිරත නොවනු ඇත. "එමෙන්ම "මෙමගින් උපමාවක් ලෙසින් අල්ලාහ් අදහස් කරනුයේ කුමක්දැ"යි තම සිත් තුළ රෝග ඇතිවුන් හා දෙවියන් ගැන ප්‍රතික්ෂේප කළවුන් පවසනු පිණිසත්ය. අල්ලාහ් තමන් අභිමත කරන අය නොමග යන්න අතහරියි. තවද තමන් අභිමත කරන අයට මග පෙන්වයි." 74:31 සූරා අල්-මුද්දස්සිර්.

මෙවන් සැක සහිත කරුණු පැවතීමේ තවත් ප්‍රඥාවක් වනුයේ, සැබැවින්ම මෙම සැක සහිත කරුණු හේතුවෙන් දැනුමැත්තන් මෙන්ම අල්ලාහ්ගේ දහම තුළ දැක්ම ඇත්තන් වෙන් කර හඳුනා ගැනීමයි. සැක සහිත කරුණු සඳහා වූ පිළිතුර දැනුමැත්තා හඳුනා ගන්නා අතර ඒ තුළින් දහම පිළිබඳ ගැඹුරු දැනුමක් නැති, ඒ ගැන හදාරා නැති, සාමාන්‍ය

තැනැත්තාගෙන් ඔහු වෙන් වෙයි. දැනුම දෙනු ලැබූවන් අල්ලාහ් තරාතිරම්වලින් උසස් කරවනු ඇත.

සත්‍ය පිළිඹිබු වී ඇත. නමුත් සැක සහිත කරුණු පැවතීම ද අවශ්‍යය. ඊට හේතුව එමගින් විශ්වාසීන්ගේ ඊමානය පරීක්ෂාවට ලක් කෙරෙන බැවිණි.

තම මැවීම් අතරෙහි අල්ලාහ්ගේ න්‍යාය වනුයේ භාර කිරීමය. භාර කිරීමෙහි ඔහුගේ න්‍යායය වනුයේ ඇතැම් ප්‍රඥාවන් සඟවා තිබීමය. ජයග්‍රාහකයා වන්නේ ඔහුට සැඟවුනු සියුම් වූ කරුණු පිළිබඳ දැන ගන්නට සාධක සොයන්නාය. පරාජිතයා වන්නේ තමන් නොදන්නා දෑ තිරයක් බවට පත් කර ගනිමින් තමන් දන්නා දෑ සම්බන්ධයෙන් සාධක සෙවීම පවා තහනම් කර ගන්නාය.

## 30- දෙවිඳුන් අල්ලාහ් නපුර නිමර්ාණය කළේ ඇයි? නැතහොත් වෙනත් වචන වලින් කිවහොත්: "නපුරේ උභතෝකෝටිකයට" (dilemma) මුස්ලිම්වරයෙකු ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

**පිළිතුර:** ඉතිහාසය පුරාවටම අදේවවාදයට ඇති ලොකුම හේතුව නපුරේ අබර්ුදයයි (fithna of evil).

"තවද ජනයා අතුරින් සැකය මත සිට අල්ලාහ්ට ගැතිකම් කරන්නාද වෙයි. යම් යහපතක් ඔහුට ඇති වූයේ නම්, එමගින් ඔහු සැනසුමට පත් වෙයි. නමුත් ඔහුට යම් අබර්ුදයක් ඇති වූයේ නම්, ඔහුගේ මුහුණ මත හැරී යයි. මෙලොවෙහි හා මතු ලොවෙහි ඔහු පරාජිත විය. ප්‍රකට, ඉමහත් පරාජය එයමය." 22:11. සූරා අල්-හජ්.

තමන්ට අත් වූ විපතක්, ව්‍යසනයක් හෝ අබර්ුදයක් හේතුවෙන් අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන්නන් ද මෙහි සිටිති.

මෙහි, අදේවවාදියා අසා සිටිනුයේ: 'මූලික වශයෙන් නපුර මෙහි ඇත්තේ ඇයි?'

පිළිතුර සරලය: සැබැවින්ම අපි (ආගමිකව) පැවරනු ලැබූවන් වන බැවිනි.

සැබැවින්ම අපි සිටින්නේ පරීක්ෂණාත්මක ලෝකයක වන බැවිනි.

අපගේ ශුද්ධ වූ දෙවිඳාණන් මෙසේ පැවසීය. "තවද අපි නපුරෙන් හා යහපතින් පරීක්ෂණයක් ලෙසින් අපි නුඹලා පිරික්සන්නෙමු." 21:35. සූරා අල්-අන්බියා.

එහෙයින් හොඳ හා නරක පිහිටනුයේ ඔබ වගකිව යුතු පැවරුම් නියම කරනු ලැබූ අයකු වන බැවිනි. වගකීම් පවරනු ලැබීම යනු ඔබේ පැවැත්මේ අරමුණයි.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. (මන්ද) නුඹලා අතුරින් කවරෙකු ක්‍රියාවෙන් වඩාත් දැහැමි දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය. තවද ඔහු සවර් බලධාරීය. අතික්ෂමාශීලීය." 67:2. සූරා අල් මුල්ක්.

නපුර, පරීක්ෂාවන් සහ විපත්තිවල පැවැත්ම, ආගමේ වලංගුභාවය සහ අදේවවාදයේ දෝෂය පිළිබඳ විශාලතම සාක්ෂියයි.

එහෙයින් අප භෞතික ලෝකයේ දරුවන් වන්නේ නම්, අපට හොඳ හෝ නරක තේරුම් ගත නොහැකි වනු ඇත.

මුළු විශ්වයම අර්ථ විරහිත වුවද, කිසි විටෙකත් එය අර්ථ විරහිත බව අපට පැහැදිලිව පෙනෙන්නේ නැත.[1] මක්නිසාද යත්, අදේවවාදී දැක්මට අනුව, අපි දැඩි ද්‍රව්‍යමය අවශ්‍යතා අනුගමනය කරන අතර, ස්වභාවධර්මයේ නීති අපට අදාළ වනු ඇත. මෙම සන්දර්භය තුළ, අපි නපුරේ සාරය හෝ නපුර යන වචනයේ අර්ථය තේරුම් නොගනිමු.

එනම්, දියුණුම සත්ත්වයෝ අකුසලයේ අකරතැබ්බය අවබෝධ කරගන්නවාද?

'නපුර' තේරුම් ගැනීම යනු, අපි මෙම භෞතික ලොවේ දරුවන් නොවන බවත්, ඩාවින්ගේ භෞතිකවාදී පැවැත්මේ පරිශ්‍රය හැර වෙනත් පරිශ්‍රයකින් නපුරේ පැවැත්ම පිළිබඳ අපගේ අවබෝධය ලබා ගන්නා බවත්ය.

ඒවෙනුවට, අපි අයත් වන්නේ ස්වර්ගීය පරිශ්‍රයකට මිස භූමික ද්‍රව්‍යවාදී අදේවවාදයකට නොවේ. මෙය, අපි නපුර තේරුම් ගන්නේ මන්දැයි, එකම පැහැදිලි කිරීමකි.

(1) C. S. Lewis

සැබැවින්ම අපි වගකීම් භාර කරනු ලැබූවන් බව අපට ආරෝපණය වන තාක් කල්, පරීක්ෂාව හා විපත්තිය ඇතිවීම ස්වභාවික වන අතර, අපට නපුර තේරුම් ගැනීම ස්වභාවිකය.

නපුර, ඇතැම් වේදනාවන් සහ අකීකරුකම සිදු කිරීමට ඇති හැකියාව යනාදිය ස්වභාවික අවශ්‍යතාවකි. එමෙන්ම නිදහස් කැමැත්තේ සහ දිව්‍ය වරමේ පැහැදිලි ප්‍රතිඵලයකි.

නපුර, පරීක්ෂණ, ව්‍යසන හා මනෝ ආශාවන්ගේ පැවැත්ම දැහැමි මිනිසාගේ උතුම් බව හා දුෂ්ඨ පුද්ගලයාගේ මහත් නපුර ඉස්මතු කරනු ඇත.

'නපුර' පවතින බැවින්, මැවුම්කරුගේ පැවැත්ම අදේවවාදීන් ප්‍රතික්ෂේප කිරීම පුදුම සහගතය. ඔවුන් මෙම විශ්ලේෂණය භාවිතා කරති:

1- පියා කරුණාවන්ත නම්, තම පුතාට යහපත වීම ඔහු ප්‍රිය කරන්නේ නම්, ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව වේදනාකාරී එන්නතක් පුතාට ලබා දීමට ඔහු ඉඩ දුන්නේ ඇයි?

2- එන්නත් කිරීම නිසා පුතාට වේදනාවක් තිබේද?

3- එසේ නම් පියෙක් එතැන නොමැත.(1)

එසේ නම්, මෙය තාකරීක නිගමනයක්ද?

එවිට දිව්‍ය ප්‍රඥාවේ සියලු සියුම් භාවයන්, හොඳ නරක තුළ අපට නොවැටහීම ස්වභාවිකය.

අල් හිඃද්ර් තුමාගේ ක්‍රියාවන් තුළ තිබූ ප්‍රඥාව දෙවිඳුන් අල්ලාහ් මූසා අලෙයිහිස් සලාම් තුමාට පැහැදිලි කළේය. ඒවා පැහැදිලිවම පිළිකුල් සහගත හා නොගැලපෙන ක්‍රියාවන් වුවද, විශාල යහපතක් සමඟ වට වී ඇත. මෝසස් සහ අල්-හිඃද්ගෙර් කථාව අල්-කුආර්නයේ සඳහන්ව ඇත්තේ ආඛ්‍යානයක් හා කථාන්තරයක් ලෙස නොව, මිනිස් ආත්මයේ අඩුපාඩු සහ එහි ඉක්මන් තීරණය පිළිබඳ පරිශීලනයක් හා පිළිගැනීමක් ලෙසය.

නපුරේ ගැටලුව තවත් පුදුමයක් වන්නේ, ලොවෙහි නපුරක් නොතිබුනේ නම්, ඔබ උපන් ස්ථානය හැර දමා නොයනු ඇත!

ශිෂ්ටාචාරයක් බිහි නොවනු ඇත. නගර, කමර්ාන්තශාලා හෝ නිවාස ඉදි නොවනු ඇත. මිනිසුන්ට වැඩ කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවනු ඇත.

(1) Absentee Foundations (නොමැති පදනම) නම් පොතෙන් උපුටා ගන්නා ලදී. එම්. අහමද් හසන්, දලාඉල් මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන්.

එමෙන්ම මිනිසුන් රෝගයකින් ආරක්ෂා වීම, ගැටලුවක් විසඳීම හෝ පහසුකම් ගෙන ඒමට අදහසක් නිමර්ාණය නොවනු ඇත.

මූලික වශයෙන් තමන් උපස් ස්ථානයෙන් නික්ම යැමට මිනිසාට අවශ්‍යතාවක් ඇති නොවනු ඇත.

එසේ වූ විටෙක, අපි විසඳුම් සොයන්නට අවශ්‍ය නපුරක්, කරදරයක්, පීඩාවක්, තෙහෙට්ටුවක් හෝ ගැටළුවක් නොපවතී!

වෙහෙස, රාත්‍රයේ අවදිව සිටීම, කල්පනා කිරීම හා ක්‍රියාව කුමකට ද?

නපුර යනු මෙලොව නොවැළැක්විය හැකි අවශ්‍යතාවයකි!

එහෙයින් මේ ගැන සිතා බලන්න.

ඔබ අල්ලාහ්ට අවබෝධයෙන් බැතිමත් වන්න. සැබැවින් ඔබ භාරකාරත්වය පවරනු ලැබූ අයෙකි.

පරීක්ෂණ හා විපත්තියට භාජන වන මිනිසුන් බොහෝ දෙනෙක් දෙවිඳුන් අල්ලාහ් වෙතට යොමු වී ධමර්ිෂ්ඨයින් බවට පත්වෙති. සවර්බලධාරී දෙවිඳුන් ඔහුගේ ප්‍රශංසාව තුළින් අති පිවිතුරුය.

දෙවිඳුන් අල්ලාහ්ගේ සියලුම පූවර් නියමයන් තුළ ප්‍රඥාවක් හා යහපතක් ඇත.

අල්ලාහ්ගේ සියලුම පූවර් නියමයන් මුස්ලිම්වරයා විශ්වාස කළ යුතු වේ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ. "ඔබට උහුද් කන්ද තරම් රන් ආකරයක් තිබී, එය ඔබ අල්ලාහ්ගේ මාගර්යේ වියදම් කළ ද, ඔබ පූවර් නියමය විශ්වාස කර, සැබැවින්ම ඔබට අත් වූ දෑ ඔබට මඟහැරෙන්නට නොතිබුනු එකක් බවත්, ඔබට මඟ හැරුනු දෑ ඔබට ලැබෙන්නට නොතිබූ එකක් බවත් වටහා ගන්නා තෙක්, ඔබෙන් එය අල්ලාහ් පිළිගන්නේ නැත. මේ හැර වෙනත් පදනමක හිඳ කවරෙකු මිය ගියේ ද ඔහු අපා ගින්නට පිවිසෙනු ඇත."(1)

එහෙයින්, අල්ලාහ්ගේ පූවර් නියමයන්, ඒවා යහපත් වුවද නපුරු වුවද එය පිළිගැනීම මුස්ලිම්වරයාට අනිවාය්ර්ය වන්නේය.

නියත වශයෙන්ම, දෙවිඳුන් අල්ලාහ්ගේ සියලු පූවර් නියමයන් යහපත් ය. ඒවායින් සමහරක් පිටතින් නපුරු, දුක්ඛිත හෝ හානියක් ලෙස

(1) සහීහ් සුනන් අබූ දාවූද්, පිටු අංක: 4699.

පෙනුනද, අවසානයේ දැවැන්ත යහපතක් සහ මහා දිව්‍ය ප්‍රඥාවක් එහි අඩංගුවී තිබේ.

## 31- පසු ගිය කාලයේ, ලොවේ ආගම පදනම මත බහුලව හටගත් යුද්ධවලට ආගම හේතුවූනේ ද?

**පිළිතුර:** මනුෂ්‍ය ප්‍රජාව වසර දහස් ගණනක් ඒකදේවවාදයේ නීති සමඟත්, අවුරුදු හාරදහසක් තිස්සේ මහා ආබ්‍රහම් නීති තුන සමඟත් ජීවත් වූ අතර, මානව වගර්යාට සෘජු තජර්නයක් ආගම නියෝජනය නොකළේය. ඒ වෙනුවට එය දේව විශ්වාසියා හා අදේවවාදියා එකඟ වන උත්තරීතර සදාචාරාත්මක වටිනාකම් මනුෂ්‍යත්වයට ඉදිරිපත් කළේය. තවද මූලික වශයෙන් නිවර්යාජ ශිෂ්ටාචාර ස්ථාපිත කළේය. මහපොළොවේ පවතින සෑම යහපතක්ම වක්තෘත්වයේ ප්‍රතිඵලයෙන් සිදු වූවක් බව අපට පැවසිය හැකිය. ආගම විසින්, උසාවි නඩු දහස් ගණනක් විසඳා ඇත. මේ සියල්ලටත් වඩා, ආගම මහපොළොවේ මානව පැවැත්මේ අරමුණ සඳහා දැනුම, හැසිරීම් සහ සාරධමර්වල පදනම දැමුවේය. එමෙන්ම ඒකදේවවාදී නීති පිළිගත්, සංස්කෘතික විවිධත්වයක් ඇති රටවල් අදටත් පවතින අතර ඒවා උල්ලංඝනය කරන්නන් ආරක්ෂා කරමින් ඔවුන්ට එම ඒකදේවවාදී නීති යටතේම ආරක්ෂාවේ වහලක් සපයා ඇත. තව පැත්තකින්, සමහර රටවල් අදේවවාදයට සමීපවූ එක් සියවසරක් තුළ, මුළු මිනිස් සංහතියම විනාශයේ අද්දරයට ඇද වැටිණ! එසේ තිබියදීත් දැන් අදේවවාදීහු අප සමග ආගමෙන් මිනිස් වගර්යාට තිබෙන අනතුර ගැන කතා කරති! අදේවවාදයට වඩා භයානක ක්‍රමයක් මානව ඉතිහාසය දැන සිටියේ නැත. අදේවවාදී ලෙනින් විසින් පැරණි සෝවියට් දේශයේ සිදුවූ ගුලාග් සංහාරය (Gulag Massacres), නාසි ජමර්නියේ වාගරීක සුළු ජාතීන් සමූලඝාතනය කිරීම, අදේවවාදී පොල්පොට් අතින් කාම්බෝජ ජනගහනයෙන් හතරෙන් එකක් හිස් කිරීම, අදේවවාදි මාඕ සේතුං අතින් සංස්කෘතික විප්ලවයේ දී මිලියන 52 ක චීන ජාතිකයන් ඝාතනය කිරීම සහ යුරෝපයේ League of Militant Atheists නම් සටන්කාමී අදේවවාදීන්ගේ සංගමය බිහිවීම, ආගමික ආයතන-ක්‍රිස්තියානි දේවස්ථාන සහ මුස්ලිම් පල්ලි-42,000 ක් නිල වශයෙන් මොවුන් විසින් වසා දමන ලදී. දස දහස් ගණනක් ආගමික බැතිමතුන් මරා දැමුවේය. මේ සියල්ල අදේවවාදය සහ අදේවවාදයේ

මතුවීමේ ස්වභාවික ප්‍රතිඵල හැර වෙනකක් නොවීය.[1]එපමණක් නොව, පළමු හා දෙවන ලෝක යුද්ධය අදේවවාදයේ පදනමක් මත හට ගැනිනි. මානව වගර්යන් පිළිබඳ අදේවවාදී සංජානනයන් සහ වාගරීක පාරිශුද්ධත්වය සඳහා උත්සාහ කිරීමේ අදහස්, එමගින් පාලනය කරනු ලැබීය. එහි ප්‍රතිඵලය වූයේ ලෝක ජනගහනයෙන් 5% ක් පමණ සමූලඝාතනය වීමයි. ලෝක යුද්ධය ජයග්‍රාහකයා සහ පරාජිතයා, ශතවෂර් තුනෙන් එකක් ආපස්සට ඇද දැමීමට හේතුවිය. දාශර්නිකයන් පැරිසි නගරය මැද මුත්‍රා භාජනයක් තැබීම ශිෂ්ටාචාරයේ අවසානය පෙන්වන රූපකයකි. මුළු මිනිස් සංහතියම බොහෝ වාරයක් විනාශ කිරීම සඳහා ප්‍රමාණවත් න්‍යෂ්ටික අවි ගබඩා අදේවවාදී සටන් බිහි කළේය. අදේවවාදය කෙතරම් කාලකණ්ණිද යන්න, විසිවන සියවසරේ යුද්ධ පිළිබඳ සරල කියවීමකින් පෙනේ. අනාගත ඕනෑම සටනක දී මිනිස් සංහතියේ විනාශය වලංගුය යන සංකල්පය අදේවවාදය ඉතිරි කර ඇති අතර, එය වලංගු අදහසයි. එමෙන්ම අපේක්ෂිත අදේවවාදී ස්ථාවර එයයි.

(1) - https://en.wikipedia.org/wiki/League_of_Militant_ Atheists

## 32- බටහිර ඉතා දියුණු මට්ටමින් තිබියදී, මුස්ලිම්වරුන් ඔවුන්ගේ ඒක දේවවාදී ආගම තිබියදීත් ඔවුන් පසුගාමී වූයේ ඇයි?

**පිළිතුර:** මෙය ශිෂ්ටාචාරය පිළිබඳ ප්‍රශ්නයකි!

මෙම ප්‍රශ්නය හමුවේ වක්තෘවරුන් කෙතරම් දුක් වින්ද ද!

මෙම කරුණ හේතුවෙන් ඉවත්ව ගිය අනුගාමිකයින් ප්‍රමාණය කෙතරම් ද!

ශිෂ්ටාචාරය පිළිබඳ ප්‍රශ්නය යුග ගණනාවක් පුරාවටම සමූහයන්ගේ දේව ප්‍රතික්ෂේපයේ මූලාරම්භය විය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "අපගේ වදන් පැහැදිලි ව ඔවුන් වෙත පාරායනය කර පෙන්වනු ලබන විට ප්‍රතික්ෂේප කළවුන් දේව විශ්වාසීන් දෙස බලා '(අප) කණ්ඩායම් දෙකින් නිලයෙන් වඩාත් ශ්‍රේෂ්ඨ හා සභාවෙන් වඩාත් අලංකාර වන්නේ කවරහු දැ'යි විමසීය." 19:73. සූරා මයර්ම්.

දහමේ නිරවද්‍යතාව සනාත කරමින් සාක්ෂි හා සාධක සහිත පාඨ පාරායනය කරනු ලැබූ විට, දේවත්වය ප්‍රතික්ෂේප කරන්නෝ, දේව ප්‍රතික්ෂේපිත සමූහයාගේ ප්‍රගතිය පිළිබඳ තකර් කරති. "(අප) කණ්ඩායම් දෙකින් නිලයෙන් වඩාත් ශ්‍රේෂ්ඨ හා සභාවෙන් වඩාත් අලංකාර වන්නේ කවරහු ද?"

පයෙර්ෂක ඉබ්රාහිම් අල්-සක්රාන් (හෆිළහුල්ලාහ්) තුමා මෙසේ පවසයි: "මෙය ඓතිහාසික සැබෑව සහ නියමයවේ. පුදුමය නම්, යුග ගණනාවක් මුළුල්ලේ දිගටම පැවතීමයි. අනාවැකිවල ආරම්භයේ සිට සමකාලීන ඉස්ලාමීය ක්‍රියාකාරීත්වයේ මොහොත දක්වා, දෙවියන් වහන්සේ ගැන සන්නිවේදනය කළ බහුතරයක්, සෑම විටම තමන් අභිබවා යන "ද්‍රව්‍යමය බලවේගයන්ට" මුහුණ දී සිටින අතර තමන් සමඟ ඇති හෙළිදරව්ව අනුගමනය කිරීමට මිනිසුන් පොළඹවයි.

වක්තෘවරුන්ගේ අත්දැකීම් දෙස බලන්න; ඔවුන් සියල්ලම පාහේ "දිව්‍යමය එළිදරව්ව" ඇමතීම සහ "ද්‍රව්‍යමය ශක්තියේ" අබර්ුදය අතර ගැටුම ගැන කථා කරන නියෝජිතයින් බව ඔබට පෙනී යනු ඇත. භෞතික බලය කෙරෙහි මිනිසුන්ගේ ආකෂර්ණය, ඔවුන්ගේ හදවත් වශී කරවන

අතර හෙළිදරව්වට යටත් වීමෙන් හා අවනත වීමෙන් ඔවුන්ගේ අවදානය වෙනතකට යොමු කළ බව ඔබට පෙනෙනු ඇත. ආගම වෙනුවෙන් ක්රියාකාරීව කටයුතු කරන උදවිය, භෞතික වස්තු සම්බන්ධයෙන් වන මිනිසුන්ගේ ආකෂර්ණය හේතුවෙන් බොහෝසේ දුක් විඳින බව ඔබට පෙනී යනු ඇත.

පළමු දූතයා වූ නූහ් නබි (අලෛයිහිස් සලාම්) තුමාට ඔහුගේ ප්රජාව පැහැදිලිව සියලුම ආකාරයේ භෞතිකත්වයන් පිළිබඳ මෙසේ පවසා සිටියෝය. "එමෙන්ම අපට වඩා පහත් ගම්බද අදහස් ඇති අය හැර වෙනත් කිසිවකු නුඹ ව අනුගමනය කරනු අපි නොදකිමු." 11:27. සූරා හූද්.

අල්ලාහ්ගේ නබි මෝසස් පෙනී සිටි විගසම, දිව්ය හෙළිදරව්වට එරෙහිව, ජනතා බලයේ කුරිරු පාලනය සහ උඩඟුකම මාලාව නැවතත් පුනරාවතර්නය විය.

"අපගේ පරමාධිපතියාණනි! නුඹ ෆිඅර්වුන්ට හා ඔහුගේ ප්රධානීන් හට නුඹගේ මාගර්යෙන් ඔවුන් නොමඟ යනු පිණිස මෙලොව ජීවිතයේ වස්තුව හා අලංකාරය පිරිනැමුවෙහිය." යැයි මූසා පැවසීය. 10:88. සූරා යූනුස්.

අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් විෂයයෙහි ද එම තත්ත්වය අලුත් දෙයක් නොවීය. එතුමාගේ නබිත්වය සහ එතුමා සතුව තිබූ දිව්යමය හෙළිදරව්ව ප්රතික්ෂේප කළ අය, එතුමාගේ භෞතික සම්පත්වල දුවර්ලතාවය නිසා එතුමාගෙන් ඉවතට හැරීමට ඇලී සිටියහ. "තවද “මෙම කුආර්නය ගම්මාන දෙකෙහි ප්රබල මිනිසෙකු වෙත පහළ කරනු ලැබිය යුතු නොවේද?” යැයි ඔවුහු පැවසුවෝය." 43:31. සූරා අස්-සුඛ්රුෆ්.

ඉබ්රාහීම් අල්-සක්රාන්ගේ අවසන් ප්රකාශය.

කාලය පුරාවටම, වක්තෘත්ව ඉතිහාසය පුරාවටම මිනිසා පරීක්ෂණයට ලක්වීමේදී දේවත්වය ප්රතික්ෂේප කරන්නන්ගේ වස්තුව කෙරෙහි ඇති ආකෂර්ණයේ අබර්ුදය ඉමහත් විය.

ප්රගතිය සහ සත්යය අතර සම්බන්ධයක් මූලික වශයෙන් නැතත්. (එය එසේ සිදු විය)

භෞතික වශයෙන් දියුණුව සහ නොදියුණුකම සම්බන්ධයෙන්, කවුරු හරිද කවුරු වැරදිද යන්න අදාල නැත.

යමෙක් සිල්වත්, ධාමරීක මිනිසකු වීම සඳහා, ඔහු නවීන ශිෂ්ටාචාරයේ අයෙක් විය යුතුයැයි අවශ්‍ය නැත.

කෙනෙක්, ඉස්ලාමයේ ඉගැන්වීම් වලට කැපවී සිටිය හැකි නමුත් ඔහු චාම්, දුප්පතෙක් විය හැකිය; හෝ එයට වෙනස් කෙනෙක් විය හැකිය.

භෞතිකමය වශයෙන් දියුණු සමූහයන් තිබූ නමුත්, ඔවුන් අල්ලාහ්ගේ පිළිවෙතින්, ඔහුගේ දහමින් හා ඔහුගේ හෙළිදරව්වෙන් බොහෝ සේ දුරස්ව සිටියෝය. "මහපොළොවේ සැරිසරා ඔවුනට පෙර සිටියවුන්ගේ අවසානය කෙසේ වී දැයි ඔවුහු නොබැලුවෙහු ද? ඔවුහු මොවුනට වඩා ශක්තිසම්පන්නයෙන් අධික වූහ. ඔවුහු මහපොළොවේ අස්වැද්දූහ. මොවුන් පාලනය කළ දැට වඩා ඔවුහු එය අධික ලෙස පරිපාලනය කළෝය." 30:9. සූරා අර්-රූම්.

ද්‍රව්‍යමය ප්‍රගතිය (භෞතිකමය දියුණුව) සහ මූල්‍ය ධනය යන කරුණු දෙක, සත්‍ය මත සිටින තැනැත්තකුට නිර්ණායකයක් නොවේ. "එවිට ඔවුන් වෙත ඔවුන්ගේ දහම් දූතවරුන් පැහැදිලි සාධක සමග පැමිණි කල්හි, තමන් වෙත තිබෙන දැනුම ගැන ඔවුහු (අහංකාරයෙන් යුතු ව) සතුටින් සිටයහ. ඔවුන් කවර දෙයක් පිළිබඳ සමච්චල් කරමින් සිටියේ ද එය ඔවුන් වටකර ගත්තේය." 40:83. සූරා ගාෆිර්.

එබැවින් ද්‍රව්‍යමය දියුණුව පමණක් ප්‍රශංසනීය නොවේ; එමෙන්ම නින්දාවක් ද නොවේ. ඒ වෙනුවට, එය ප්‍රශංසනීය වනුයේ, දිව්‍යමය හෙළිදරව්වෙන් ඔහු පිවිතුරු වන ප්‍රමාණයට, ඔහු තුළ ආගම ක්‍රියාත්මක කරන ප්‍රමාණයටය. එමෙන්ම ඔබේ දහමෙහි, ඔබ එයින් ප්‍රයෝජන ලබන ප්‍රමාණයටය, දෙවිඳුන් අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා මිනිසුන්ට සෙත සැළසීමේ සහ ඔවුන්ගේ තත්ත්වයන් විධිමත් කිරීමේ දී ඔබ එය භාවිතා කරන ප්‍රමාණයටය.

මෙයයි අපේක්ෂිත ප්‍රගතිය / දියුණුව වන්නේ.

මිනිසුන් අතර සැබෑ ශ්‍රේෂ්ඨභාවයේ නිර්ණායක වනුයේ ඔවුන්ගේ භෞතික දියුණුව මත නොව, ධාමරීක හා දැහැමි ක්‍රියාවන්හි වෙනස මතවේ. ද්‍රව්‍යමය දියුණුව පැමිණෙන්නේ උපායක් ලෙස පමණි. එය අරමුණක් නොවේ. එනම්, දෙවිඳුන් වෙනුවෙන් මිනිසුන්ට සේවයක් හා යහපතක් ගෙන දීමට වන මාගර්යක් ලෙසය.

මේ අනුව, එය දිව්‍යමය හෙළිදරව්වෙන් ප්‍රශංසාවට ලක්වූ ද්‍රව්‍යමය ප්‍රගතියක් බවට පත් වනු ඇත. අපේක්ෂිත ප්‍රගතිය එයයි.

පෘථිවියේ සැබෑ උරුම ක්‍රමය මෙයයි. එනම්: දෙවිඳුන් අල්ලාහ්ට පෙන්වන වහල්භාවයේ උරුම ක්‍රමය සහ ජීවිතයේ සෑම අංශයක් සඳහාම දේව විශ්වාසය සමග බැඳුණු පිවිතුරු කිරීමේ උරුම ක්‍රමයයි. "ඔවුහු වනාහි මහපොළොවෙහි අපි ඔවුනට බලය ලබා දුන්නේ නම් ඔවුහු සලාතය විධිමත් ව ඉටු කරති. තවද සකාත් පිරිනමති. තවද යහපත විධානය කොට අයහපතින් වළක්වති. සියලු කරුණු වල අවසානය අල්ලාහ් සතුය." 22:41. සූරා අල්-හජ්.

මුස්ලිම්වවරයකු තමන්ට පැවරුණු වගකීම් ඉටු කළ විට, සෑම යහපතකට ම හා සතුටු දායක කරුණකටම තුඩු දෙන හේතු සාධක අල්ලාහ් ඔහුට පහසු කර දෙනු ඇත. එමෙන්ම ඔහු මෙලොවෙහි දියුණුවට පත්වන අතරම. මතුලොවෙහි ජය ලබා එහි උසස්වීම් ද ලබනු ඇත යැයි දැන ගනු. "නුඹලා අතතරින් දෙවියන් විශ්වාස කොට යහකම් කළවුනට ඔවුනට පෙර සිටියවුන්ට බලය ලබා දුන්නාක් මෙන් මහපොළොවේ ඔවුනට ද බලය ලබා දෙන බවද, ඔවුන් වෙනුවෙන් ඔහු පිළිගත් දහම (අනුගමනය කිරීමට) ඔවුනට ඉඩ සලසා දෙන බව ද, ඔවුනට ඇති වූ බියෙන් පසු ව සුරක්ෂිත තත්ත්වයකට ඔවුන් වෙනස් කරන බව ද, අල්ලාහ් ප්‍රතිඥා දුන්නේය. ඔවුහු මට කිසිවක් ආදේශ නොකර මට නමදින්(කරන තුරු මෙම ප්‍රතිඥාව ලබන්)නෝය. " 24:55. සූරා අන්-නූර්.

මුස්ලිම්වරු ඔවුන්ගේ දහම නිසි අයුරින් ක්‍රියාත්මක කළ විට, ඔවුහු මෙලොව, ආගම මෙන්ම ලෞකික දැ හි නායකයින් බවට පත් වනු ඇත.

ඔවුන් අතින් වසර 1200 ක් පුරා විහිදුණු ශිෂ්ටාචාරයක් ඉස්ලාමය ඉදිරිපත් කළේය, මෙම කාල පරිච්ඡේදය, කිසිදු බාධාවකින් හෝ විසන්ධි වීමකින් හෝ තොරව අඛණ්ඩව පැවති දීඝර්තම ශිෂ්ටාචාරයයි.

ඉස්ලාමය තුළින් ඉස්ලාමීය ශිෂ්ටාචාරය බිහි විය.

(එසේ කීමට හේතුව) ශිෂ්ටාචාරයක් බිහි කළ එකම දහම මෙයවේ.

විවිධ ශිෂ්ටාචාරයන් විසින් සෙසු ආගම් වැළඳගනු ලැබීය.

ඒ අනුව, කිතුනු දහම බටහිර ශිෂ්ටාචාරය වැළඳ ගෙන තිබීමත්, හින්දු දහම ඉන්දියානු ශිෂ්ටාචාරය වැළඳ ගෙන තිබීමත් ඔබට දැකගත හැක.

මේ හේතුවෙන්, ශිෂ්ටාචාරයක් බිහි කළ එකම දහම වනුයේ ඉස්ලාමයයි.

මුස්ලිම්වරු, තම දහම පිළිබඳව, එයට අවශ්‍ය දේ ගැන දැනගත් විට, ඔවුන් භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් ලෝකය මෙහෙය වන්නට වූහ.

ක්‍රි:ව 1453 දී ඉස්ලාම් කොන්ස්තන්තිනෝපලයට ඇතුළු වූ විට, යුරෝපයේ අඳුරු මධ්‍ය කාලීන යුගය අවසන් විය.

නියතවශයෙන්ම, වෂර් 1453 දී යුරෝපය තුළට ඉස්ලාමය පිවිසීමත් සමඟම, එම වසරේම එහි අඳුරු යුගය අවසන් වීය.

ඉස්ලාමය යුරෝපයේ හදවතට ඇතුළු වූ වහාම, දැනුමේ ආලෝකය එහි බැබළුණි.

කොන්ග්‍රස් පුස්තකාලයේ, එහි ප්‍රධාන ශාලාවේ සිවිලිමේ බටහිර ශිෂ්ටාචාරයේ ප්‍රගතියේ මූලාශ්‍ර දැක්වෙන කව (circles) කැටයම් කර ඇති අතර, කව හතෙහි සඳහන් එකම ආගම ඉස්ලාම් වේ.

එහි සඳහන් කරන ලද එකම ආගම ඉස්ලාමය වන අතර, එයට හේතුව විද්‍යාවන් (science) ඉස්ලාමයට සම්බන්ධවීම නිසාය.

ISLAM: PHYSICS ඉස්ලාම්: භෞතික විද්‍යාව

සෙසු කවයන් තුළින් රටවල්වල නම් විශේෂයෙන් සඳහන් කර තිබුණු අතර මෙම රටවල් ඉදිරිපත් කර ඇත්තේ සාහිත්‍ය, කලාත්මක හෝ භාෂාමය ප්‍රගතියයි!

නමුත් ඉස්ලාම් විද්‍යාව හඳුන්වා දුන් අතර වසර 700ක් පුරා ලෝකයේ විද්‍යාවේ ජාත්‍යන්තර භාෂාව වූයේ: අරාබි භාෂාවයි.[1]

මුස්ලිම්වරු තම ආගමික කටුයුතු විධිමත් කරගන්නා විට, ඔවුන්ගේ ලෞකික කටයුතු (ද) විධිමත් වනු ඇත.

(1) https://www.telegraph.co.uk/news/science/science-news/3323462/Science-Islams-forgotten-geniuses.html

## 33 - තේජාන්විත සුවිශුද්ධයාණන් වන අල්ලාහ්ට නැමදුම් කිරීමේ ප්‍රතිඵල මොනවාද?

**පිළිතුරු:** මිනිසා ස්වභාව ධර්මයෙන් තමාව නොහඳුනයි, ඔහුගේ ආත්මය සන්සුන් නොවේ, දෙවියන් වහන්සේට නැමදුම් කිරීමෙන් මිස ඔහුගේ සිත සැනසීමට පත්වන්නේ නැත. "විශ්වාස කළවුන් වනාහි ඔවුන්ගේ හදවත් අල්ලාහ් ව මෙනෙහි කිරීමෙන් සැනසුමට පත් වෙති. දැන ගනු, අල්ලාහ් ව මෙනෙහි කිරීමෙන් හදවත් සැනසුමට පත් වේ." 13:28. සූරා අර්-රඃද්.

ඒ අනුව, නැමදුම තුළින් හදවත සැනසුමට පත්වන්නේය. "තවද නියත වශයෙන්ම නුඹේ හදවත ඔවුන් පවසන දැයින් පීඩනයට පත් ව ඇති බව සැබැවින්ම අපි දනිමු." 15:97. "එහෙයින් නුඹ නුඹගේ පරමාධිපතිගේ ප්‍රසංශා ව තුළින් පිවිතුරු කරනු. තවද නුඹ සිරස නමා සුජූද් කරන්නන් සමග වනු."15:98. "...නුඹේ පරමාධිපතිට නුඹ නැමදුම් කරනු." 15:99. සූරා අල්-හිජ්ර්.

ඔබ ඔබේ පරමාධිපතිට නැමදුම් කරන්න. එවිට ඔබේ හදවත සැනසුමට පත්වනු ඇත.

එම නිසා, මිනිස් ආත්මයට පැය ගණනක් මනෝවිද්‍යාත්මක සන්සුන් සැසිවලින් සිදුනොකරන දේ, නිහතමානීව සහ යටහත් පහත්ව මෙනෙහි කිරීමකින් යුත් රකආත් දෙකක් සිදු කරයි.

නියතවශයෙන්ම, නැමදුම තුළ මිනිස් ආත්මයේ සන්සුන් භාවය ඇත. දෙවියන් සිහිපත් කිරීමෙන් දුරස් වන සෑම කෙනෙකුගේම හදවත පීඩනයට පත් වේ. ඔහු නිතරම ලෞකික වාසිය ගැන ආශාවෙන් පසුවන බව ඔබට පෙනේ. නමුත් ඔහු තෘප්තිමත් වන්නෙකු හෝ සෑහීමට පත්වන්නෙකු හෝ නොවේ. "මා මෙනෙහි කිරීමට කවරෙකු පිටුපෑවේ ද එවිට නියත වශයෙන්ම ඔහුට පීඩිත ජීවිතයක් ඇත." 20:124. සූරා තාහා.

පුද්ගලයෙකු දේව විශ්වාසයෙන් තොරව කෙතරම් සැපවත් ජීවිතයක් ගත කළ ද, ඔහු ජීවත් වනුයේ කැළඹිලි ගොඩක් තුළය. නොදන්නා දේට එරෙහිව, අවසන් නොවන උමතු තරඟයක නිරත වේ. එබැවින් ඔහු සැමවිටම කණස්සල්ලෙන් පසුවනු ඔබ දකිනු ඇත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: "කවරෙකුගේ අභිලාශය මෙලොව පමණක් වූයේ ද ඔහුගේ කටයුතු අල්ලාහ් අවුල් කරනු ඇත. ඔහුගේ දරිද්‍රතාවය ඔහුගේ දෑස් ඉදිරියේ තබනු ඇත. ඔහුට නියම වූ දෑ මිස වෙනත් කිසිවක් මෙලොවෙහි ඔහුට නොලැබෙනු ඇත. කවරෙකුගේ චේතනාව මතුලොව වූයේ ද, ඔහුගේ කටයුතු අල්ලාහ් ඔහුට නිරවුල් කරනු ඇත. ඔහුගේ සිතෙහි පොහොසත්කම ඇති කරනු ඇත. ලෝකය, කැමැත්තෙන්ම ඔහු වෙත පැමිණෙනු ඇත.[1]

නැමදුම, ලෞකික ජීවිතයට වහල්වීමෙන් මුස්ලිම්වරයා මුදවා ගනියි. තවද, ඔහුව නිදහස් පුද්ගලයකු බවට පත් කරයි.

එහෙයින්, සැබෑ ලෙසින් අල්ලාහ්ට නැමදුම් කරන මුස්ලිම්වරයා ජීවිතයේ අථර්ය, මොලොවේ වටිනාකම, මෙලොවෙහි ඔහුගේ පැවැත්මේ අරමුණ වටහා ගනී. එමෙන්ම සැබැවින්ම ඔහු මෙලොව පරීක්ෂා කරනු ලබනු ඇතැයි ද, ඔහු ඔහුගේ පරමාධිපතිට නිසි පරිදි නැමදුම් කළ යුතු බවද වටහා කනී. එය එහි තේරුමක් නොමැතිව, කණගාටුවෙන් ජීවත් වීමට නොවේ. සුවිශුද්ධ අල්ලාහ් මෙසේ පැවසීය. "ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. (මන්ද) නුඹලා අතුරින් කවරෙකු ක්‍රියාවෙන් වඩාත් අලංකාර දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය." 67:2. සූරා අල් මුල්ක්.

## 34:- උත්තරීතර අල්ලාහ්ට යටහත් වීම පෙන්නුම් කරන සාධක මොනවා ද? වෙනත් වචනයෙන් විමසන්නේ නම්, ඔබ අල්ලාහ්ට සම්පූර්ණ ලෙස යටහත් වූ තැනැත්තෙකු යැයි ඔබ දැනගන්නේ කෙසේද?

**පිළිතුර:** උත්තරීතර අල්ලාහ්ට යටහත් වීමේ සළකුණු හතරකි.

**පළමුවැන්න: ඔබේ ජීවිතයේ සුළු හෝ මහා, සියලුම කටයුතුවලදී ඔබ අල්ලාහ්ට දක්වන ගැතිභාවය.** අල්ලාහ් මෙසේ පවසයි. "සැබැවින්ම මාගේ සලාතය, මාගේ කැප කිරීම, මාගේ ජීවිතය මාගේ මරණය ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් වෙනුවෙනි." 6:162. "ඔහුට සමාන කිසිවකු නොමැත. තවද, මේ ගැන මම නියෝග කරනු

(1) සහීහ් සුනන් අත්-තිර්මිදි, පිටුව: 2465.

ලද්දෙමි. තවද මම මුස්ලිම්වරුන්ගෙන් පළමු වැන්නා වෙමි." 6:163. සූරා අල්-අන්ආම්.

මාගේ සලාතය, මාගේ කැප කිරීම, මාගේ ජීවිතය, මාගේ මරණය ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් වෙනුවෙනි: එනම් සෑම කටයුත්තක්ම මම අල්ලාහ් වෙනුවෙන් සිදු කරමි. අල්ලාහ් වෙනුවෙන් නැමදුම් ඉටු කරමි. අල්ලාහ් වෙනුවෙන් මාගේ දෙමව්පියන්ට කීකරු වෙමි. අල්ලාහ් වෙනුවෙන් මිනිසාට වඩාත් ප්රයෝජනවත් වන අයුරින් හදාරමි, මෙනෙහි කරමි. අල්ලාහ් කවර කරුණක් මට අණ කර ඇත්තේ ද එය ක්රියාත්මක කිරීමෙහි හෙට දින වඩාත් බලවත් අයකු වනු පිණිස මම නින්දට යමි.

මෙය, සෑම කටයුත්තකදීම අල්ලාහ්ට පෙන්වන ගැතිභාවයයි. අල්ලාහ්ට තමන් යටත් බවට පෙන්වා දෙන ප්රධානතම සලකුණ හා සංඥාව මෙය වේ.

**දෙවන සලකුණ වන්නේ, පූර්ණ යටහත් භාවයෙන් යුතුව අල්ලාහ්ට අවනත වන්නකු වීමය.** එනම් අල්ලාහ් කවර දෙයක් නියෝග කර ඇත්තේ ද ඒවා පිළිපදිමින් හා ඔහු කවර දෙයකින් වැළැක්වූයේ ද එයින් වැළකී සිටිමින් ඔහුට අවනත වීමය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "අහෝ විශ්වාස කළවුනි!, නුඹලා අල්ලාහ්ට හා ඔහුගේ ධර්ම දූතයාණන්ට අවනත වනු. නුඹලා ඔහුට සවන් දෙමින්ද (ඔහුගේ අණට පිටුපා) ඔහුගෙන් නුඹලා හැරී නොයනු." 8:20. සූරා අල්-අන්ෆාල්.

කීතරීමත් සවර්බලධාරී අල්ලාහ් මෙසේ පැවසීය. "අහෝ විශ්වාස කළවුනි!, නුඹලා සාමය (නම් ඉස්ලාමය) තුළට මුළුමණින්ම පිවිසෙනු." 2:208. සූරා අල්-බකරා.

සාමය තුළට එනම්: ඉස්ලාමයට තුළට යන්නයි.

"නුඹලා සාමය (නම් ඉස්ලාමය) තුළට මුළුමණින්ම පිවිසෙනු." එනම්: අල්ලාහ් නියෝග කළ සෑම දෙයක්ම පිළිපදිනු. ඔහු තහනම් කළ සෑම දෙයකින්ම වැළකී සිටිනු.

මට අල්ලාහ් කවර කරුණක් නියෝග කර ඇත්තේ ද මම එය සිදු කරමි. ඔහු මට කවර කරුණක් තහනම් කර ඇත්තේ ද මම එයින් වැළකී සිටිමි. අල්ලාහ්ට අවනත වීමේ හා යටත්වීමේ පූර්ණභාවය මෙයයි.

**අල්ලාහ්ට යටහත් භාවය පෙන්වන තුන්වන සළකුණ: අල්ලාහ් නීති ගත කළ තීන්දු ක්‍රියාත්මක කිරීම තුළින් ඔහුට යටත් වී,** ඔහුගේ නීතිය ගැන සෑහීමට පත් ව, එය අපි පිළිගැනීමය.

දිව්‍ය නීති සියල්ලම පාගේ අප පිළිගත යුතුය. උදාහරණයට අල්ලාහ් නීති සම්පාදනය කර ඇති දඬුවම් ප්‍රතික්ෂේප නොකරමු. අල්ලාහ්ගේ නිතිය අප පිළිගත යුතු වේ. ඔහුගේ මැවීම්වලට යහපත් වන්නේ කුමක්දැ?යි දන්නේ ඔහුය. සැබැවින්ම දණ්ඩ නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් සමාජයට සුගතියක් වන බව දන්නේ ඔහුය. "මැවුම් කරුවා නොදනිත් ද? ඔහු සියුම්දේ දන්නාය." 67:14 සූරා අල්-මුල්ක්.

තවදුරටත් සුවිශුද්ධ අල්ලාහ් මෙසේ පවසයි: "පූර්ණ විශ්වාස කරන පිරිසට අල්ලාහ් හැර විනිශ්චය දීමේ විශිෂ්ඨයා කවරෙක්ද?" 5:50. සූරා අල් මාඉදා.

## මිනිසුන්ට ඔවුන්ගේ ලෞකික කටයුතු වලදී මෙන්ම ඔවුන්ගේ මතුලොව කටයුතුවලදී ඔවුනට වඩාත් යහපත් වන්නේ කුමක්දැයි දන්නේ අල්ලාහ්ය.

## අල්ලාහ්ගේ නීතිය ක්‍රියාත්මක කිරීමෙන් මිනිසුනට සුගතය ඇති වන්නේය. සුරක්ෂිතව ජීවත්වන්නට ඔවුනට ඉඩ සලාසා දෙන්නේය.

අල්ලාහ් හා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට පහළ කළ දෑ තමන් විශ්වාස කරන බව පැවසූ තැනැත්තෙකු, අල්ලාහ්ගේ දූයාණන් ඔහු අකමැති තීන්දුවක් ඔහුට පිරිනමනු ඇතැයි යන බියෙන්, එතුමා වෙත යෑම වෙනුවට තීන්දු පතා, කඃබ් ඉබ්නු අල්-අෂ්රෆ් නම් යුදෙව් වාසී වෙත ගියේය. එසේ ඔහු එම යුදෙව්වා වෙත ගියේ ඔහු ප්‍රිය කරන තීන්දුවක් ඔහුට ලබා දෙනු ඇතැයි යන ආශාවෙනි. එවිට උත්තරීතර අල්ලාහ් මෙම ප්‍රකාශය පහළ කළේය. "නුඹ වෙත පහළ කරනු ලැබූ දෑ ද නුඹට පෙර පහළ කරනු

ලැබූ දෑ ද ඇත්තෙන්ම තමන් විශ්වාස කළ බවට සිතමින් සිටි අය දෙස නුඹ නොබැලුවෙහි ද? ඔවුහු නපුරු බලවේගයන් වෙත තීන්දු පැතීමට අපේක්ෂා කරති. සැබැවින්ම එය ප්‍රතික්ෂේප කරන ලෙස ඔවුහු නියෝග කරනු ලැබ සිටියහ. තවද ෂෙයිතාන් අන්ත මුළාවක ඔවුන් ව මුළා කිරීමට අපේක්ෂා කරයි." 4:60. සූරා අන්-නිසා.

ඔබ අල්ලාහ්ට අවනත වන මුස්ලිම්වරයකු වී නම්, අල්ලාහ්ගේ නීතිය පිළිපැදීම ඔබට අනිවාර්ය වේ. අල්ලාහ්ගේ තීන්දුව ඔබ අකැමැති තීන්දුවක් වුව ද අල්ලාහ්ගේ එම තීන්දුවට යටත් විය යුතු වේ. අල්ලාහ්ගේ නීතිය අත්හැර දමා, ඔබ කැමති අයුරින් තීන්දුවක් පැතීමේ ආශාවෙන් යුදෙව්වෙකු ළඟට යෑම සුදුසු වන්නේ නැත.

පහත සඳහන් පාඨවල උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

"අල්ලාහ්ගේ අනුමැතියෙන් පිළිපදිනු ලැබීමට මිස කිසිදු ධර්ම දූතයකු අපි නොඑව්වෙමු." 4:64. සූරා අන්-නිසා.

දේව නීතිය අත්හැර දමා වෙනත් නීතියක් වෙතින් තීන්දු පතනු පිණිස අල්ලාහ් දහම් දූතවරු එව්වේ නැත.

පසුව මෙම සිදුවීමෙන් හා මේ හා සමාන සිදුවීම්වල පාඩම අල්ලාහ් අවසන් කරනුයේ ඔහුගේ නීතියට අනුව තීන්දු පැතීම සඳහා යටහත් භාවයේ අවශ්‍යතාව පැහැදිලි කරන වැදගත් පාඨයක් ගෙන හැර පාමිනි. කීතරීමත් සවර්බලධාරී අල්ලාහ් මෙසේ පැවසීය. "(නබිතුමණි!) එසේ නොව, නුඹගේ පරමාධිපති මත දිවුරමින්! ඔවුන් අතර ඇති වුණු ගැටලුවක දී, ඔවුන් නුඹව විනිශ්වය කරුවෙකු ලෙස පිළිගෙන, පසුව නුඹ දුන් තීන්දුවේ කිසිදු වරදක් ඔවුන් තුළ නොදැක, ඔවුන් පූර්ණ ව අවනත වන තෙක් ඔවුන් විශ්වාස නොකරනු ඇත." 4:65. සූරා අන් නිසා.

අල්ලහ්ගේ නීතියට පූර්ණ ලෙස යටත් විය යුතු වේ. අල්ලාහ්ගේ නීතියට යටත් වීම යන ඉස්ලාමයට අවනත වීම වේ.

**උත්තරීතර අල්ලාහ්ට යටත් වීම පෙන්වා දෙන සිව්වැනි සළකුණ වනුයේ,** අල්ලාහ්ගේ පූවර් නියමයන්ට යටත්වීමය. සෑම දෙයක්ම ශුද්ධ වූ අල්ලාහ් නියම කර ඇත්තේ ඔහුගේ ප්‍රඥාවට අනුවය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුස්ලිම්වරයෙක් හොඳ හා නරක යන ඔහුගේ සියලුම පූවර් නියමයන් තුළ අල්ලාහ්ට යටත් වෙයි.

මුස්ලිම්වරයාට යම් සතුටක් ඇති වූ විට ඔහු කෘතඥ වෙයි. ඔහුට යම් පීඩාවක් ඇති වූ විට ඔහු එය ඉවසා දරා ගනියි.

යම් ආහාරයක් හෝ යහපත් පෝෂණ සම්පතක් හෝ අලංකාර නිවසක් හෝ අධ්‍යාපන කටයුතුවල සාර්ථකත්වයක් හෝ ශරීරයේ සුවයක් හෝ දැහැමි පවුලක් හෝ අල්ලාහ් ඔබට පිරිනමා ඇත්නම්, ඔබ ඔහුට කෘතඥ පූර්වක වන්න.

එසේ නොව, යම් රෝගාබාධයකින් හෝ දරිද්‍රතාවයකින් හෝ බියකින් හෝ විපතකින් හෝ ශෝකයකින් හෝ මුස්ලිම්වරයකුට පීඩාවන් ඇති වූයේ නම්, එම පීඩාවන් මත ඔහු ඉවසා අල්ලාහ්ගෙන් උදව් පතනු ඇත. මෙය, ශුද්ධ වූ පරමාධිපතිට යටත් වන, ඔහුට අවනත වන මුස්ලිම්වරයකුගේ තත්ත්වයයි.

ඒ අනුව සුවය, රෝගී බව, පොහොසත්කම, දුප්පත්කම යනාදී සියලුම කටයුතු අල්ලාහ්ගේ නියමය අනුව පිහිටයි. සියලුම දෑ ඔහුගේ පූර්ව නියම කිරීම් අනුව හා ඔහුගේ ප්‍රඥාවට අනුව සිදු වනු ඇත. පූර්ව නියමය පිළිගැනීම මුස්ලිම්වරයාගේ යුතුකමකි. හේතුව ඒවා නියාමනය කරනුයේ අල්ලාහ් වන බැවිනි.

අපගේ ශුද්ධ වූ දෙවිඳාණන් මෙසේ පැවසීය. "නියත වශයෙන්ම අපි සෑම දෙයක්ම නියමිත ප්‍රමාණයකින් යුතු ව මැව්වෙමු." 54:49. සූරා අල් කමර්.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "අල්ලාහ් අපහට නියම කළ දෑ හැර වෙනත් කිසිවක් අපට සිදු නොවන්නේමය." 9:51. සූරා අත්-තව්බා.

අපට අල්ලාහ් නියම කළ දෑ හැර වෙනත් කිසිවක් අපට අත් වන්නේ නැත.

උත්තරීතර ප්‍රකාශකයා මෙසේ පවසයි: "අල්ලාහ්ගේ අනුමැතියෙන් තොරව මරණයට පත්වීම කිසිදු ආත්මයකට යුතු නොවී ය." 3:145. සූරා ආලු ඉම්රාන්.

අපගේ ආයු කාලය නිර්ණය කර ඇත්තේ අල්ලාහ්ය.

විශ්වයේ හට ගැනෙන සෑම කරුණක්ම, විශ්වය තුළ ගමන් කරන සෑම අණුවක්ම, විශ්වයේ සිදුවන සෑම සිදුවීමක්ම ඒවා සිදුවනුයේ අල්ලාහ්ගේ දැනුම, අල්ලාහ්ගේ අභිමතය, අල්ලාහ්ගේ සැළසුම, අල්ලාහ්ගේ ප්‍රඥාව හා අල්ලාහ්ගේ පූර්ව නියමය අනුවය.

අපගේ ශුද්ධ වූ දෙවිඳාණන් මෙසේ පැවසීය. "තවද ඔහු සෑම දෙයක්ම මවා පසුව එය නිර්ණයකින් නිර්ණය කළේය." 25:2. සූරා අල්-ෆුකර්ාන්.

සුවිශුද්ධයාණන් වන ඔහු සියලු දෑ මැව්වේය. සියලු දෑ සැළසුම් කළේය. ඔහු අභිමත කරන දෑ සිදු විය. ඔහු අභිමත නොකළ දෑ කිසිවිට සිදු නොවීය.

මා මුස්ලිම්වරයකු වශයෙන් තේජාන්විත අල්ලාහ්ගේ නියමයන් සියල්ලට අවනත විය යුතු වේ. එය මගෙන් අපේක්ෂා කරනු ලබන්නකි.

මිනිසකු අල්ලාහ්ට අවනත වන පුද්ගලයකු වන්නේ මෙතුළිනි.

## අවසාන වශයෙන් මම ඉස්ලාමයට ඇතුල් වන්නේ කෙසේද?

ඉස්ලාමය යනු මුළු මිනිස් සංහතිය සඳහා වූ දෙවිඳුන් අල්ලාහ්ගේ දහමයි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "සැබැවින්ම අල්ලාහ් අබියස (පිළිගනු ලබන) දහම ඉස්ලාමයයි." 3:19. සූරා ආලු ඉම්රාන්

ඉස්ලාමය යනු එය හැර වෙනත් කිසිදු දහමක් දෙවිඳුන් විසින් පිළිගන්නේ නැති දහමයි. "කවරෙකු ඉස්ලාමය හැර වෙනත් දහමක් සොයන්නේ ද එවිට ඔහුගෙන් කිසිවක් පිළිගනු නොලබන්නේ ම ය. තවද ඔහු මතු ලොවෙහි අලාභ වන්තයින් අතුරින් කෙනෙකි." 3:85. සූරා ආලු ඉම්රාන්

## එබැවින් ඉස්ලාමය වැළඳ ගැනීම සෑම පුද්ගලයකුටම අනිවාර්ය වන්නේය.

අපා ගින්නෙන් මිදීමත්, අල්ලාහ්ගේ තෘප්තිය හා ස්වර්ග හිමිවීමෙන් ලැබෙන ජයග්රහණයත් ඇත්තේ ඉස්ලාමය තුළය.

ඉස්ලාමය තුළට පිවිසීම, අතිමහත් ආශිවර්ාද අතරින් ඉමහත්ම ආශිවර්ාදය වේ. එ පමණක් නොව එය ඔබ ලබන අති වැදගත් හා ඉමහත් කරුණකි.

ඉස්ලාමය යනු සැබැවින්ම සහජ ස්වභාවය සහ විචාර බුද්ධිය වෙත නැවත පැමිණීමකි.

ඉස්ලාමය තුළට පිවිසීම යනු පහසු කායර්යකි. ඒ සඳහා නීතිමය කරුණු හෝ චාරිත්ර වාරිත්ර හෝ අවශ්ය වන්නේ නැත. මිනිසා සාක්ෂි දැරීමේ

ප්‍රකාශ දෙක පැවසීම ප්‍රමාණවත්ය. එනම් "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු;

**වඅෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්" (නැමදුමට සුදුසසා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැතැයි මම සාක්ෂි දරමි. සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවත් මම සාක්ෂි දරමි.) යන ප්‍රකාශ දෙක වේ.**

**එමගින් ඔහු මුස්ලිම්වරයකු බවට පත්වනු ඇත.**

පසුව ඔහු ඉස්ලාමය පිළිපැදීමට අරඹයි.

මම 'ඉස්ලාම් හවුස්' වෙබ් අඩවියට පිවිසීමට ඔබට නිදෙර්ශ කරමි, ඒ සෑම එකක්ම ඔවුනොවුන්ගේ භාෂාව අනුව, ලියවී ඇත. එවිට නව මුස්ලිම්වරයා, ඉස්ලාමය පිළිපැදිය යුතු ආකාරය ඉගෙන ගනී.

වෙබ් අඩවියේ සබැඳිය: https://islamhouse.com/si/

## Бегство от атеизма к исламу


1- අදේවවාදය යන්නෙහි තේරුම කුමක් ද? ............................................................ 9

2- අදේවවාදයට ඔබ චෝදනා කරන කරුණු මොනවාද? ........................................ 9

3- මැවුම්කරුගේ පැවැත්ම පෙන්වා දෙන සාධක මොනවාද? ................................ 10

4- පැවැත්ම පෙන්වා දෙන සාධකය යන්නෙහි අර්ථය කුමක් ද? ............................ 10

5. ඒකවරණය සහ පරිපූර්ණත්වය පෙන්වා දෙන සාධකය යන්නෙහි තේරුම කුමක් ද? 12

6- මිනිසුන් සහ අනෙකුත් ජීවීන් ඉතා සරල මූල ජීවීන්ගෙන් (ප්රෝටෝ ජීවීන්ගෙන්) පැමිණිය හැකි නොවේ ද? ........................................................................ 14

7- දේවාරක්ෂාව සහ පරිපූර්ණත්වය පෙන්වා දෙන සාධක සඳහා උදාහරණ මොනවාද? 16

8- සමහර අදේවවාදීන් දෙවාරක්ෂාව පරිපූර්ණත්වයේ සාධක විවේචනය කරති; රෝග හා භූමිකම්පා වැනි පරමාදශර්ී නොවන කරුණු මෙහි ඇතිවන්නේ ඇයි දැයි විමසති........... 22

9- විශ්වය නිමර්ාණය කළ භෞතික හේතුවක් පැවැත්ම වළක්වන්නේ කුමක් ද? උදාහරණ වශයෙන්: තවත් ශිෂ්ටාචාරයක් හෝ වෙනත් දෙයක්? විශේෂයෙන්ම සදාකාලික දෙවියන් වහන්සේ කුමකට ද? .......................................................................... 23

10- විශ්වය පාලනය කරන නීති අපි දන්නා අතර, භූමිකම්පා ඇතිවීමට හේතුව අපි හොඳින් දනිමු; එසේනම් අපි නීතිය දන්නා තාක් කල් අපට මැවුම්කරුවෙක් අවශ්ය වන්නේ ඇයි? .......................................................................................... 24

11- විශ්වයේ මූලාරම්භයට සන්නිපතිතය (Coincidence) හේතු විය නොහැක්කේ කෙසේද?.......................................................................................... 26

12- විශ්වය සදාකාලික බව තරයේ පවසන අදේවවාදියෙකුට අප ප්රතිචාර දක්වන්නේ කෙසේද?.......................................................................................... 26

13- හේතුඵල නීතිය මැවුම්කරුට අදාළ නොවන්නේ ඇයි? වෙනත් වචන වලින් කියනවා නම්: මැවුම්කරු නිමර්ාණය කළේ කවුද? ........................................................ 27

14- විශ්වය අති විශාලයි; අපගේ මේ කුඩා ප්රමාණය සහිත අපි, මෙම යෝධ විශ්වයේ කේන්ද්රයක් වන්නේ කෙසේද?.................................................................. 28

15- ඇතැම් අදේවවාදීහු මෙසේ පවසති: ග්රහලෝක විශාල ප්රමාණයක් දැක ගත හැක. ඒ නිසා සම්භාවිතා න්යාය අනුව, ජීවයට සුදුසු ග්රහලෝකයක් තිබීම ස්වභාවිකයි... මේ අනුමානය නිවැරදිද?.......................................................................... 30

16- නිත්ය එක් මැවුම්කරුවෙකුට වඩා සිටිය නොහැක්කේ ඇයි?............................ 34

17- දහම කුමකටද?.......................................................................... 35

18- මොළයක හෝ සමාජයක මෙම සදාචාරය නිෂ්පාදනයක් වීම වළක්වන්නේ කුමක් ද? .......................................................................................... 38

19- පෘථිවියේ ශිෂ්ටාචාරවල එක් දෙවියෙකුට වඩා ඇත; එසේනම්, දෙවිඳුන් අල්ලාහ්ව විශේෂයෙන් විශ්වාස කරන්නේ ඇයි?........................................40

20- කෙනෙක් අනවශ්‍ය දෙයක් කරනවා නම්, එය විකාරයක්! දෙවියන් වහන්සේට අපව අවශ්‍ය නැත, එසේනම් ඔහු අපව මැව්වේ ඇයි? ........................................42

21- අපි අල්ලාහ් හඳුනා ගන්නේ කෙසේද?........................................45

22- ආගම් බොහෝමයක් තිබේ. එසේ නම් ඉස්ලාම් කුමක් සඳහාද?........................................49

23- ඉස්ලාම් යනු කුමක් ද? ........................................49

24- පිළිතුරු දීමේදී මනස ව්‍යාකූල කරන ප්‍රශ්නවලට ඉස්ලාමයේ පිළිතුරු තිබේද? එනම්: අප පැමිණියේ කොහෙන්ද? ඇයි අපි මේ ලෝකේ ඉන්නේ? සහ අවසන් ගමන කොතැනට ද?........................................51

25- මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් දෙවිඳුන් අල්ලාහ්ගේ සංදේශකරුවෙකු බව ඔබ දැනගත්තේ කෙසේද?........................................53

26- සැබැවින්ම, මම දෙවියන් වහන්සේව විශ්වාස කළ යුතු බව මා දැන ගන්නේ කෙසේද? ........................................63

27- වක්තෘවරුන් ප්‍රතික්ෂේප කරමින් අල්ලාහ්ව පමණක් විශ්වාස කිරීම ප්‍රමාණවත් ද? ........................................65

28- දේවත්වය ප්‍රතික්ෂේප කළ අයෙක් ඔහු සිදු කළ දැහැමි ක්‍රියාවන් සඳහා අල්ලාහ්ගෙන් ප්‍රතිඵල හිමි කර ගන්නේ ද? ........................................66

29- ඉස්ලාමය සත්‍යයේ ආගම නම්, දුමර්තය ඇත්තේ මන්ද? ........................................68

30- දෙවිඳුන් අල්ලාහ් නපුර නිමර්ාණය කළේ ඇයි? නැතහොත් වෙනත් වචන වලින් කිවහොත්: "නපුරේ උභතෝකෝටිකයට" (dilemma) මුස්ලිම්වරයෙකු ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?........................................70

31- පසු ගිය කාලයේ, ලොවේ ආගම පදනම මත බහුලව හටගත් යුද්ධවලට ආගම හේතුවුනේ ද?........................................74

32- බටහිර ඉතා දියුණු මට්ටමින් තිබියදී, මුස්ලිම්වරුන් ඔවුන්ගේ ඒක දේවවාදී ආගම තිබියදීත් ඔවුන් පසුගාමී වූයේ ඇයි? ........................................76

33 - තේජාන්විත සුවිශුද්ධයාණන් වන අල්ලාහ්ට නැමදුම් කිරීමේ ප්‍රතිඵල මොනවාද?81

34:- උත්තරීතර අල්ලාහ්ට යටහත් වීම පෙන්නුම් කරන සාධක මොනවා ද? වෙනත් වචනයෙන් විමසන්නේ නම්, ඔබ අල්ලාහ්ට සම්පූණර් ලෙස යටහත් වූ තැනැත්තෙකු යැයි ඔබ දැනගන්නේ කෙසේද?........................................82

අවසාන වශයෙන් මම ඉස්ලාමයට ඇතුල් වන්නේ කෙසේද? ........................................87

# ඉස්ලාමය හා අදේවවාද

## මුහුණට මුහුණ

### ප්‍රශ්ණ හා පිළිතුරු

# الإسلام والإلحاد

## وجهًا لوجه

### سؤال وجواب

تألِيفُ

د/ هيثم طلعت

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة
مسجلة بوزارة الموارد البشرية والتنمية الاجتماعية برقم ٢١٢١
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH